ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
Human Rights Commission of Sri Lanka

වාර්ෂික වාර්තාව 2020

මෙය ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ
2020 වසරේ ක්‍රියාකාරකම් පිළිබඳ වාර්ෂික වාර්තාවයි. එය 1996 අංක 21 දරන
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 30 වැනි වගන්තියට අනුකූලව
ඉදිරිපත් කර ඇත.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
ප්‍රධාන කාර්යාලය
අංක 14, ආර් ඒ ද මෙල් මාවත, කොළඹ 04
දූ.ක: (94) 0112505580, 2505581, 2505582
ෆැක්ස්: (94) 0112505541
විද්‍යුත් තැපෑල : sechrcsl@gmail.com
වෙබ් අඩවිය: www.hrcsl.lk

කොමිෂන් සභා සාමාජිකයින්

2020

2020.01.01 සිට 2020.12.10 දක්වා

සභාපති

මහාචාර්ය නෙළුම් දීපිකා උඩගම

(2020.01.01 සිට 2020.08.31 දක්වා)

කොමසාරිස්වරු

එච්. ගසාලි හුසේන් මහතා

(2020.01.01 සිට 2020.12.10 දක්වා)

අම්බිකා සත්කුණානාදන් මහත්මිය

(2020.01.01 සිට 2020.03.07 දක්වා)

රමණී මුත්තෙට්ටුවේගම මහත්මිය

(2020.01.01 සිට 2020.12.10 දක්වා)

දීපිකා සුබසිංහ මහත්මිය

(2020.01.01 සිට 2020.12.10)

(2020.12.10 සිට ඉදිරියට)

සභාපති

ආචාර්ය ජගත් බාලසූරිය

කොමසාරිස්වරු

වෛද්‍ය එම්. එච්. නිමල් කරුණාසිරි මහතා

ආචාර්ය විජිත නානායක්කාර

අනුසුයා ෂන්මුගනාදන් මහත්මිය

එච්. කේ. නවරත්න වේරදූව

සභාපතිගේ පණිවුඩය

2020 වසර මහ මැතිවරණයක් පැවැත්වීම සඳහා නියමිත වසරක් ලෙස හඳුනාගෙන තිබූ අතර, ජනතාවට තමන් සතු පරමාධිපත්‍ය යොදා ගනිමින් ඉදිරි වසර 05 සඳහා නියෝජිතයින් පාර්ලිමේන්තුව වෙත තෝරාපත් කර ගැනීම මෙම මැතිවරණය සිදුකිරීමෙන් අපේක්ෂා කරන ලදී. මෙවන් පසුබිමක වසර ආරම්භ වූ අතර, වෙනත් වසර වලට වඩා වෙනස් වූ සෞඛ්‍ය අභියෝගයන්ට ලෝකයට මුහුණදීමට සිදුවන බවට ඉඟි වසර ආරම්භයේදීම දක්නට ලැබුණු අතර, ශ්‍රී ලංකාවට ද ඉන් මිදී සිටීමේ හැකියාවක් නොපැවතුනි. 2020 ජනවාරි මස 11 වන දින ලෝක සෞඛ්‍ය සංවිධානය කොරෝනා වෛරසය වසංගතයක් ලෙස හඳුන්වාදීමෙන් අනතුරුව ශ්‍රී ලංකාව ද ඊට මුහුණදීමේ කටයුතු ආරම්භ කරන ලදී. 2020 ජනවාරි මස 27 දින වන විට පළමු කොරෝනා වෛරස් රෝගියා ශ්‍රී ලංකාවෙන් හඳුනාගනු ලැබූ අතර, ඇය අවුරුදු 44 ක් වයසැති චීන ජාතික කාන්තාවකි. මාර්තු මස 11 වන දින වන විට පළමු ශ්‍රී ලාංකික කොරෝනා රෝගියා හඳුනාගනු ලැබූ අතර ඉන් අනතුරුව කොරෝනා රෝගී තත්ත්වය සම්බන්ධයෙන් ලොව සෙසු රටවල් අනුගමනය කරන ලද ක්‍රමවේදයන්ට සමාන වන ලෙස ක්‍රියාමාර්ගයන් ශ්‍රී ලංකාවද අනුගමනය කිරීමට ආරම්භ කරන ලදී. රෝගීන් වාර්තා වූ තෝරාගත් ප්‍රදේශ හුදකලා කිරීමක් ආරම්භ කරන ලද අතර, ඔවුන්ට අවශ්‍ය පහසුකම් සෞඛ්‍ය බලධාරීන් හා පොලීසිය සහ සෙසු ආරක්ෂක අංශ මඟින් සපයන ලදී. ජනවාරි මස 28 වන දින සිට දෛනික තත්ත්ව වාර්තාවලට අනුව සෞඛ්‍ය අමාත්‍යාංශයේ වසංගත රෝග අංශය මඟින් දත්ත පළකිරීමක් සිදුකරන අතර, දිවයිනේ රෝහල් 12ක් කෝවිඩ් රෝගය යැයි සැකකරන පුද්ගලයින් වෙනුවෙන් ප්‍රතිකාර මධ්‍යස්ථාන ලෙස ස්ථාපිත කරන ලදී. මාර්තු මස 16 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ජාතික නිවාඩු දිනයන් ප්‍රකාශ කළ අතර, ඒ ඔස්සේ කොරෝනා වෛරසය පැතිරීම වැළැක්වීම අරමුණු කරගන්නා ලදී. එම කාලය තුළ නිවසේ සිට සිය රාජකාරී සිදුකිරීම සඳහා කාර්ය මණ්ඩලය උනන්දු කිරීමේ ක්‍රමවේදයක් ආරම්භ කරන ලෙස ආයතන ප්‍රධානීන් දැනුවත් කරන ලදී.

කොරෝනා වසංගත තත්ත්වය යටතේ රට තුළ එතෙක් පැවති මානව හිමිකම් ගැටලු වෙනත් මුහුණුවරකින් මතුවීමක් නිරීක්ෂණය විය. මෙම කාලය තුළ මතුවූ ගැටලුකාරී කරුණක් ලෙස කොරෝනා ආසාදිතව මරණයට පත්වන පුද්ගලයින්ගේ අවසාන කටයුතු සිදුකරන ආකාරය ගැන ආන්දෝලනාත්මක තත්ත්වයක් රට තුළ නිර්මාණය විය. ඒ වන විට ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය බලධාරීන්ගේ මතය වූයේ කොරෝනා ආසාදිතව මරණයට පත්වන සෑම ශ්‍රී ලාංකිකයෙකුගේම මළ සිරුරු ආදාහනාගාරයක ආදාහනය කළ යුතු බවය. කිසිදු ලෙසකින් භූමදානය කිරීමක් සිදු නොකළ යුතුබව අවධාරණය කරන ලදී. භූමදානය ඔස්සේ භූගත ජලය සමඟ කොරෝනා වෛරසය මිශ්‍ර වී පැතිරීමේ අවදානමක් පවතින බව ඒ අවස්ථාවේදී ප්‍රකාශ කරන ලදී. මෙම කරුණ පිළිබඳව ශ්‍රී ලාංකික මුස්ලිම් ප්‍රජාව ආගමික හා සංස්කෘතික කරුණු පදනම්ව සිය විරෝධය ප්‍රකාශ කළ අතර, කොරෝනා ආසාදිතව මියයන තම සමීපතයින් භූමදානය කිරීමට අවස්ථාව ලබාදෙන ලෙස ඔවුන් සෞඛ්‍ය බලධාරීන්ගෙන් දිගින් දිගටම ඉල්ලා සිටින ලදී. මේ අවස්ථාවේ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව මෙම සංවේදී කරුණ පිළිබඳව ක්‍රියාත්මකවීමේදී සංස්කෘතිකමය සංවේදීතාවය පිළිබඳ සැළකිලිමත් වෙමින් මුස්ලිම් ප්‍රජා

නායකයින් සමඟ එකතුව මේ සම්බන්ධයෙන් තීරණයක් ගත යුතු බව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පෙන්වා දෙන ලදී. සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා සහ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත 2020.04.20 දිනැති අංක. 2170/8 දරණ අති විශේෂ ගැසට් නිවේදනය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ ඉදිරිපත් කරන ලදී. මේ ඔස්සේ කොරෝනා වෛරසය අසාදිතව මිය යන පුද්ගලයින්ගේ මළ සිරුරු සම්බන්ධයෙන් අවසන් කටයුතු සිදුකරන ආකාරය පිළිබඳව අවධානය යොමු කරනු ලැබිය.

මාර්තු මස 21 වන දින අනුරාධපුර බන්ධනාගාරය තුළ නොසන්සුන් තත්ත්වයක් වර්ධනය වූ අතර ඊට කොරෝනා වෛරස් තත්ත්වය බන්ධනාගාරය තුළ පැතිරයාමේ දැඩි අවදානමක් පවතින්නේය යන්න හේතුවී ඇත. මේ නොසන්සුන්තාවය පාලනය කිරීමේදී රැඳවියන් දෙදෙනෙක් මිය ගොස් තවත් රැඳවියන් හය දෙනෙක් තුවාල ලබා ඇති අතර, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ක්ෂණික මැදිහත්වීමක් සිදුකරන ලදී. මෙහිදී බන්ධනාගාර රැඳවියන්හට කොරෝනා වෛරස් තත්ත්වය යටතේ ආරක්ෂාකාරී වීමටත්, බන්ධනාගාර තුළ හුදකලා කිරීමේ පහසුකම් ගැන සෞඛ්‍ය පහසුකම් සම්බන්ධයෙන් කඩිනම්ව ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය කොමිෂන් සභාව විසින් බන්ධනාගාර කොමසාරිස්වරයා වෙත නිර්දේශ කරන ලදී. තවද කොරෝනා රෝගී තත්ත්වය නිසා ඇතිවී තිබූ සෞඛ්‍ය ගැටලු සැළකිල්ලට ගනිමින් බන්ධනාගාර රැඳවියන්ගේ ආරක්ෂාව සැපයීම සඳහා කඩිනම් පියවර ගන්නා ලෙස ජනාධිපතිතුමා වෙතින් ඉල්ලීමක් ද සිදුකර ඇත. මෙම වසරේ බන්ධනාගාර තුළ සිදුවූ දෙවෙනි ගැටුම්කාරී සිද්ධිය 2020.11.29 වන දින මහර බන්ධනාගාරය ආශ්‍රිතව සිදුවිය. මෙම ගැටුම්කාරී තත්ත්වය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ක්ෂණික මැදිහත්වීමක් සිදුකරන ලදී. එහිදී ඉතාමත් අඩු කාලසීමාවක් තුළ එම ගැටුම සිදුවූ ස්ථානය වෙත මානව හිමිකම් කොමිෂන් සභාව තම නිලධාරී කණ්ඩායමක් යොමුකිරීමක් සිදුකළ අතර, ගැටුම්කාරී තත්ත්වය පාලනය කිරීම සඳහා දායකත්වය ද ලබාදෙන ලදී. මෙම සිදුවීම අදාළ කර ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව නිර්දේශ නිකුත් කළ අතර, එම නිර්දේශ ක්ෂණිකව මැදිහත් විය යුතු නිර්දේශ, කෙටි කාලීන, මධ්‍යකාලීන සහ දිගුකාලීන ලෙස අදියර 04 ක් ලෙසින් ඉදිරිපත් කර ඇත.

කොවිඩ් - 19 තත්ත්වය තුළ හදිසි ප්‍රවෘත්ති ප්‍රකාශයන් දෘශ්‍ය මාධ්‍ය ඔස්සේ ප්‍රචාරය වීමේදී සංඥා භාවිතයේ වැදගත්කම පිළිබඳව රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ලිඛිතව දැනුවත් කරන ලදී. හදිසි ප්‍රවෘත්ති ඔස්සේ ජනතාව වෙත සන්නිවේදන පණිවුඩ නිසි ලෙස සියලුදෙනාට වෙනසකින් තොරව ගලායාමේ අවශ්‍යතාවය මෙහිදී මානව හිමිකම් කොමිෂන් සභාව අවධාරණය කරන ලදී.

රටේ කටයුතු සාමාන්‍ය පරිදි සිදු නොවන තත්වයක් තුළ ගල්කිස්ස සහ අහුලාන ප්‍රදේශ පදනම්ව ගැඹුරු මුහුදේ ප්‍රදේශවලින් වැලි නළ මඟින් ගොඩබිම වෙත ගෙනවිත් එම ප්‍රදේශ ප්‍රතිපෝෂණය කිරීමේ ක්‍රියාවලියක් මැයි මාසය තුළදී වාර්තා වූ අතර, ඒ අනුව එම ප්‍රදේශ වලට මානව හිමිකම් කොමිෂන් සභාවේ නිලධාරීන් කණ්ඩායමක් නිරීක්ෂණ කටයුතු සඳහා යොමු විය. ඒ ඔස්සේ පවතින තත්ත්වය පිළිබඳ කරුණු කොමිෂන් සභාවට වාර්තා කිරීමෙන් අනතුරුව අදාළ පාර්ශවයන් වෙතින් කරුණු විමසීමක් සිදුකරන ලදී.

2020 වසරේ පැවති පාර්ලිමේන්තු මහ මැතිවරණය ඉලක්කර ගත් කිසිවෙකු අත් නොහැරෙන මැතිවරණයක් පැවැත්වීම සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව අදාළ ආයතනයන් වෙත මාර්ගෝපදේශයන් සහ නියාමනයන් නිකුත් කිරීම සිදුකරන ලදී. එහිදී මැතිවරණ කොමිෂන් සභාව විසින් මැතිවරණය සඳහා ඉදිරිපත් වන දේශපාලන පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම් ඉලක්ක කර ඉදිරිපත් කරන ලද ආචාරධර්ම පද්ධතියක් පිළිබඳ විශේෂ අවධානයක් යොමු කරන ලදී. එහිදී මානව හිමිකම් කොමිෂන් සභාව 2020 පාර්ලිමේන්තු මැතිවරණය සඳහා තරඟ කරන දේශපාලන පක්ෂ/ස්වාධීන කණ්ඩායම් වල අපේක්ෂකයින් වෙතින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ආයාචනය කරන ලද්දේ ශ්‍රී ලංකා සමාජයේ පවතින සමාජමය වෙනස්කම් පදනම් කර යම් පාර්ශවයක් ඉලක්ක කර වෛරයක් නැතහොත් නොඉවසන සුළු බවක් ඇතිවන ආකාරයේ හැසිරීමෙන් සහ එවැනි හැඟීම් ඇතිවන ආකාරයෙන් අදහස් හා කරුණු දැක්වීම් වලින් වළකින ලෙසය. තවද ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව මැතිවරණ කොමිෂන් සභාව විසින් ප්‍රකාශයට පත්කරන ලද මාධ්‍ය උපමාන කෙරෙහි අවධානය යොමු කරමින් ලංකාවේ සියලුම මාධ්‍ය ආයතන වෙත ආයාචනයක් සිදු කරන ලදී. එහි මූලිකවම ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ඉස්මතු කර දක්වන්නේ ශ්‍රී ලංකාව තුළ පවතින වෙනස්කම් පදනම් කරගෙන ශ්‍රී ලාංකික ජනතාව තුළ වෛරී සහ නොඉවසන සුළුබව ඇති වන හෝ ඇතිවන ආකාරයේ විකාශනය කිරීම්, ප්‍රචාරය කිරීම් හෝ පළකිරීම් වලින් වැළකිය යුතු බවයි. තවද සමාජය තුළ හෝ දේශපාලන ක්‍රියාකාරීන් තුළ වෛරී සහගත දේශපාලනය ප්‍රවර්ධනය වන ආකාරයේ විකාශනය කිරීම්, ප්‍රචාරය කිරීම් හා පළකිරීම් වලින් වැළකෙන ලෙසයි. මෙම මැතිවරණය ඉලක්ක කර සියලුම රාජ්‍ය නිලධාරීන්ට හා පොලිස් නිලධාරීන්ට මාර්ගෝපදේශ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලදී. එම මාර්ගෝපදේශවල මූලික හරය වන්නේ තම සියලු රාජකාරී නීති ප්‍රකාරයෙන් ඉටුකළ යුතු බවත්, නීති ප්‍රකාරව කටයුතු නොකිරීම එක් පාර්ශවයකට වාසි සහගත වන අයුරින් බලය අයුතු ලෙස භාවිතා කිරීම ජනතාවගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනයක් බවයි. නීති ප්‍රකාරයෙන් කටයුතු නොකිරීම මඟින් සිදුවන හිමිකම් උල්ලංඝනයන් පිළිබඳ රජයේ වගකීමට අමතරව එම නිලධාරීන් පුද්ගලිකවම වගකීම දැරිය යුතු බවයි. මීට අමතරව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව මෙවර මහ මැතිවරණයේ දී ද සියලු පුරවැසියන්ට ඔවුන් රැකියා කරන ස්ථානය නොසලකා ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා ප්‍රමාණවත් නිවාඩු වැටුප් අහිමිකිරීමකින් තොරව ලබාදිය යුතුය යන්න සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයතු අමාත්‍යාංශය, කම්කරු අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය දැනුවත් කරන ලදී. මීට අමතරව 2020දී පාර්ලිමේන්තු මැතිවරණය ඉලක්ක කර විශේෂ පැමිණිලි භාරගැනීමේ ඒකකයක් ස්ථාපිත කරන ලදී. ඒ ඔස්සේ 2020 අගෝස්තු මස 05 වන දින පවත්වනු ලබන මහා මැතිවරණය නිදහස්, සාධාරණ, බලපෑමෙන් තොර සහ කිසිවෙකු අත්නොහැරෙන මැතිවරණයක් ලෙස ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමුකරමින් මානව හිමිකම් කොමිෂන් සභාව අධීක්ෂණ කටයුතු සිදුකරන ලදී.

මෙම වසර තුළදී පොලිස් අත්අඩංගුවේ සිටි සැකකරුවන් මියයෑම සම්බන්ධයෙන් පොලිස්පතිවරයා වෙතින් 2020.10.21 දිනැතිව විමසීමක් කරන ලදී. මේ පිළිබඳව පොලිස්පතිවරයාගේ අවධානය එම ලිපිය මඟින් යොමුකරවන අතර මෙවැනි සිදුවීම් ඉදිරියේදී ඇතිවීම වැළැක්වීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස කොමිෂන් සභාව නිර්දේශ කරන ලදී.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව 2018 පෙබරවාරි මස සිට 2020 මාර්තු මස දක්වා කාලසීමාව තුළ බන්ධනාගාර පිළිබඳ අධ්‍යයනයක් සිදුකරන ලදී. එම අධ්‍යයනයේ දී විශේෂ අවධානය යොමු කරන ලද්දේ වර්තමාන ශ්‍රී ලංකාවේ බන්ධනාගාර පද්ධතිය කොතෙක් දුරට ශ්‍රී ලංකාව පිළිගෙන ඇති මානව හිමිකම් ප්‍රඥප්තීන්ට අනුකූලව ක්‍රියාත්මක වන්නේ ද යන්න පිළිබඳවයි. මේ සම්බන්ධයෙන් ඉතා විස්තරාත්මක වාර්තාවක් සකස් කළ අතර එම වාර්තාව තුළ වර්තමාන බන්ධනාගාර පද්ධතිය ශ්‍රී ලංකාවේ පවතින ආකාරය ඒ තුළ පවතින මානව හිමිකම් ගැටලු සහ ඒවා නිවැරැදි කර ගැනීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ මෙම වාර්තාව තුළ අන්තර්ගත වී ඇත. එම වාර්තාව සියලුම වගකිව යුතු පාර්ශවයන් වෙත යොමුකර ඇති අතර, මේවන විට සැමට වාර්තාවට ප්‍රවේශ විය හැකි ආකාරයට මානව හිමිකම් කොමිෂන් සභා අන්තර්ජාල පිටුවේ පළකර ඇත.

සංචරණ සීමා පැවති මෙම වසරේ මානව හිමිකම් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම යම් ආකාරයකට සීමා විය. එම තත්ත්වය තුළ වුවද අන්තර්ජාතික කාන්තා දින සැමරුම් පැවැත්වීමට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව කටයුතු කරන ලදී. මෙම වසරේ කාන්තා දින සැමරුම "තාක්ෂණය මත පදනම් ව කාන්තාවන්ට සිදුවන හිංසනයට එරෙහි වෙමු" (Countering technology- based violence against women) යන තේමාව ඔස්සේ පවත්වන ලදී. මෙය රාජ්‍ය නොවන ආයතන නියෝජනය කරමින් කාන්තා ක්‍රියාධාරිණියන් සහ රාජ්‍ය ආයතන නියෝජනය කරමින් රාජ්‍ය නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී.

සමස්තයක් ලෙස ගෙවුණු 2020 වසර ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට අභියෝගාත්මක කාල වකවානුවක් විය. කොවිඩ් - 19 වසංගත තත්ත්වය තුළ භෞතිකව අප කාර්යාලයන් විවෘත නොකෙරුනු කාලයන් තුළ දුරස්ථව කටයුතු කිරීම පැවති සම්පත් භාවිතා කොට සිදුකරන ලදී. වසංගත තත්ත්වය හමුවේ දුරස්ථව වැඩ කිරීම සහ නව අභියෝගයන්ට මුහුණදීම මෙම කාලයේ සිදුවූ අතර, එය ඉදිරි මැදිහත්වීම් සඳහා පෙරහුරුවක් වූ බව කිව යුතුය. තවද මෙහිදී පසුගිය වසරේ ශ්‍රී ලංකාව තුළ මානව හිමිකම් සුරක්ෂිත කිරීමටත්, ප්‍රවර්ධනය කිරීමටත් පුළුල් අර්ථයෙන් මානව හිමිකම් සංස්කෘතියක් රට තුළ ගොඩනැගීමේ කාර්යයට සහාය වූ එක්සත් ජාතීන්ගේ නියෝජිත ආයතන, ආසියා ෆැසිපික් කලාපීය මානව හිමිකම් ආයතනවල සංසදය (Asia Pacific Forum of National Human Rights Institutions), ගෝලීය මානව හිමිකම් ආයතනවල සන්ධානය (Global Alliance of National Human Rights Institutions), ජනමාධ්‍ය, සිවිල් සංවිධාන සහ පුද්ගල මට්ටමින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව සමඟ සම්බන්ධ වූ සහ අප දිරිමත් කළ සියලුම පාර්ශවයන් වෙත අවසාන වශයෙන් කෘතඥ පූර්වක ස්තුතිය පළ කරමු.

ආචාර්ය ජගත් බාලසූරිය,

සභාපති,

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

2020 දෙසැම්බර් 31

පටුන

කොමිෂන් සභාවේ සාමාජිකයින් 3

සභාපතිතුමාගේ පණිවිඩය 4

පටුන 8

කෙටි යෙදුම් ලැයිස්තුව 9

ශ්‍රී ලංකාවේ මානව හිමිකම් තත්ත්වය- 2020 12

1 වන පරිච්ඡේදය: කොමිෂන් සභාව 14

1.1 කොමිෂමේ දළ විශ්ලේෂණය 14

1.1.1 දැක්ම 14

1.1.2 මෙහෙවර 14

1.1.3 මූලික අගයන් 14

1.1.4 උපායමාර්ගික අවධානය යොමු කරන ක්ෂේත්‍ර 14

1.1.5 කොමිෂන් සභා ලාංඡනය 16

1.2 කොමිසමට පැවරී ඇති කාර්යභාරයේ ස්වභාවය සහ විෂය පථය 16

1.3 ආයතනික ව්‍යුහය 18

2 වන පරිච්ඡේදය: සමාලෝචිත වර්ෂය 22

2.1 ප්‍රධාන සාධනයන් 23

2.1.1 විමර්ශන සහ විමසීම් 23

2.1.2 බාහිර වැඩසටහන් 24

2.1.3 ආයතනික සංවර්ධනය 25

2.2 රජය වෙත ලබා දෙන නිර්දේශ 26

2.3 ප්‍රතිසංස්කරණ සඳහා වූ වෙනත් උපදේශන 33

2.4 එක්සත් ජාතීන්ගේ සාම සාධක හමුදාව සඳහා සේවයේ යෙදවීමට නියමිත ශ්‍රී ලංකා හමුදා පිරිස් නිෂ්කාශනය 34

2.5 අභියෝග 35

3 වන පරිච්ඡේදය: විමර්ශන සහ විමසීම්

3.1 දළ විශ්ලේෂණය 37

3.1.1. සේවා ක්‍රම ශක්තිමත් කිරීම 37

3.1.2 ලැබුණු පැමිණිලි පිළිබඳ සංඛ්‍යාලේඛන 38
3.1.3 2020 දී අවසන් කළ නඩු පිළිබඳ සංඛ්‍යාලේඛන 45
3.1.4 නිර්දේශ 46
3.2 හිමිකම් කාණ්ඩය අනුව එක් එක් පැමිණිලි නියැදි 47
3.2.1 අත්අඩංගුවේ සිටියදී සිදුවන හිරිහැර කිරීම් 47
(ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වැනි වගන්තිය)
3.2.2 සමානාත්මතාවය සහ වෙනස්කොට නොසැලකීම 48
(ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 වැනි වගන්තිය)
3.2.3 බහුවිධ අයිතිවාසිකම් උල්ලංඝනයවීම් 51
3.3 කොමිසමේ ස්වයං මැදිහත්වීම 54
3.4 සභාපතිවරයාගේ මැදිහත්වීම් 57

4 වන පරිච්ඡේදය: පර්යේෂණ සහ අධීක්ෂණය

4.1 තේමාත්මක අනු කමිටු 60
4.2 බන්ධනාගාර පිළිබඳ ජාතික අධ්‍යයනය 61
4.3 නිර්දේශ ක්‍රියාත්මක නොකිරීම අධීක්ෂණය කිරීම 62
4.4 වෙනත් අධීක්ෂණ කටයුතු 63
4.4.1. රැඳවුම් ස්ථාන සහ රැකවරණ නිවාස නිරීක්ෂණය කිරීම 63
4.4.2. පාර්ලිමේන්තු මැතිවරණය - 2020 68
4.4.3. වෙනත් අධීක්ෂණ කටයුතු 69

5 වන පරිච්ඡේදය: අධ්‍යාපනය සහ බාහිර කටයුතු

5.1 මහජනතාව දැනුවත් කිරීම 72
5.1.1. ජාත්‍යන්තර දින සැමරීම 72
5.1.2 විවිධ විශේෂිත කණ්ඩායම් සඳහා මානව හිමිකම් පිළිබඳ දැනුවත් කිරීම් සහ පුහුණු වැඩසටහන් 74
5.2 අනෙකුත් රාජ්‍ය ආයතන/වැඩසටහන් සමඟ දැනුම බෙදාගැනීම 75
5.3 මාධ්‍ය සමඟ කටයුතු කිරීම 77
5.3.1. සම්ප්‍රදායික මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය සමඟ කටයුතු කිරීම 77
5.3.2. මාර්ගගත ක්‍රමවේද භාවිතය 77
5.4 සිවිල් සමාජය සමඟ කටයුතු කිරීම 78

5.4.1. ප්‍රාදේශීය සිවිල් සමාජ සම්බන්ධීකරණ කමිටු 78
5.4.2. මානව හිමිකම් සඳහා වූ ප්‍රජා කාර්ය සාධක බලකාය (CTF4HR) 78
5.4.3. තේමාත්මක අනු කමිටු සාමාජිකයන් ලෙස සිවිල් සමාජ නියෝජිතයන් 78
5.4.4. සිවිල් සමාජ සංවිධාන විසින් සංවිධානය කරන ලද වැඩසටහන් සඳහා සහභාගී වීම 79
5.4.5. සිවිල් සමාජය සමඟ සාකච්ඡා 79
5.4.6. සිවිල් සමාජය සඳහා පුහුණුව 82
5.5 උපදේශකත්වය 82

6 වන පරිච්ඡේදය: ජාත්‍යන්තර සහයෝගීතාවය

6.1 ජාත්‍යන්තර බැඳීම්වලට අනුකූලතාවය ප්‍රවර්ධනය කිරීම 85
6.2 කලාපීය මානව හිමිකම් සන්ධාන සමඟ සබඳතා ශක්තිමත් කිරීම 85
6.3 OPCAT යටතේ ජාතික වැළැක්වීමේ යාන්ත්‍රණය ලෙස ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පත් කිරීම 86
6.4 ජාත්‍යන්තර සංවිධාන සහ ප්‍රවීණයන් සමඟ වෙනත් සහයෝගිතා 86
6.4.1. ද්විපාර්ශ්වික රැස්වීම් 86
6.4.2. ලැබුණු විදේශ අරමුදල් 87

7 වන පරිච්ඡේදය: මානව සම්පත්, පරිපාලනය සහ මූල්‍ය

7.1 කාර්ය මණ්ඩල සංවර්ධන වැඩසටහන් 90
7.1.1. දේශීය පුහුණු අවස්ථා 90
7.1.2. ජාත්‍යන්තර වැඩසටහන් 91
7.2 රැකියා සහ පුරප්පාඩු 91
7.3 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන 92

උපග්‍රන්ථ
උපග්‍රන්ථය 1: ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිසමේ ක්‍රියාකාරිත්වය: සිතියම
උපග්‍රන්ථය 2: නිර්දේශ මාලාව
උපග්‍රන්ථය 3: ස්වකීය අභිමතය මත සිදු කළ විමසීම් ලැයිස්තුව

5.4.2. මානව හිමිකම් සඳහා වූ ප්‍රජා කාර්ය සාධක බලකාය (CTF4HR) 5

5.4.3. තේමාත්මක අනු කමිටු සාමාජිකයන් ලෙස සිවිල් සමාජ නියෝජිතයන් 6

5.4.4. සිවිල් සමාජ සංවිධාන විසින් සංවිධානය කරන ලද වැඩසටහන් සඳහා සහභාගී වීම 6

5.4.5. සිවිල් සමාජය සමඟ සාකච්ඡා 5

5.4.6. සිවිල් සමාජය සඳහා පුහුණුව 8

5.5 උපදේශකත්වය 8

6 වන පරිච්ඡේදය: ජාත්‍යන්තර සහයෝගීතාවය

6.1 ජාත්‍යන්තර බැඳීම්වලට අනුකූලතාවය ප්‍රවර්ධනය කිරීම 7

6.2 කලාපීය මානව හිමිකම් සන්ධාන සමඟ සබඳතා ශක්තිමත් කිරීම 6

6.3 OPCAT යටතේ ජාතික වැළැක්වීමේ යාන්ත්‍රණය ලෙස ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පත් කිරීම 4

6.4 ජාත්‍යන්තර සංවිධාන සහ ප්‍රවීණයන් සමඟ වෙනත් සහයෝගිතා 6

6.4.1. ද්විපාර්ශ්වික රැස්වීම් 4

6.4.2. ලැබුණු විදේශ අරමුදල් 8

7 වන පරිච්ඡේදය: මානව සම්පත්, පරිපාලනය සහ මූල්‍ය

7.1 කාර්ය මණ්ඩල සංවර්ධන වැඩසටහන් 6

7.1.1. දේශීය පුහුණු අවස්ථා 4

7.1.2. ජාත්‍යන්තර වැඩසටහන් 6

7.2 රැකියා සහ පුරප්පාඩු 7

7.3 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන 5

උපග්‍රන්ථ

උපග්‍රන්ථය 1: ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිසමේ ක්‍රියාකාරිත්වය: සිතියම

උපග්‍රන්ථය 2: නිර්දේශ මාලාව

උපග්‍රන්ථය 3: ස්වකීය අභිමතය මත සිදු කළ විමසීම් ලැයිස්තුව

කෙටි පද මාලාව

A & F	පරිපාලන සහ මූල්‍ය
APF	ආසියා ශාන්තිකර සංසදය
CCD	කොළඹ අපරාධ කොට්ඨාශය
CID	අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව
CORE Justice	සංගත, විවෘත, ප්‍රතිචාරාත්මක සහ ඵලදායී සාධාරණත්ව වැඩසටහන
CTF4HR	මානව හිමිකම් සඳහා වූ ප්‍රජා කාර්යසාධන බලකා
DIG	නියෝජ්‍ය පොලිස්පති
DMS	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව
DoP	බන්ධනාගාර දෙපාර්තමේන්තුව
ED&SP	අධ්‍යාපන හා විශේෂ වැඩසටහන්
EU	යුරෝපීය සංගමය
HQI	මූලස්ථාන පරීක්ෂක
HRCSL	ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
I & I	විමර්ශන හා පරීක්ෂණ
ICCPR	සිවිල් හා දේශපාලන හිමිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය
IGP	පොලිස්පති
IR	ජාත්‍යන්තර සබඳතා
JMO	අධිකරණ වෛද්‍ය නිලධාරී
LGBTIQ	සමරිසි කාන්තා, සමරිසි පිරිමි, ද්විලිංගික, සංක්‍රාන්ති සමාජභාව, අන්තර් ලිංගික හා විවාද සම්පන්න
MFA	ආසියා සංක්‍රමණික සමුළුව
NGOs	රාජ්‍ය නොවන සංවිධාන
NPM	ජාතික වැළැක්වීමේ ක්‍රමවේදය
OHCHR	මානව හිමිකම් සඳහා වූ එක්සත් ජාතීන්ගේ මහකොමසාරිස් කාර්යාලය
OMP	අතුරුදහන්වූ පුද්ගලයන් පිළිබඳ කාර්යාලය
OPCAT	වධහිංසා වලට එරෙහි ජාත්‍යන්තර සම්මුතියේ වෛකල්පිත සංධාන කෙටුම්පත
R&M	පර්යේෂණ හා අධීක්ෂණ
SoR	බඳවා ගැනීමේ පරිපාටිය
TID	ත්‍රස්ත විමර්ශන කොට්ඨාශය
UN	එක්සත් ජාතීන්ගේ සංවිධානය
UNDP	එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන
UNHCR	සරණාගතයන් සඳහා වූ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස්
WFH	නිවසේ සිට වැඩකිරීමේ යෝජනාක්‍රම

ශ්‍රී ලංකාවේ මානව හිමිකම් තත්ත්වය - 2020 වසර

කෝවිඩ්-19 වසංගතය එහි පෙර නොවූ විරූ අභියෝග සමඟ 2020 දී ශ්‍රී ලංකාවේ මානව හිමිකම් තත්ත්වය සඳහා පසුබිම සකසයි. වසර තුළ මානව හිමිකම් ඇතැම් ක්ෂේත්‍රවල දියුණුවක් පෙන්නුම් කළ අතර, අනෙකුත් ක්ෂේත්‍ර සඳහා පුරවැසියන්ට රජයේ ක්‍රියා සම්බන්ධයෙන් සෝදිසියෙන් සිටීමට ප්‍රජාතන්ත්‍රවාදී අවකාශයන් සීමා කිරීම වැළැක්වීම සඳහා ඒකාබද්ධ ප්‍රයත්නයන් අවශ්‍ය විය.

වසර ආරම්භයේදී, පශ්චාත් ගැටුම් සංක්‍රාන්ති යුක්තිය, වගවීම සහ ප්‍රතිසන්ධානය පිළිබඳ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ 30/1, 34/1, සහ 40/1 යෝජනා සඳහා සම අනුග්‍රහය දැක්වීම ශ්‍රී ලංකාව විසින් නතර කරන ලදී. ඉන් අනතුරුව, වසංගතය හේතුවෙන් දෙවරක් කල් දැමුණු මැතිවරණය අප්‍රේල් මාසයේදී පැවැත්වීමේ අරමුණින් ජනාධිපතිවරයා විසින් 2020 මාර්තු මාසයේදී පාර්ලිමේන්තුව විසුරුවා හරින ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන්, මැයි-අගෝස්තු කාලය තුළ බොහෝ කෝවිඩ්-19 ප්‍රතිචාර පාර්ලිමේන්තු විමර්ශනයෙන් සහ අධීක්ෂණයෙන් මග හැරි ඒ වෙනුවට ජනාධිපති කාර්ය සාධක බලකා හරහා ක්‍රියාත්මක විය.

එමෙන්ම, කෝවිඩ්-19 වසංගතය ආරම්භයේ දී, කෝවිඩ් - 19 මරණ භූමදානය කිරීමට අවසර දී තිබූ ලෝක සෞඛ්‍ය සංවිධානයේ මාර්ගෝපදේශ නොතකා, සියලුම කෝවිඩ්-19 මරණ සම්බන්ධයෙන් ආදාහන කටයුතු අනිවාර්ය කිරීමේ රජයේ ප්‍රතිපත්තියට එරෙහිව මුස්ලිම්, ක්‍රිස්තියානි සහ බෞද්ධ ඇතුළු විවිධ ආගම්වල පුද්ගලයින්ගෙන් කොමිසමට පැමිණිලි සහ කනස්සල්ල පළ කිරීම් ඉදිරිපත් විය. අවමංගල්‍ය උත්සව වලදී සිදුකරනු ලබන ආගමික වතාවත් ඇතැම් ආගම් සඳහා පාරිශුද්ධ වන අතර එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය සහ ජාත්‍යන්තර මානව හිමිකම් බැඳීම්වලට අනුව හැර සීමා කළ නොහැකි ආගම් හෝ විශ්වාසයන් ප්‍රකාශ කිරීමේ ආකාරයකි. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව මෙම ගැටලුව සම්බන්ධයෙන් රජයට නිර්දේශ ඉදිරිපත් කළ අතර එමඟින් අදාල ප්‍රතිපත්තිය ඉල්ලා අස්කර ගන්නා ලෙස රජයට බල කළේය.

ඉන්පසුව, 2020 ඔක්තෝම්බර් මාසයේදී, පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බලයක් තිබූ අලුතින් තේරී පත් වූ රජය 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් හඳුන්වා දුන් වැදගත් සංවරණ සහ තුලන කිහිපයක් ඉවත් කර අධිකරණ සහ ස්වාධීන කොමිෂන් සභා වලට පත්කිරීම් සම්බන්ධයෙන් විධායක බලය දීර්ඝ කරන ලද 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කරන ලදී.

2019 ජනාධිපතිවරණයේදී සිදු වූවාක් මෙන්, 2020 අගෝස්තු මාසයේ පැවති පාර්ලිමේන්තු මැතිවරණයේදීද ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය පිළිබඳව කොමිෂන් සභාව පුළුල් ලෙස අවධානය යොමු කළේය. 2019 ට සමානව, ආබාධිත හෝ විශේෂ අවශ්‍යතා සහිත සහ භූගෝලීය වශයෙන් හුදකලා වූ පුද්ගලයින්ගේ ඡන්ද අයිතිය සහතික කිරීම සඳහා විශේෂ දීමනා ලබා දීමට රජයට නිර්දේශ කිරීම ඇතුළුව සියලුම ලියාපදිංචි ඡන්දදායකයින්ට ඡන්දය ප්‍රකාශ කිරීමට හැකි බව සහතික කිරීමට ශ්‍රී ලංකා මානව හිමිකම් මැදිහත්වීම් සිදු කරන ලදී. ඡන්ද මධ්‍යස්ථානවලදී

ඡන්දදායකයින්ගට සිදුවිය හැකි අනිසි බලපෑම් වළක්වා ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙසත්, මැතිවරණයෙන් පසු ගම් සහ ආයතන මට්ටමින් පරාජිත පක්ෂවල ආධාරකරුවන්ට හිරිහැර සහ ප්‍රචණ්ඩත්වය වැළැක්වීමට පියවර ගන්නා ලෙසත් කොමිසම මැතිවරණ කොමිෂන් සභාවට උපදෙස් දුන්නේය. ඡන්දය ප්‍රකාශ කරන මහජනතාවට සහායවීම සඳහා නිවැරදි සමබර සහ අපක්ෂපාති තොරතුරු සැපයීමට මාධ්‍ය ආයතන බැඳී සිටින බැවින් මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද මාධ්‍ය මාර්ගෝපදේශ වලට අනිවාර්යයෙන්ම අනුකූල වන ලෙස කොමිසම මාධ්‍ය වෙත ආයාචනා කළේය. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව දේශපාලන පක්ෂ/ස්වාධීන කණ්ඩායම් සහ මැතිවරණයට තරඟ කරන අපේක්ෂකයින්ට වෛරී ප්‍රකාශ වලින් වැළකී සිටින ලෙස ප්‍රසිද්ධ ආයාචනයක්ද කළේය.

ඇතැම් විට කෝවිඩ්-19 පාලනය කිරීමේ ප්‍රයත්නවල ප්‍රතිඵලයක් ලෙස, කොමිෂන් සභාවට ලැබුණු මුළු පැමිණිලි සංඛ්‍යාව 2019 දී 8983 සිට 2020 දී 6417 දක්වා පහත වැටුණි. කෙසේ වුවද, පසුගිය වසරවල මෙන් නොව, ප්‍රධාන කාර්යාලයට සහ ප්‍රාදේශීය කාර්යාල දෙකටම දළ වශයෙන් එකම පැමිණිලි සංඛ්‍යාවක් ලැබී ඇත. කෝවිඩ්-19 පූර්ණ අගුලු දැමීමේ කාල පරිච්ඡේදය තුළ ඉලෙක්ට්‍රොනික ලෙස පැමිණිලි ඉදිරිපත් කිරීම සඳහා ලබා දී ඇති විකල්පය මෙයට හේතුව ලෙස දැක්විය හැකිය. සාමාන්‍ය පරිදි, වර්ෂය තුළ ලැබුණු පැමිණිලි අතරින්, බහුතරයක් පැමිණිලි ලැබී තිබුණේ පුද්ගලික නිදහස උල්ලංඝනය කිරීම සම්බන්ධයෙනි. කොමිෂන් සභාවට ලැබුණු පැමිණිලි සංඛ්‍යාවේ සමස්ත අඩුවීමක් තිබියදීත්, මෙම පැමිණිලි කාණ්ඩය පෙර වාර්තා කිරීමේ කාල සීමාවට වඩා ඉහළ සංඛ්‍යාවක් තිබීම ආකර්ෂණීය මෙන්ම ඇතැම් විට සැලකිල්ලට ගත යුතු කරුණකි. තවද, රජයේ අකාර්යක්ෂමතාවට එරෙහිව ලැබී ඇති පැමිණිලි 853 න් 502 ක්ම ලැබී තිබුනේ පොලිසියට එරෙහිවය. කෙසේ වුවද, තෙවන වැඩිම පැමිණිලි සංඛ්‍යාව වන රැකියා සම්බන්ධයෙන් ලැබී තිබූ පැමිණිලි 717, පෙර වාර්තා කළ වර්ෂයට වඩා සැලකිය යුතු ලෙස අඩු වී ඇත. 2015 වසරේ සිට එවැනිම පහත වැටීමක් පෙන්නුම් කරමින් පාසල්වලට ඇතුළත් කර ගැනීම් වැනි අධ්‍යාපනය සම්බන්ධ අයිතීන් උල්ලංඝනය කිරීම්වලට එරෙහි පැමිණිලි සාපේක්ෂව අඩු මට්ටමක පැවතුනි.

පුද්ගල නිදහස උල්ලංඝනය කිරීමේ පුළුල් කාණ්ඩය තුළ, අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීම් සහ රඳවා තබා ගැනීම් උල්ලංඝනය කිරීම් සම්බන්ධ පැමිණිලි 2019 දී 775 සිට 2020 දී 910 දක්වා ඉහළ ගොස් ඇත. අත්අඩංගුවේ දී වධහිංසා පැමිණවීම සහ අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීම සහ රඳවා තබා ගැනීම සම්බන්ධයෙන් දිගින් දිගටම ලැබුනු පැමිණිලි විශාල සංඛ්‍යාව පිළිබඳ කොමිසම සැලකිලිමත් වේ. ඒ හා සමානව, අත්අඩංගුවේ පසුවන විටදී සිදුවූ මරණ, අධිකරණයට පරිබාහිර ඝාතන පිළිබඳ පැමිණිලි සහ සිරකරුවන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම පිළිබඳ පැමිණිලි වඩාත් සමීපව පරීක්ෂා කිරීම අවශ්‍ය වේ. මෙම ක්ෂේත්‍ර සම්බන්ධයෙන් කොමිෂන් සභාව අදාළ බලධාරීන් සමඟ මැදිහත්වීම් කිහිපයක් සිදු කළේය. වධහිංසා පැමිණවීම සහ නීතිවිරෝධී අත්අඩංගුවට ගැනීම් සහ රඳවා තබා ගැනීම් තහනම් කිරීමට අදාළ නීතිය සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කරන සහ රඳවා තබා ගැනීමේ බලධාරීන් දැනුවත් කිරීමේ වැදගත්කම ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව යළි යළිත් අවධාරණය කරයි.

1 වන පරිච්ඡේදය: කොමිසම

1.1. කොමිෂන් සභාවේ දළ විශ්ලේෂණය

1.1.1.දැක්ම

1.1.2.මෙහෙවර

1.1.3.හරයාත්මක වටිනාකම්

1.1.4.මූලෝපායික ඉලක්කගත ක්ෂේත්‍ර

1.1.5.කොමිෂන් සභා ලාංඡනය

1.2. විධි නියෝගයේ ස්වභාවය හා විෂයපථය

1.3. සංවිධාන ව්‍යූහය

1.1 කොමිෂන් සභාවේ දළ විශ්ලේෂණය

1.1.1. දැක්ම

විවිධත්වය හඳුනාගෙන සැමගේ මානව හිමිකම්වලට ගරු කරන සමාජයක්.

1.1.2. මෙහෙවර

“ජනතා පරමාධිපත්‍යය මත පදනම් වූ ප්‍රජාතන්ත්‍රවාදයක් තුළ මානව හිමිකම්, මානව ගරුත්වය සහ නීතියේ ආධිපත්‍යය ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකාව තුළ නායකත්වය සැපයීම”.

මූලික අගයන්

1.1.3. හරයාත්මක වටිනාකම්

- මානව ගරුත්වයට ගරුකිරීම
- බහුවිධත්වයට ගරු කිරීම
- සමානත්වය සහ නොවෙනස්ව සැළකීම
- සාමය, සත්‍යය හා සාධාරණත්වය
- ස්වාධීනත්වය
- වගවීම
- සේවාව
- නිහතමානීත්වය
- අවංකභාවය
- විනිවිදභාවය

1.1.4. උපායමාර්ගික කේන්ද්‍රීය විෂයපථ

කොමිෂන් සභාවේ උපායමාර්ගික මෙහෙයුම් කේන්ද්‍රීය ක්ෂේත්‍ර වන්නේ:

- සියලුම ජනතාවට විශේෂයෙන් දිළිඳු හා ආන්තිකව දිවිගෙවන ජන කොටස් වලට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හා එහි සේවාවන්ට ප්‍රවේශවීමේ හැකියාව වර්ධනය කිරීම
- ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව තුළ හා එය ඔස්සේ මෙන්ම එහි වැඩසටහන් හා සේවාවන් මගින් ස්ත්‍රීපුරුෂ සමාජභාවය මූල ප්‍රවාහකරණය

- ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව තුළ සහ එහි වැඩසටහන් හා සේවා මගින් විවිධත්වය පිළිගැනීම හා ගරු කිරීමට පෙළඹවීම

කොමිෂන් සභාවේ හරයාත්මක උපායමාර්ගික මෙහෙයුම් කේන්ද්‍රීය ක්ෂේත්‍ර වන්නේ

- වධහිංසා කිරීම්/අත්අඩංගුවේ සිටියදී සිදුවන උල්ලංඝනයන්
- සංක්‍රමණික ශ්‍රමික අයිතිවාසිකම්
- අධ්‍යාපනය, සෞඛ්‍යය හා ඉඩම් හිමිකම් ඇතුළුව ආර්ථික, සමාජ හා සංස්කෘතික අයිතිවාසිකම්
- ස්ත්‍රීපුරුෂ සමාජභාවයට අදාළ ගැටලු
- සුළුතර අයිතිවාසිකම්
- උඩරට ද්‍රවිඩ ජනතාව හා වතු සේවකයන්
- ආපදා කළමනාකරණය හා ආරක්ෂාවීම සහ ප්‍රතිසාධනය
- ආබාධිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම්
- සමරිසි කාන්තාවන්, සමරිසි පුද්ගලයන්, ද්විලිංගික, සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන්, අන්තර් ලිංගික සහ අසාමාන්‍යතා සහිත ජන කොටස් වල අයිතිවාසිකම්
- වැඩිහිටියන්ගේ අයිතිවාසිකම්
- බන්ධනාගාරගතවූවන් හා රැඳවියන්

1.1.5. කොමිෂන් සභාවේ ලාංඡනය

ජාතික මට්ටමින් මානව අයිතිවාසිකම් සුරැකීම සහ ප්‍රවර්ධනය උදෙසා ජාතික මානව හිමිකම් ආයතනවල වගකීම ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා ලාංඡනයෙන් පිළිඹිබු වෙයි. නිල් වර්ණය මිනිසාගේ සජීවී බව සහ නිර්මාණශීලිත්වය පිළිබිඹු කරයි. ආරක්ෂා කිරීම සහ ආරක්ෂාව සැපයීම සඳහා පියවර ගැනීම අත් දෙකෙන් පිළිබිඹුවේ. ලෝක ගෝලය මානව හිමිකම්වල විශ්වීයත්වය සහ ජාත්‍යන්තර මට්ටමින් ලබා දී ඇති ආරක්ෂාව පිළිබිඹු කරයි. ශ්‍රී ලංකා සිතියම තුළින් මානව හිමිකම් ජාතික මට්ටමින් ආරක්ෂා කිරීමට පියවර ගැනීමේ අවශ්‍යතාවය පෙන්නුම් කෙරේ. ස්ත්‍රියක, පිරිමියකු සහ දරුවාගේ රූපවලින් සංකේතවත් වන්නේ මානව හිමිකම් ආරක්ෂාව සැමට සමානව ලබාදිය යුතු බවයි.

1.2 කාර්යභාරයේ ස්වභාවය හා විෂයපථය

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව යනු රට තුළ මානව හිමිකම් ප්‍රවර්ධනය සහ ආරක්ෂා කිරීම සඳහා පිහිටුවා ඇති ස්වාධීන කොමිෂන් සභාවකි. ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර මානව හිමිකම් බැඳීම් පිළිබඳව ද කොමිසම අවධානයෙන් සිටින අතර, මෙම බැඳීම්වලට රට අවනත වන බව සහතික කිරීමට වෑයම් කරයි.

1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත මගින් 1996 දී කොමිෂන් සභාව පිහිටුවන ලදී. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නෛතික පදනම හා මෙහෙයුම් මූලධර්ම පනත තුළ පැහැදිලිව සඳහන් කර ඇත. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 20 වැනි සංශෝධනය යටතේ උපලේඛනගත කොමිෂන් සභාවකි. කොමිෂන් සභාවේ සභාපතිවරයා සහ සාමාජිකයින් පත් කරනු ලබන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් වන අතර කොමිසම පාර්ලිමේන්තුවට වග කිව යුතු වේ.

පනත යටතේ කොමසාරිස්වරුන් වසර තුනක කාලයක් නිලතල දරන අතර නැවත පත්වීම් සඳහා සුදුසුකම් ලබයි. පනතේ 4 වැනි වගන්තිය යටතේ, ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අභියාචනාධිකරණයේ විනිසුරුවරුන් ඉවත් කිරීමට සමාන ක්‍රියා පටිපාටියක් අනුගමනය කිරීමෙන් පසුව පමණක් කොමසාරිස්වරුන් ඉවත් කිරීම සිදු කළ හැකිය.

මූලික අයිතිවාසිකම් සහ මානව හිමිකම් සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ අධිකරණ බලය පනත පිළිගනී. මූලික අයිතිවාසිකම් යනු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III පරිච්ඡේදයේ සහතික කර ඇති සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් මෙන්ම ආර්ථික, සමාජීය සහ සංස්කෘතික අයිතිවාසිකම් වේ. පනත තුළ මානව හිමිකම් අර්ථ දක්වා ඇත්තේ "සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය සහ ආර්ථික, සමාජීය සහ සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය මගින් ප්‍රකාශිත සහ පිළිගත් අයිතිවාසිකම්" වන අතර ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර නීතිමය බැඳීම්වලට අනුකූලව ජාතික ප්‍රමිතීන් සහතික කිරීම සඳහා කොමිෂන් සභාවට බලය හිමිවේ.

කොමිෂන් සභාවේ ව්‍යවස්ථාපිත කාර්යයන් (පනතේ 10 වැනි වගන්තියේ දක්වා ඇති පරිදි):

- මූලික අයිතිවාසිකම් සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව කටයුතු කරනු ලබන බවට සහතික කිරීම සහ මූලික අයිතිවාසිකම්වලට ගරු කිරීම සහ පිළිපැදීම ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් ක්‍රියා පටිපාටි සම්බන්ධ පැමිණිලි විමර්ශනය කිරීම සහ පරීක්ෂණ පැවැත්වීම;
- මූලික අයිතිවාසිකම් උල්ලංඝණයවීම් හෝ උල්ලංඝණය වීමට අත්‍යාසන්න පැමිණිලි සම්බන්ධව විමර්ශනය කිරීම් හා පරීක්ෂණ පැවැත්වීම, සහ සමථකරණයෙන් සහ මැදිහත්වීමෙන් විසඳා ගැනීමට විධිවිධාන සැළසීම;
- මූලික අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම සඳහා නීති සම්පාදනය සහ පරිපාලන නියෝග සහ ක්‍රියා පටිපාටි සැකසීමේදී රජයට උපදෙස් දීම සහ සහාය වීම;
- ජාතික නීති සහ පරිපාලන පරිවයන් ජාත්‍යන්තර මානව හිමිකම් සම්මුති හා ප්‍රමිතීන්ට අනුකූල බව සහතික කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් රජයට නිර්දේශ ඉදිරිපත් කිරීම;
- මානව හිමිකම් ක්ෂේත්‍රයේ ගිවිසුම් සහ අනෙකුත් ජාත්‍යන්තර සාධන පත්‍ර වලට දායක වීමේ හෝ ඒවාට එකඟ වීමේ අවශ්‍යතාවය පිළිබඳව රජයට නිර්දේශ ඉදිරිපත් කිරීම; සහ

- මානව හිමිකම් සම්බන්ධයෙන් දැනුවත් කිරීම සහ අධ්‍යාපනය ලබා දීම ප්‍රවර්ධනය කිරීම.

ව්‍යවස්ථාපිත කාර්යයන් ඉටු කිරීම සඳහා, (පනතේ 11 වැනි වගන්තියේ දක්වා ඇති පරිදි) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත බලය පවරා ඇති අවස්ථා;

- මූලික අයිතිවාසිකම් උල්ලංඝනයවීම් හෝ උල්ලංඝනය වීමට අත්‍යාසන්න තත්ත්වයන් පරීක්ෂා කිරීම;
- කොමිෂන් සභාව විසින් ඊට අයත් බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය යැයි හැගෙන අනු කමිටු සංඛ්‍යාවක් පළාත් මට්ටමින් පත් කිරීම
- මූලික අයිතිවාසිකම් උල්ලංඝනයවීම් හෝ උල්ලංඝනය වීමට අත්‍යාසන්න තත්ත්වයන් වලට අදාළව ඕනෑම අධිකරණයක විභාග වෙමින් ඇති නඩු කටයුතු වලට අදාළ අධිකරණයේ අවසර ඇතිව මැදිහත්වීම
- අධිකරණ නියෝගයකින් හෝ වෙනත් ආකාරයකින් රඳවා ගනු ලබන පුද්ගලයන්ගේ සුබසාධනය නිරීක්ෂණය කිරීම, ඔවුන් එසේ රඳවා ගනු ලබන ස්ථාන නිතිපතා පරීක්ෂාවට ලක් කිරීම සහ ඔවුන් රඳවා ඇති තත්වයන් වැඩිදියුණු කරලීමට අවශ්‍ය නිර්දේශ ලබා දීම
- ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නියෝග කරනු ලබන එවැනි පියවර ගැනීම හා ශ්‍රේෂ්ඨාධිකරණය විසින් කොමිෂන් සභාව වෙත යොමු කරන ඕනෑම කරුණකට අදාළව කටයුතු කිරීම;
- වැඩසටහන්, සම්මන්ත්‍රණ, වැඩමුලු පැවැත්වීම මගින් මානව හිමිකම් වලට අදාළ පර්යේෂණ වල නිරතවීම, හා දැනුවත්භාවය ඉහළ නැංවීම සහ එවැනි පර්යේෂණ වල ප්‍රතිඵල සමාජගත කිරීම හා බෙදාදීම;
- කොමිෂන් සභාවට පැමිණිලි කරන අගතියට පත් තැනැත්තෙකුට හෝ අගතියට පත් තැනැත්තෙකු වෙනුවෙන් ක්‍රියා කරන තැනැත්තෙකුට ඔහු විසින් සාධාරණව දරන ලද වියදම් පියවීමට අවශ්‍ය මුදල් ප්‍රමාණයක් කොමිෂන් සභාවේ පරම අභිමතය පරිදි ප්‍රදානය කිරීම;
- තම කර්තව්‍යයන් ඉටු කිරීමට අවශ්‍ය හෝ හිතකර වන වෙනත් එවැනි සියලු දෑ කිරීම.

1.3 ආයතනික ව්‍යුහය

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව සභාපති සහ කොමසාරිස්වරුන්ගෙන් සමන්විත වේ. කොමිෂන් සභාවේ ව්‍යවස්ථාපිත පැවරුම් බලය ක්‍රියාත්මක කිරීම සඳහා එය ප්‍රතිපත්තිමය තීරණ ගනී. සෑම මසකම මණ්ඩල රැස්වීම් පවත්වනු ලැබේ. 2015 වසරේ පත් කළ කොමිෂන් සභාවේ නිල කාලය 2020 දී අවසන් විය. එහි ප්‍රතිඵලයක් ලෙස 2020 දෙසැම්බර් 10 වැනි දින අතිගරු ජනාධිපතිතුමා විසින් කොමිෂන් සභාවට නව සභාපතිවරයෙකු සහ කොමසාරිස්වරුන් පත් කරන ලදී.

මේ වන විට කොමිෂන් සභාව කාර්ය මණ්ඩල සාමාජිකයින් 148 දෙනෙකුගෙන් සමන්විත වේ. එය අංශ 04 කින් සමන්විතය. පරීක්ෂණ සහ විමර්ශන, අධ්‍යාපන සහ විශේෂ වැඩසටහන්, පර්යේෂණ සහ අධීක්ෂණ, සහ පරිපාලන සහ මූල්‍ය අංශ ලෙසිනි. කොමිෂන් සභාවට අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට හැකි වූ වහාම ජාත්‍යන්තර සබඳතා පිළිබඳ අංශයක් ක්‍රියාත්මක


සභාපති සහ කොමසාරිස්වරුන්
ලේකම්
අතිරේක ලේකම්
අධ්‍යක්ෂ (වි සහ ප)
අධ්‍යක්ෂ (අ සහ විවැ)
අධ්‍යක්ෂ(ප-සහ අ)
අධ්‍යක්ෂ (ප සහ මු)
අධ්‍යක්ෂ - ජාත්‍යන්තර සබඳතා
අභ්‍යන්තර විගණන
නියෝජ්‍ය අධ්‍යක්ශ
නීති නිළධාරි
නියෝජ්‍ය අධ්‍යක්ෂ
නියෝජ්‍ය අධ්‍යක්ෂ
නීති නිලධාරීන්
විමර්ෂණ නිලධාරීන්
අධ්‍යාපන නිලධාරි
පර්යේෂණ නිලධාරි
අනෙකුත් මාණ්ඩලික නිලධාරීන්
ගණකාධිකාරී
ජාල පරිපාලක
පුස්තකාල සහ ප්‍රලේඛන නිලධාරී
පරිපාලන නිලධාරි
කළමනාකාර සහකරුවන්
කනිෂ්ඨ කාර්ය මණ්ඩලය
කළමනාකාර සහකරුවන්
කණිෂ්ඨ කාර්ය මණ්ඩලය
කළමනාකාර සහකරුවන්
රියදුරන්
කණිෂ්ඨ කාර්ය මණ්ඩලය


සභාපති සහ
කොමසාරිස්වරුන්
(කොමිසමේ මණ්ඩලය)
ලේකම්
අතිරේක ලේකම්
අධ්‍යක්ෂ (අ සහ විවැ)
අධ්‍යක්ෂ (ප සහ අ)
අධ්‍යක්ෂ (ප සහ මු)
අධ්‍යක්ෂ (ජාස)
ප්‍රාදේශීය
සම්බන්ධීකාරවරු
මානව හිමිකම්
නිළධාරීන්
කළමනාකාර
සහකරුවන්
කාර්යාල සහකරුවන්
රියදුරන්

2 වන පරිච්ඡේදය:
සමාලෝචිත වර්ෂය

2.1. ප්‍රධාන සාධනයන්

2.1.1. පරීක්ෂණ සහ විමර්ශන

2.1.2. බාහිර වැඩසටහන්

2.1.3. ආයතනික සංවර්ධනය

2.2. රජයට ලබාදුන් නිර්දේශ

2.3. ප්‍රතිසංස්කරණ සඳහා ලබා දුන් වෙනත් උපදේශන

2.4. එක්සත් ජාතීන්ගේ සාම හමුදා සඳහා ශ්‍රී ලාංකික හමුදා භටයින් තෝරා ගැනීම

2.5. අභියෝග

සමාලෝචිත වර්ෂය

2.1. ප්‍රධාන සාධනයන්

මෙම පරිච්ඡේදය තුළින් 2020 වසරේ කොමිෂන් සභාව අත්පත් කර ගත් ප්‍රධාන සාධනයන් කිහිපයක සාරාංශයක් දැක්වේ.

2.1.1. පරීක්ෂණ සහ විමර්ශන

කොමිෂන් සභාවට ආවේණික පැමිණිලි ක්‍රමවේදය හා ස්වයං සිද්ධි විමර්ශන (පැමිණිලි වර්ග පිළිබඳ වැඩි විස්තර සඳහා 3 පරිච්ඡේදය බලන්න) මගින් විශාල ජන සංඛ්‍යාවකට කොමිෂන් සභාව පෙර වසර වල මෙන්ම සහාය විය. අවස්ථා රැසකදී ගැටලු විසඳීම සඳහා සහය ලබා දීමට කොමිසමට හැකි වූ අතර. දුක්ගැනවිලි විසඳීම සඳහා වඩාත් සුදුසු ආයතනය කොමිෂන් සභාව නොවන බවට හැඟුණු අවස්ථාවන්හිදී, පැමිණිලිකරුවන් අදාළ සුදුසු වෙනත් ආයතන වෙත යොමු කිරීම සඳහා පියවර ගන්නා ලදී. මානව හිමිකම් උල්ලංඝනය කිරීම්වලට පිළියම් යෙදීමට බලධාරීන්ට උපදෙස් සපයන නිර්දේශ නිකුත් කිරීමට කොමිෂන් සභාවට එහි මව් පනතේ 15 වැනි වගන්තිය මඟින් බලය ලැබී තිබුණද, ගැටලුවක් සම්බන්ධයෙන් කොමිෂන් සභාව සියලු පාර්ශ්වයන් කැඳවා ඔවුන්ගේ ගැටලු සාකච්ඡා කර විසඳුම ක්ෂණිකව හා දැනුවත්ව හඳුනාගෙන ඒවා සමථකරණය හා සමඟි කිරීම මගින් නිරවුල්කරණය සඳහා යොමු කිරීමට උත්සාහ ගනියි.

2020 දී, කොමිෂන් සභාවට පැමිණිලි 6417 ක් ලැබී ඇති අතර එයින් පැමිණිලි 3657 ක් අවසන් කරන ලදී (පසුගිය වසරවල භාරගත් පැමිණිලි ද ඇතුළත් වේ). අවසන් කරන ලද පැමිණිලි 3657 න් පැමිණිලි 635 ක් නිරාකරණය කිරීමට කොමිෂන් සභාව සමත් විය. කොමිෂන් සභාව වෙත කරන ලද පුද්ගලික පැමිණිලිවලට ප්‍රතිචාර වශයෙන් කොමිසම නිර්දේශ 60 ක් නිකුත් කළේය. එය පෙර වසරවලට වඩා අඩුවීමක් වුවද, කෝවිඩ්-19 වසංගතය හේතුවෙන් අවශ්‍යයෙන්ම කළ යුතුව තිබූ කාර්යාල වසා දැමීම් සහ අධීක්ෂණ කටයුතු වැනි කාරණා සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ මැදිහත්වීම වැඩි වීම නිසා අදාළ නිලධාරීන්ගේ අවධානය අනිවාර්යයෙන්ම වෙනතකට යොමු වීම මගින් එය පැහැදිලි කළ හැකිය.

- මහර බන්ධනාගාරයේ සිදු වූ ප්‍රචණ්ඩ ක්‍රියා සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග

මහර බන්ධනාගාරයේ රැඳවියන් කිහිප දෙනෙකු මියයාමෙන් සහ අනෙකුත් සිරකරුවන්ට සහ බන්ධනාගාර නිලධාරීන්ට බරපතල තුවාල සිදුකිරීමෙන් අවසන් වූ බන්ධනාගාර නොසන්සුන්තාවයක් සම්බන්ධයෙන් ලැබුණු ප්‍රවෘත්ති වාර්තාවලට අනුව කොමිසම ස්වයංසිද්ධි පරීක්ෂණයක් ආරම්භ කළේය. කොවිඩ්-19 ආසාදිත සිරකරුවන් වෙනත් බන්ධනාගාරවල සිට

මහර බන්ධනාගාරයට මාරු කිරීමට යවන බවට පැතිර ගිය කටකතා හේතුවෙන් නොසන්සුන්තාවක් ඇති වූ බව වාර්තා විය. 2020 නොවැම්බර් 30 සහ දෙසැම්බර් 01 වැනි දින බන්ධනාගාරයේ සිදු වූ සිදුවීම්වල ස්වභාවය සොයා බැලීම සඳහා කරුණු සෙවීමේ සහ නිරීක්ෂණ මෙහෙයුම් දෙකක් සිදු කරන ලදී. අධීක්ෂණ කටයුතු සඳහා රැඳවුම් ස්ථාන වෙත බාධාවකින් තොරව ප්‍රවේශය ලබා දෙන කොමිෂන් සභාවේ ව්‍යවස්ථාපිත විධිවිධාන තිබියදීත්, එම අවස්ථා දෙකේදීම මානව හිමිකම් කොමිසමේ නිලධාරීන් එම ස්ථානයට ඇතුළු වී සිරකරුවන් සමඟ කතා කිරීමේ ප්‍රමාදයන් අත්විඳින ලදී. මෙම නිරීක්ෂණයන්හි සොයාගැනීම් මත කොමිෂන් සභාව වහාම ක්‍රියාත්මක කිරීම සඳහා අතුරු නිර්දේශ අදාළ බලධාරීන්ට නිකුත් කළේය.

තවද, මියගිය සිරකරුවන්, තුවාල ලැබූවන්, කෝවිඩ්-19 ආසාදිත සිරකරුවන් සහ නිරෝධායනයට යොමු කරන ලද සිරකරුවන්ගේ ලැයිස්තුවක් සම්පාදනය කර ලබා දෙන ලෙස මානව හිමිකම් කොමිෂන් සභාව බන්ධනාගාර කොමසාරිස් ජනරාල් වෙත දැනුම් දෙන ලදී. මියගිය සිරකරුවන් 11 දෙනාගේ පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තා සහ ඔවුන්ට ප්‍රතිකාර කරන ලද තුවාල ලැබූ සිරකරුවන්ගේ වාර්තා ද එවන ලෙස උතුරු කොළඹ රෝහලේ අධිකරණ වෛද්‍ය නිලධාරී වෙත නියෝග කරන ලදී. මෙම ලිපි හුවමාරුවේදී කොමිසම සඳහන් කළේ මළ සිරුරු දැනටමත් ආරම්භ කර ඇති විමර්ශනයක කොටසක් බැවින් කොවිඩ්-19 වෛරසය ආසාදනය වූවන්ගේ සිරුරු බැහැර කිරීමට අදාළ රෙගුලාසිවලට අනුව ආදාහනය අවශ්‍ය වුවද ඒවා සෞඛ්‍ය අවශ්‍යතාවලට අනුකූල වන පරිදි සංරක්ෂණය කළ යුතු අතර ආදාහනය කිරීම හෝ විනාශ කිරීම නොකළ යුතුය යන්නය. එමෙන්ම කොවිඩ්-19 ආසාදිත පුද්ගලයින්ගේ මරණ පරීක්ෂණ සිදුකිරීමට අවශ්‍ය විශේෂඥ දැනුම සහ පහසුකම් ඇති කොටිකාවත්ත බෝවන රෝග රෝහලේ මෘත ශරීරාගාරය වෙත මෘත දේහයන් රැගෙන යාමට මහේස්ත්‍රාත්වරයාගෙන් අවසර ලබා ගන්නා ලෙසද අධිකරණ වෛද්‍ය නිලධාරිවරයාගෙන් ඉල්ලා සිටියේය. මියගිය රැඳවියන් 11 දෙනාගේ දේහය කොටිකාවත්ත බෝවන රෝග රෝහල වෙත මාරුකර යැවීමට මහේස්ත්‍රාත්වරයා නියෝග කිරීමත්, පශ්චාත් මරණ පරීක්ෂණ බහුවිධ කමිටුවක් මගින් සිදුකිරීමට නියෝග කිරීමත් හේතුවෙන් මියගිය සිරකරුවන් 11 දෙනාගේ පශ්චාත් මරණ පරීක්ෂණ මෙතෙක් අවසන් වී නොමැති බව අධිකරණ වෛද්‍ය නිලධාරිවරයා කොමිසමට දැනුම් දුන්නේය. ඊට සමාන වාර්තාවක් මහේස්ත්‍රාත්වරයා විසින් ද ඉල්ලා ඇති බැවින් වාර්තාව සම්පාදනය කිරීමට අමතර කාලයක් අවශ්‍ය බැවින් කොමිසමට අවශ්‍ය වාර්තාව ඉදිරිපත් කිරීමට කල් ලබාදෙන ලෙස අධිකරණ වෛද්‍ය නිලධාරියා වැඩිදුරටත් ඉල්ලා සිටියේය. ඊට අමතරව, තුවාල ලැබූ සිරකරුවන්ට වෛද්‍යවරුන් කිහිප දෙනෙකු විසින් ප්‍රතිකාර කර තිබෙන අතර තවත් පිරිසක් වැලිකඩ බන්ධනාගාර රෝහලට මාරුකර යවා ඇති බවත්, එබැවින් රෝගීන්ට ප්‍රතිකාර කළ එක් එක් වෛද්‍යවරුන් සමඟ සාකච්ඡා කර රාගම ශික්ෂණ රෝහලේ ප්‍රතිකාර ලබන සිරකරුවන්ගේ වාර්තා පමණක් ඉදිරිපත් කළ හැකි බවත් ඔහු දන්වා සිටියේය. මෙම පරීක්ෂණය 2020 වසර අවසානයේදීත් සිදුවෙමින් පැවතුනි.

2.1.2 බාහිර වැඩසටහන්

කෝවිඩ්-19 වසංගතය මගින් අපේක්ෂිත සීමාවන් නොතකා, මානව හිමිකම් පිළිබඳ දැනුවත්භාවය ප්‍රවර්ධනය කිරීම සහ මානව හිමිකම් ගැටලු පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම සඳහා කොමිෂන් සභාව විසින් විවිධ ප්‍රචාරණ වැඩසටහන් සාර්ථකව පවත්වන ලදී. බාහිරව සිදු

කරන වැඩසටහන් වලට මුහුණට මුහුණලා සහ මාර්ගගත ක්‍රමයට, දේශන, වැඩමුළු, දැනුවත් කිරීමේ වැඩසටහන් සහ සාකච්ඡා ඇතුළත් විය.

- මාර්ගගත ක්‍රමයට 2020 වසරේ ජාත්‍යන්තර දින සැමරුම්.

2020 වසරේ වධහිංසාවට ලක්වූවන්ට සහය දැක්වීමේ ජාත්‍යන්තර දිනය කොමිෂන් සභාවට වැදගත් වූයේ එය ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ප්‍රථම වරට කෝවිඩ්-19 වසංගතය ආශ්‍රිත සෞඛ්‍ය මාර්ගෝපදේශ අනුගමනය කරමින් වෙබ් සම්මන්ත්‍රණයක් පැවැත්වීම සනිටුහන් කළ බැවිනි. “ශ්‍රී ලංකාවේ වධහිංසා සහ අනෙකුත් සමාජ ප්‍රචණ්ඩත්වය: එකම ක්‍රියාවලියක කොටස්ද?” යන තේමාව යටතේ 2020 ජුනි 26 වන දින සිංහල සහ දෙමළ භාෂාවලින් අන්තර්ක්‍රියාකාරී සම්මන්ත්‍රණ දෙකක් අන්තර්ජාලය ඔස්සේ පවත්වන ලදී. මෙම තේමාව තෝරාගනු ලැබුවේ බොහෝ විට විවිධ ආකාරයේ සමාජ ප්‍රචණ්ඩත්වයන් සඳහා පොදු මූලයන් ඇති බවත්, විවිධ වර්ග අතර ඇති සබඳතා සැලකිල්ලට ගනිමින් සමාජයේ පවතින ප්‍රචණ්ඩත්වයට ප්‍රතිචාර දැක්වීම සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව සෑම අයුරකින්ම ක්‍රියා කළ යුතු බවත් අවබෝධ කර ගැනීමෙනි.



කෝවිඩ්-19 වසංගතය අතරතුර අධ්‍යාපනයට සමාන ප්‍රවේශය පිළිබඳ ෆේස්බුක් පිටුවේ ප්‍රදර්ශනය කළ පණිවිඩය

කොමිෂන් සභාව පුරෝගාමී පියවරක් ලෙස, 2020 ජාත්‍යන්තර මානව හිමිකම් දිනය ඩිජිටල් දැනුවත් කිරීමේ ව්‍යාපාරයක් දියත් කිරීමත් සමඟ සනිටුහන් විය. කෝවිඩ්-19 වසංගතය කෙරෙහි තේමාත්මකව අවධානය යොමු කරන ලද මෙම ව්‍යාපාරය සැලසුම් කර ඇත්තේ පශ්චාත් වසංගත ප්‍රකෘතිමත් ප්‍රයත්නයන්හිදී මානව හිමිකම්වල කේන්ද්‍රීයත්වය කෙරෙහි අවධානය යොමු කිරීම සඳහා ය. #recoverbetter #standup4humanrights යන හැෂ් ටැග් භාවිතා කරමින් කොමිෂන් සභාව විසින් පිහිටුවන ලද නව ෆේස්බුක් පිටුව සහ ඉන්ස්ටග්‍රෑම් ගිණුම ඔස්සේ මෙම ප්‍රචාරණ දියත් කරන ලදී.

2.1.3 ආයතනික සංවර්ධනය

- නව වෙබ් අඩවිය දියත් කිරීම

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව සිය නව වෙබ් අඩවිය 2020 පෙබරවාරි 25 දින දියත් කරන ලදී. වැඩිදියුණු කළ පරිශීලක-හිතකාමී අතුරු මුහුණතක් සහිත නව සහ වැඩිදියුණු කළ වෙබ් අඩවිය, වැඩිදියුණු කළ තොරතුරු හුවමාරු කර ගැනීමට සහ කොමිෂන් සභාවේ මැදිහත්වීම්වල දෘශ්‍යතාව පෙන්නුම් කිරීම අදහස් කරයි. වෙබ් අඩවියේ ඉහළ ක්‍රියාකාරීත්වය නිසා අමුත්තන්ට කොමිෂන් සභාව සමඟ අපහසුවකින් තොරව අන්තර් ක්‍රියා කිරීමට සහ පැමිණිලිකරුවන්ට සාර්ථකව පැමිණිලි ඉදිරිපත් කිරීමට ඉඩ සලසයි.

- දැනට සිටින කාර්ය මණ්ඩලය අන්තර්ග්‍රහණය කර ගැනීම

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් 2018 මැයි මාසයේදී එහි සියලුම සේවක තනතුරු සඳහා බඳවා ගැනීමේ පටිපාටිය සඳහා අවසාන අනුමැතිය ලබා ගැනීම සහ 2019 දී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ දැනට සිටින කාර්ය මණ්ඩලය අන්තර්ග්‍රහණය කර ගැනීම සඳහා අවසරය ලබා ගන්නා ලදුව, කොමිෂන් සභාව 2020 දී බඳවා ගැනීමේ පරිපාටියට අනුව අනුමත කරන ලද සේවක තනතුරු සඳහා සමස්ත කාර්ය මණ්ඩලයම අන්තර්ග්‍රහණය කර ගන්නා ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන්, මානව සම්පත් සහ කොමිෂන් සභාවේ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සඳහා කොමිෂන් සභාව 2020 වසරේ පුරප්පාඩු සඳහා නව බඳවා ගැනීම් ආරම්භ කරන ලදී. (රැකියා සහ පුරප්පාඩු පිළිබඳ වැඩි විස්තර සඳහා 7.2 පරිච්ඡේදය බලන්න)

- නිර්දේශ ක්‍රියාත්මක නොකිරීම පිළිබඳ අධීක්ෂණය තවදුරටත් වැඩිදියුණු කිරීම

පසුගිය වසරවල පරීක්ෂණ සහ විමර්ශන අංශය ප්‍රතිසංවිධානය කිරීම තුළින් ලබා ගත් සාර්ථකත්වය අඛණ්ඩව ඉදිරියට ගෙන යමින් කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමේදී මුහුණ දෙන බාධා ඉවත් කිරීම සඳහා ආයතන සංග්‍රහය සංශෝධනය කිරීමට යෝජනා කරමින් කොමිෂන් සභාව රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යවරයා වෙත ලිපියක් යවන ලදී. කොමිෂන් සභාව විසින් නිර්දේශ කරනු ලබන ඕනෑම බලධාරියෙකු හෝ පුද්ගලයෙකු එම නිර්දේශය බලාත්මක කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව කොමිෂන් සභාවට වාර්තා කරන ලෙස ඉල්ලා සිටීම එහි ව්‍යවස්ථාපිත පනත යටතේ නියම කර ඇති බවත්, ඒ අනුව කොමිසමට වාර්තා කිරීම එවැනි සෑම පුද්ගලයෙකුගේම යුතුකමක් ද වන්නේය. කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට ඇතැම් රාජ්‍ය නිලධාරීන් අපොහොසත් වන බව කොමිසම නිරීක්ෂණය කළේය. මෙම තත්ත්වය සමනය කිරීමේ ක්‍රමවේදයක් ලෙස, සාධාරණ හේතුවක් නොමැතිව කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වන නිලධාරියාට එරෙහිව බරපතල විෂමාචාරයක් සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගැනීමට හැකි වන පරිදි ආයතන සංග්‍රහයට සංශෝධනයක් යෝජනා කළේය. (නිර්දේශ ක්‍රියාත්මක නොකිරීම පිළිබඳ වැඩි විස්තර සඳහා කරුණාකර 4.3 පරිච්ඡේදය බලන්න).

2.2 රජයට නිර්දේශ

2020 කාලය තුළ මානව හිමිකම් පිළිබඳ අවධානය යොමු කළ යුතු කරුණු පිළිබඳව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව රජයට නිර්දේශ ඉදිරිපත් කළ අතර, කොමිසම ඒ සඳහා ස්වකීය මැදිහත්වීම අවශ්‍ය යැයි සැලකීය.

- විශේෂ පුවත්, ප්‍රවෘත්ති විකාශන සහ රජයේ දැනුම්දීම් විකාශනය කිරීමේදී රූපවාහිනී නාලිකාවල සංඥා භාෂාව භාවිතය

විශේෂ ප්‍රවෘත්ති, ප්‍රවෘත්ති විකාශන සහ රජයේ නිවේදනවල සංඥා භාෂා පරිවර්තන එකවර විකාශය කරන ලෙස සියලුම රූපවාහිනී නාලිකාවලට දැනුම් දෙන ලෙස කොමිෂන් සභාව රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් නිල වශයෙන් ඉල්ලා සිටියේය. කෝවිඩ්-19 පැතිරීම මැඩපැවැත්වීම සඳහා රජය ගෙන ඇති පාලන ක්‍රියාමාර්ග සම්බන්ධ තොරතුරු පිළිබඳ පුවත් සමග සංඥා භාෂා පරිවර්තන තමන්ට නොලැබෙන බැවින් එම තොරතුරු ඔවුන්ට අහිමි වන බවට ශ්‍රී ලංකාවේ ශ්‍රවණාබාධිත ප්‍රජාවෙන් ලැබුණු පැමිණිල්ලකට අනුව මෙම ඉල්ලීම කරන ලදී. මේ සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් කරන ලද මැදිහත්වීම් පිළිබඳව දිගින් දිගටම දැනුම් දෙන ලෙස රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවෙන් වැඩිදුරටත් ඉල්ලා සිටියේය.

- වෛරී ප්‍රකාශවලට එරෙහිව නීතියට අනුව දැඩි ක්‍රියාමාර්ග ගැනීමේ අවශ්‍යතාවය

කෝවිඩ්-19 වසංගතය මැඩපැවැත්වීම සඳහා ශ්‍රී ලංකා පොලිසිය වෙහෙස නොබලා සිදු කළ සේවයට ස්තූතිය පුද කරන අතරම, කෝවිඩ්-19 වසංගතය තුළ වෛරී ප්‍රකාශන සිදුවීම්වලට එරෙහිව දැඩි පියවර ගන්නා ලෙස කොමිෂන් සභාව වැඩබලන පොලිස්පතිවරයාගෙන් ඉල්ලා සිටියේය. කෝවිඩ්-19 වසංගතයේ සන්දර්භය තුළ මුස්ලිම් ප්‍රජාවට එරෙහිව එල්ල කරන ලද වෛරී ප්‍රකාශ පිළිබඳ පැමිණිලි ගණනාවක් ලැබී ඇති බව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව සිය ලිපි හුවමාරුවේ සඳහන් කළේය. එවැනි වෛරී ප්‍රකාශ හේතුවෙන් ඇති විය හැකි නොසන්සුන්තාවක් වැළැක්වීම අත්‍යවශ්‍ය බැවින් 2007 අංක 56 දරන සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය පනතේ 3 වැනි වගන්තිය ප්‍රකාරව එවැනි ක්‍රියාවන්හි යෙදෙන්නන්ට ඔවුන්ගේ තරාතිරම නොබලා දැඩි නීතිමය ක්‍රියාමාර්ග ගන්නා ලෙස කොමිසම පොලිස්පතිවරයාගෙන් ඉල්ලා සිටියේය. පසුගිය වාර්තාකරණ වර්ෂයේදී කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද වෛරී ප්‍රකාශ නීතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳ මාර්ගෝපදේශ කෙරෙහි ද අවධානය යොමු කරන ලදී.

- **ප්‍රජාතන්ත්‍රවාදය තුළ ප්‍රකාශනයේ නිදහස සීමා කිරීම: නීත්‍යානුකූල සමබරතාවයක් පවත්වා ගැනීමේ අවශ්‍යතාවය**

2020 අප්‍රේල් 25 දිනැති ලිපිය මගින් කොමිෂන් සභාව පොලිස්පතිවරයා වෙත දැනුම් දුන්නේ සමාජ මාධ්‍ය හරහා කරන ලද ප්‍රකාශ මත, විශේෂයෙන් රට තුළ කෝවිඩ්-19 වෛරසය ව්‍යාප්ත වීමේ සන්දර්භය තුළ එහි ක්‍රියාකාරීත්වය පෙන්වා දීම පදනම් කරගෙන පොලිසිය විසින් පුද්ගලයින් අත්අඩංගුවට ගැනීම් රාශියක් නිරීක්ෂණය කරන බවයි. හදිසි අවස්ථාවකදී පවා ප්‍රජාතන්ත්‍රවාදී රටක ප්‍රකාශනයේ නිදහස සහ වෙනත් එවැනි අයිතීන් සීමා කිරීමට ගන්නා ඕනෑම ක්‍රියාමාර්ගයක් නීතියේ රාමුව තුළ එනම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර මානව හිමිකම් බැඳීම් තුළ විය යුතු බව වැඩබලන පොලිස්පතිවරයාට කොමිෂන් සභාව පෙන්වා දෙයි. නීත්‍යානුකූලභාවය, සමානුපාතිකත්වය සහ වෙනස් කොට නොසැලකීම යන පරීක්ෂා කිරීම් වලට අයිතිවාසිකම් පිළිබඳ සීමාවන් අනුකූල විය යුතු බව නීති වලින් අනිවාර්‍ය වන අතර මේ පිළිබඳව ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් සංවර්ධනය කරන ලද නීති විද්‍යාව මගින්

මගපෙන්වීම ලබාගත හැකිය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ ජාත්‍යන්තර මානව හිමිකම් බැඳීම් යන දෙකම හදිසි අවස්ථාවන්හිදී මානව හිමිකම් ආරක්ෂාවට හෝ නීතියේ ආධිපත්‍යයට හානියක් නොවන පරිදි සුවිශේෂී ක්‍රියාමාර්ග අනුගමනය කිරීමට අවසර දෙන බව එය වැඩිදුරටත් අවධාරණය කළේය. එබැවින්, මුළු රටම පෙර නොවූ විරූ මහජන සෞඛ්‍ය අර්බුදයකට මුහුණ දී සිටින විට, භීතිය ඇති කළ හැකි සහ මහජන සාමයට සහ මහජන සෞඛ්‍යයට බරපතල තර්ජනයක් විය හැකි වැරදි තොරතුරු නීත්‍යානුකූලව මැඩපැවැත්වීමේ අවශ්‍යතාවය මානව හිමිකම් කොමිෂන් සභාව හඳුනාගෙන ඇත. කෙසේ වෙතත්, එවැනි අත්අඩංගුවට ගැනීම් නීත්‍යානුකූලව වලංගු විය යුතු බවත්, අත්තනෝමතික හා අසමානුපාතික නොවිය යුතු බවත්, වෙනස් කොට සැලකීමකින් සිදු නොකළ යුතු බවත් කොමිසම අවධාරණය කළේය. එමනිසා, නියමිත ක්‍රියාවලි අවශ්‍යතාවයන්ට අනුකූල වන බව සහතික කිරීම සහ අනාගතයේදී සිදුවන ඕනෑම අත්අඩංගුවට ගැනීමක් දැඩි ලෙස නීතිය තුළ පවතින බව සහතික කිරීම සඳහා සාවද්‍ය තොරතුරු සම්බන්ධයෙන් මෑත කාලීන අත්අඩංගුවට ගැනීම් පිළිබඳ නීතිමය පදනම් සමාලෝචනය කරන ලෙස කොමිෂන් සභාව පොලිස්පතිවරයාට නිර්දේශ කළේය. නිලධාරීන් විවේචනය කරන්නන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගන්නා බවට පොලිස් මාධ්‍ය කොට්ඨාශය මාධ්‍ය ආයතන වෙත කළ අනතුරු ඇඟවීම සම්බන්ධයෙන් අදහස් දැක්වූ කොමිසම ප්‍රකාශ කළේ එම අනතුරු ඇඟවීම ජනතාවගේ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහසට දැඩි ලෙස බලපාන බැවින් එය දැඩි අවධානයට ලක්වන බවයි. එබැවින්, රාජ්‍ය නිලධාරීන් හෝ ප්‍රතිපත්ති විවේචනය කිරීම සම්බන්ධයෙන් අත්අඩංගුවට ගැනීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි බව කොමිසම පෙන්වා දෙයි. තවද, වෛරී ප්‍රකාශ මැඩලීමට අදාළව, සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ සම්මුති පනතේ 3 වන වගන්තිය වෙනස් කොට සැලකීමකින් තොරව සියලුම ප්‍රජාවන්ට ආරක්ෂාව සලසමින් ක්‍රියාත්මක කිරීම සහතික කිරීම අත්‍යවශ්‍ය බව ලිපිය පෙන්වා දෙයි.

- **පොලිස් අත්අඩංගුවේ සිටින පුද්ගලයන්ගේ මරණ වැඩි වීම**

පොලිස් අත්අඩංගුවේ සිටියදී සැකකරුවන්ගේ මරණ වැඩි වීමක් මානව හිමිකම් කොමිෂන් සභාවට නිරීක්ෂණය විය. කොමිෂන් සභාව සිය ස්වයං සිද්ධි බලතල ක්‍රියාත්මක කරමින් 2020.10.21 දිනැති ලිපියක් මගින් මෙම කාරණය සම්බන්ධයෙන් කොමිසමේ නිරීක්ෂණ පැහැදිලි කරමින් සවිස්තර වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස පොලිස්පතිවරයාට නියෝග කළේය. අත්අඩංගුවේ පසුවන රැඳවියන්ගේ යහපැවැත්ම සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීමට මානව හිමිකම් කොමිසමට ව්‍යවස්ථාපිතව බලය පැවරී ඇති බව ද කොමිසම අවධාරණය කළේය. මේ සම්බන්ධයෙන් ස්වයං සිද්ධි පරීක්ෂණ තවදුරටත් ක්‍රියාත්මකවේ.

- **රිමාන්ඩ් භාරයේ සිටින පුද්ගලයකුගේ ආරක්ෂාව තහවුරු කරන ලෙස ඉල්ලීම**

රක්ෂිත බන්ධනාගාරගත කර සිටින ෆාතිමා සාදියාගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ගත හැකි සෑම පියවරක්ම ගන්නා ලෙස බන්ධනාගාර බලධාරීන්ගෙන් ඉල්ලා සිටිමින් කොමිසම 2020.11.10 දින ලිපියක් මගින් බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයා වෙත ලිපියක් යොමු කළේය. මෙම ලිපිය ලියා ඇත්තේ පාස්කු ඉරිදා ප්‍රහාරය සම්බන්ධයෙන් විමර්ශනය කරන ජනාධිපති විමර්ශන කොමිසමේ සාක්කි දීමෙන් පසු සාදියා මහත්මියගේ ජීවිතයට තර්ජනයක්

එල්ල වී ඇති බවට කොමිසමට ලැබුණු පැමිණිලි කිහිපයක් අනුවය. ෆාතිමා සදියා සහරාන් හෂීම්ගේ බිරිඳයි. කොවිඩ්-19 වැළඳීමෙන් පසු ප්‍රතිකාර සඳහා බන්ධනාගාරයෙන් පිටත ප්‍රතිකාර මධ්‍යස්ථානයකට මාරු කිරීමෙන් පසු සාදියා මහත්මිය සිටින ස්ථානය සහ ඇය තාවකාලිකව භාරව සිටින බලධාරීන්ට දැනුම් දෙන ලෙස ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව බන්ධනාගාර දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා සිටියේය. මේ සම්බන්ධයෙන් ඔවුන්ගේ නිරීක්ෂණ සහ වැළැක්වීමේ පියවර ඇතුළුව ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳ විස්තර ඉදිරිපත් කරන ලෙස කොමිෂන් සභාව බන්ධනාගාර දෙපාර්තමේන්තුව වෙත වැඩිදුරටත් නියෝග කළේය.

- **කොවිඩ් 19 වසංගතයෙන් සිරකරුවන් ආරක්ෂාකිරීම සම්බන්ධයෙන් නිර්දේශ**

කෝවිඩ්-19 වසංගතය අතරතුර සිරකරුවන්ගේ සෞඛ්‍යය ආරක්ෂා කිරීම යන විෂය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් බන්ධනාගාර දෙපාර්තමේන්තුව වෙත නිර්දේශ ඉදිරිපත් කරන ලදී. වසංගතයක් තුළ විශේෂයෙන් සැලකිලිමත් විය යුතු කරුණු සඳහා නිර්දේශ සුවිශේෂී ලෙස එහි සඳහන් විය. කොමිසම ප්‍රකාශ කළේ එහි ව්‍යවස්ථාපිත බලය අනුව, සාමාන්‍ය ජනතාවට වඩා රෝගවලට ගොදුරු වීමේ වැඩි අවදානමක් ඇති බැවින් නිදහස අහිමි වූවන්ගේ අයිතිවාසිකම් පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරන බවයි. මේ සම්බන්ධයෙන් දැනටමත් දෙපාර්තමේන්තුවේ අවධානය යොමුව ඇති බව දැනගැනීමෙන් කොමිසම සතුටට පත්වන බව පිළිගනිමින්, නියමිත ඇප මුදල් තැන්පත් කිරීමට නොහැකියාව නිසා තවදුරටත් රිමාන්ඩ් භාරයේ සිටින පුද්ගලයින් නිදහස් කිරීමට අදාළ බලධාරීන් සමඟ සාකච්ඡා කර කඩිනම් ක්‍රියාමාර්ග ගන්නා ලෙස නිර්දේශ මඟින් දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා ඇත. වරදකරුවන් වූ සිරකරුවන්ගේ ඇතැම් වර්ගීකරණයන් නීතිය යටතේ අවසර දී ඇති බලපත්‍ර ක්‍රමය යටතේ නිදහස් කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ද නිර්දේශ කෙරිණි. විශේෂයෙන්ම සෞඛ්‍යයට දැඩි තර්ජනයක් පවතින කාලපරිච්ඡේදයක් තුළ බන්ධනාගාර පද්ධතිය මුහුණ දෙන අභියෝග කොමිසම විසින් හඳුනාගෙන ඇත. පවතින හදිසි තත්ත්වය සලකා නිර්දේශ සම්බන්ධයෙන් ගන්නා ලද ක්‍රියාමාර්ග මානව හිමිකම් කොමිසම වෙත නැවත වාර්තා කරන ලෙස බන්ධනාගාර දෙපාර්තමේන්තුව වෙතින් ඉල්ලා සිටියේය.

ඊට සමගාමීව, ශ්‍රී ලංකාවේ බන්ධනාගාර පද්ධතිය තුළ ඇති විය හැකි කෝවිඩ්-19 වෛරසය පැතිරීම වැළැක්වීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගැනීමේ අවශ්‍යතාවය පිළිබඳව කොමිෂන් සභාව 2020 මාර්තු 27 වන දින අතිගරු ජනාධිපතිතුමා වෙත ලිඛිතව දන්වා සිටියේය. බන්ධනාගාරවල සහ අනෙකුත් රැඳවුම් ස්ථානවල කෝවිඩ්-19 වෛරසය සඳහා සූදානම් වීම, වැළැක්වීම සහ පාලනය කිරීම පිළිබඳව ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් විශේෂ මාර්ගෝපදේශ නිකුත් කිරීම සම්බන්ධයෙන් වූ එම ලිපියට (2020 මාර්තු 15 වැනි දින) ජනාධිපතිවරයාගේ අවධානය යොමු වූ අතර වසංගතය සැලකිල්ලට ගනිමින් අපරාධ යුක්ති විනිශ්චය ක්‍රියාවලියේ සෑම අදියරකදීම (පූර්ව විභාග, නඩු විභාගය, දඬුවම් නියම කිරීම සහ පසු දඬුවම් දීමේ අවධීන් ඇතුළුව) බන්ධනාගාර ගත නොකරමින් ගන්නා පියවරයන් භාවිතා කළ යුතු බව එමගින් නිර්දේශ කෙරේ. තවද අඩු අවදානම් සහිත සහ වගකීම් වැඩි සිරකරුවන් (උදා: ගර්භනී කාන්තාවන් සහ කුඩා දරුවන් සිටින සිරකරුවන්) කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වන ලෙස මාර්ගෝපදේශ නිර්දේශ කරයි. මාධ්‍ය මඟින් වාර්තා කර ඇති පරිදි සුළු වැරදිවලට වරදකරුවන් වූවන්ට සහ ඇප කොන්දේසි සපුරාලීමට නොහැකි රිමාන්ඩ් බන්ධනාගාරගතව සිටින පුද්ගලයන්ට නීතිමය සහය

ලබාදීමේ ක්‍රම සෙවීමට දැනටමත් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව ජනාධිපතිතුමාට ප්‍රශංසා කරමින්, වසංගතයේ අනපේක්ෂිත තත්ත්වයන් සැලකිල්ලට ගනිමින්, ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 34 වැනි ව්‍යවස්ථාව යටතේ අවසර දී ඇති පරිදි ඇතැම් සිරකරුවන් සඳහා පොදු සමාවක් ලබා දෙන ලෙස ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව එතුමාගෙන් ඉල්ලා සිටි අතර, එමගින් විශෝධන ක්‍රියාවලියේ අරමුණුවලට හානියක් සිදු නොවන බවට කොමිසම සහතික විය.

- **ඇඳිරි නීතිය පැනවීම විධිමත් කිරීම පිළිබඳ නිර්දේශ**

2020 මාර්තු මාසයේ සිට පනවන ලද ඇඳිරි නීතිය උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත් විශාල පිරිසක් සහ වාහන රාජසන්තක කර ඇති අතර ඉන් පසුව කොවිඩ්-19 වසංගතය සැලකිල්ලට ගනිමින්, මේ සම්බන්ධයෙන් කොමිෂන් සභාව වෙත ප්‍රකාශිත මහජන කනස්සල්ලට අනුව, ඇඳිරි නීතිය පැනවීම විධිමත් කරන ලෙස පොලිස්පතිට මානව හිමිකම් කොමිෂන් සභාව විසින් නිර්දේශ නිකුත් කරන ලදී. කෝවිඩ්-19 වසංගතය වැනි අසාමාන්‍ය හදිසි සෞඛ්‍ය අවස්ථාවකදී මහජන සෞඛ්‍ය සහ පොදු යහපත සඳහා සංචරණ නිදහස සීමා කිරීමේ අවශ්‍යතාවය පිළිගනිමින්, ශ්‍රී ලංකාවේ අදාළ ව්‍යවස්ථාමය සහ නෛතික ප්‍රතිපාදන සහ ජාත්‍යන්තර මානව හිමිකම් බැඳීම්වලට අනුකූල වන පරිදි එවැනි සීමා පනවා තිබේද යන්න සොයා බැලීම සහ ඒ සම්බන්ධයෙන් රජයට අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම කොමිෂන් සභාව වෙත පැවරී ඇති බව කොමිසමේ අදහස විය .

අදාළ තත්ත්වය පිළිබඳ සවිස්තරාත්මක විශ්ලේෂණයකින් පසුව, කොමිෂන් සභාව නිර්දේශ කළේ ඇඳිරි නීතිය ක්‍රම දෙකකින් එක් ක්‍රමයකට විධිමත් කළ යුතු බවයි, එනම් ජනාධිපතිවරයා විසින් කරන ලද නියෝගයක් මගින් සහ මහජන ආරක්ෂක ආඥාපනතේ 16 වැනි වගන්තිය යටතේ ගැසට් කිරීම ඇඳිරි නීතිය පැනවිය හැකි වඩාත්ම බලගතු ක්‍රමය වන අතර එහිදී හදිසි තත්වයක් ප්‍රකාශ කිරීමක් අවශ්‍ය නොවේ; එසේ නොමැති නම් ඇඳිරි නීතිය පැනවිය හැක්කේ නිරෝධායනය සහ රෝග වැළැක්වීමේ ආඥාපනතේ 3 (2) වගන්තිය සමඟ 2 වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සම්පාදනය කරන ලද රෙගුලාසි මගිනි. ඇඳිරි නීතිය ප්‍රකාශ කිරීමේදී විනිවිද භාවයකින් යුක්තවීම සහ අනෙකුත් සියලුම ආකාරයේ සංචරණ සීමා කිරීම් සම්බන්ධයෙන් විධිමත් ලෙස ප්‍රකාශ කිරීම සහ මහජනතාවට ප්‍රසිද්ධ කිරීම අත්‍යවශ්‍ය බව කොමිසම නිරීක්ෂණය කළේය. කොවිඩ්-19 වසංගතය සම්බන්ධයෙන් මහජන සෞඛ්‍ය බලධාරීන් විසින් නිකුත් කර ඇති සෞඛ්‍ය මාර්ගෝපදේශයන්ට පටහැනිව ක්‍රියා කිරීම හෝ පොදුවේ මහජන සෞඛ්‍යට අහිතකර ලෙස ක්‍රියා කිරීම සඳහා තමන් විසින් කරන ලද නිර්දේශවල කිසිවක් මහජනතාව විසින් අර්ථකථනය නොකළ යුතු බව කොමිසම අවධාරණය කරයි.

- **නිරෝධායන ක්‍රියාවලීන් විධිමත් කිරීම පිළිබඳ මාර්ගෝපදේශ**

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් සෞඛ්‍ය අමාත්‍යවරයාට සහ කෝවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථානයේ ප්‍රධානියා වෙත නිරෝධායන ක්‍රියාවලිය විධිමත් කිරීම සම්බන්ධයෙන් මාර්ගෝපදේශ නිකුත් කරන ලදී. කොවිඩ්-19 වසංගතය වැනි

අසාමාන්‍ය හදිසි සෞඛ්‍ය අවස්ථාවකදී මහජන සෞඛ්‍ය සහ පොදු යහපතේ අවශ්‍යතා සඳහා සංචරණ නිදහස සහ මිනිසුන්ගේ නිදහස සීමා කිරීමේ අවශ්‍යතාවය පිළිගන්නා බව කොමිසම යළි යළිත් අවධාරණය කළේය. කෙසේ වුවද, කොවිඩ්-19 වසංගතය පැතිර යාමේ භීතිය යළි හිස ඔසවමින්, විශාල පිරිසක් ලක්ව සිටි නිරෝධායන ක්‍රියාවලියට අදාළව විවිධ පැමිණිලි ලැබී ඇති බව කොමිසම නිරීක්ෂණය කළේය. "නිසි අධිකාරිය" විසින් බලතල පැවරීමේ ක්‍රියාවලියේ විනිවිදභාවය, නිරෝධායන මධ්‍යස්ථාන ලෙස නම් කර ඇති ස්ථාන සහ නම් කිරීමේ අධිකාරිය ලැයිස්තුගත කිරීම, නිරෝධායනය සඳහා හේතුව, ඔවුන් රැගෙන යන ස්ථානය සහ හුදකලා වීමේ කාලය ඇතුළුව නිරෝධායනය වූ පුද්ගලයින් සඳහා ලදුපත් පද්ධතියක් නිර්මාණය කිරීම; නිරෝධායන මධ්‍යස්ථානවල බාහිර පරීක්ෂාව, සහ නිරෝධායනය හසුරුවන අයට යෝජිත නිරෝධායන ප්‍රයත්නයන් පිළිබඳව මාධ්‍ය වෙත දැනුම් දීම තහනම් කිරීම, නිරෝධායනයට ලක්ව සිටින පුද්ගලයින් දරුණු වෛරසයකට ගොදුරු වූ අවාසනාවන්තයින් ලෙස හුවා දක්වමින් ඔවුන් වැරදිකරුවන් ලෙස මහජන දෘෂ්ටියට නිරාවරණය කිරීම වැළැක්වීම මාර්ගෝපදේශවලට ඇතුළත් විය.

නිරෝධායන කාල සීමාව වැටුප් සහිත / රාජකාරි නිවාඩු ලෙස සලකනු ලැබීම සහතික කිරීම; නිරෝධායනයට ලක්ව සිටින අයගේ පවුල් සඳහා මූල්‍ය හෝ වෙනත් ආධාර සහතික කිරීම; සහ නිරෝධායන ක්‍රියාවලිය හේතුවෙන් පවුල්වල අවදානමට ලක්විය හැකි යැපෙන්නන් ඉතිරි වුවහොත්, නිසි බලධාරීන් දැනුවත් කිරීම ඇතුළුව අවදානමට ලක්විය හැකි පුද්ගලයින්ට අවශ්‍ය සියලු සහාය ලබා දීම ග්‍රාම නිලධාරී විසින් සහතික කිරීම වැනි ක්‍රියාමාර්ග මගින් නිරෝධායන ක්‍රියාවලිය මගින් පනවා ඇති දුෂ්කරතා සමනය කළ හැකි බවට කොමිසම නිර්දේශ කරනු ලැබේ.

- **ශ්‍රී ලංකාවේ මානව හිමිකම් වගකීම් ඉටු කිරීම සඳහා කෝවිඩ්-19 සංචරණ සීමා කිරීම් හේතුවෙන් විදේශයන්හි අතරමං වූ ශ්‍රී ලාංකික සංක්‍රමණිකයන් ආපසු ගෙන්වා ගැනීම**

කෝවිඩ්-19 සංචරණ සීමා කිරීම් හේතුවෙන් විදේශයන්හි අතරමංව සිටින ශ්‍රී ලාංකික සංක්‍රමණිකයන් සහ ඔවුන්ගේ පවුල්වල අයගෙන් ලැබුණු පැමිණිලි රාශියකට අනුව, කොමිසම 2020 නොවැම්බර් 26 දිනැති ලිපිය මගින් අතිගරු ජනාධිපතිතුමාගෙන් ඉල්ලා සිටියේ මේ සම්බන්ධයෙන් මැදිහත් වන ලෙසයි. මෙම පැමිණිලිකරුවන් ගුවන් ගමන් ගාස්තු ගෙවා, අවශ්‍ය පීසීආර් පරීක්ෂණවලට භාජනය කර ඇතත්, නොවැම්බර් මස මුලදී ඔවුන් ආපසු ගෙන්වා ගැනීමට රජය පොරොන්දු වී තිබියදීත්, ජීවත් වීමට මූලික පහසුකම් පවා නොමැතිව තවමත් විදේශගතව සිටින බව ලිපියෙන් පෙන්වා දී ඇත. තවද, ඔවුන්ගෙන් බොහෝ දෙනෙකුගේ වීසා බලපත්‍ර අවලංගු කර හෝ කල් ඉකුත් වී ඇති අතර, එමඟින් ඔවුන් නීති විරෝධී සංක්‍රමණිකයන් බවට පත්ව ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ ශ්‍රී ලංකාව අපරානුමත කර ඇති විවිධ ජාත්‍යන්තර ගිවිසුම් ප්‍රකාරව, සංක්‍රමණික සේවකයන්ට සහ ඔවුන්ගේ පවුල්වල අයට නැවත සිය මව්බිමට පැමිණීමට ඇති අයිතිය සහතික කෙරෙන රාජ්‍යයේ වගකීම නැවත අවධාරණය කරමින්, ශ්‍රී ලංකාවේ ජාතික හා ජාත්‍යන්තර මානව හිමිකම් බැඳීම් ඉටු කිරීම සඳහා විදේශයන්හි අතරමංව සිටින සංක්‍රමණිකයන් සහ ඔවුන්ගේ පවුල් සුරක්ෂිතව නැවත ගෙන්වා ගැනීමට කඩිනම් පියවර

ගන්නා ලෙස කොමිසම රජයෙන් ඉල්ලා සිටියේය. ආර්ථිකයට සංක්‍රමණික ප්‍රේෂණවල වැදගත්කම කෙරෙහි අවධානය යොමු කරමින් කොමිසම නිරීක්ෂණය කළේ ඔවුන් ආර්ථිකයට සහ රටට කරන සේවය නොසලකා හැරිය නොහැකි බවත් ඔවුන්ගේ අවශ්‍යතා මතුව ඇති අවස්ථාවේදී ඔවුන්ට ප්‍රබලම සහය ලැබිය යුතු බවත්ය.

- **කෝවිඩ්-19 සන්දර්භය තුළ මළ සිරුරු බැහැර කිරීම පිළිබඳ නිර්දේශ**

කෝවිඩ්-19 සන්දර්භය තුළ මළ සිරුරු බැහැර කිරීම පිළිබඳ කොමිෂන් සභාව සිය නිරීක්ෂණ සහ නිර්දේශ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් සහ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත 2020 නොවැම්බර් 25 දින යොමු කරන ලදී. කෝවිඩ්-19 සන්දර්භය තුළ පුද්ගලයින්ගේ මරණයෙන් පසු අවසන් ආගමික වතාවත් සිදු කිරීමට ඔවුන්ට නොහැකි වීම පිළිබඳව මුස්ලිම්, ක්‍රිස්තියානි සහ බෞද්ධ ඇතුළු විවිධ ආගමික කණ්ඩායම්වල පුද්ගලයින්ගෙන් කොමිෂන් සභාව වෙත ප්‍රකාශිත හා ලැබුණු පැමිණිලි සහ කනස්සල්ල අනුව මෙම නිරීක්ෂණ සහ නිර්දේශ නිකුත් කරන ලදී. අවමංගල්‍ය උත්සවවලදී සිදුකරනු ලබන අවසන් ආගමික වතාවත් ඉටුකිරීම ආගම හෝ විශ්වාසයන් ප්‍රකාශ කිරීමේ ආකාරයක් වන අතර ව්‍යවස්ථාපිත හා ජාත්‍යන්තර මානව හිමිකම් බැඳීම්වලට අනුව මිස ඒවා සීමා කළ නොහැකි බව එම නිර්දේශවල සඳහන් වේ. 2020 අප්‍රේල් 11 දිනැති අංක 2170/8 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය යටතේ ආදාහනය කිරීම සඳහා වූ අනිවාර්ය අවශ්‍යතාවය ආගම හෝ විශ්වාසය ප්‍රකාශ කිරීමේ නිදහස අවලංගු කිරීමක් ලෙස හඳුනා ගන්නා ලදී. කෝවිඩ්-19 වෛරසයට ගොදුරු වන පුද්ගලයින්ගේ දේහයන් භූමදාන කිරීම මෙන්ම ආදාහන කටයුතු ද අවශ්‍ය සෞඛ්‍ය මාර්ගෝපදේශවලට අනුකූලව සිදු කිරීමට අවසර දිය යුතු බව නිර්දේශ කර ඇත.

- **හිටපු යුද හමුදා කෝප්‍රල් සුනිල් රත්නායකට ජනාධිපති සමාව ලබා දීම**

ඝාතන චෝදනා අටකට වරදකරු වූ කෝප්‍රල් සුනිල් රත්නායකට ජනාධිපති සමාවක් ප්‍රදානය කිරීම සහ පසුව 2019 අප්‍රේල් 24 වැනි දින ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ පංච පුද්ගල විනිසුරු මඩුල්ලක ඒකමතික තීන්දුවකින් එම වරද තහවුරු කරන ලද බවට වූ වාර්තාව සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව සිය 2020 මාර්තු 29 දිනැති ලිපිය මගින් දැඩි කණස්සල්ල පළ කර ඇත. කොමිසම ප්‍රකාශ කළේ එම කනස්සල්ල පැන නගින්නේ ගරු නීතිපතිවරයා විසින් රත්නායක මහතාට එරෙහිව ගෙන එන ලද කුඩා දරුවන් තිදෙනෙකු ඝාතනය කිරීම ඇතුළු චෝදනාවල බරපතල ස්වභාවයත්, ඔහු වරදකරු බව තහවුරු කළ ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවේ ශක්තියත් හේතුවෙනි. එවැනි සාහසික අපරාධයකට වරදකරු වූ සහ ශ්‍රේෂ්ඨාධිකරණය ඒකමතිකව වරදකරු කළ පුද්ගලයෙකුට ජනාධිපති සමාව ලබා දීමෙන් ශ්‍රී ලංකාවේ උල්ලංඝනය කිරීම්වලට ගොදුරු වූවන්ට දඬුවම් නොලැබීම සහ යුක්තිය නොමැතිකම පිළිබඳ චෝදනා තහවුරු කරන නිෂේධාත්මක පණිවිඩයක් ලබා දෙන බව එහි වැඩිදුරටත් සඳහන් වේ. තවද, මරණීය දණ්ඩනයට එරෙහිව තමන් අධිෂ්ඨානශීලීව කටයුතු කර ඇති බවත්, එය අහෝසි කර සුදුසු විකල්ප දඬුවමක් ලබා දෙන ලෙස නැවත නැවතත් ඉල්ලා සිටින බවත්, මෙම අවස්ථාවෙහිදී සමාව පිළිබඳ කනස්සල්ල ප්‍රකාශ කිරීම කිසිදු අයුරකින් මරණ දඬුවම පිළිගැනීම නොවන බවත් කොමිසමේ අදහස විය. එම වරදේ බරපතළ ස්වභාවය අනුව මරණීය දණ්ඩනය දීර්ඝ කාලීන සිරදඬුවමක් දක්වා වෙනස් කිරීම පිළිගත හැකි බව එහි සඳහන් විය.

- **2020 පාර්ලිමේන්තු මැතිවරණයේදී නිදහස් හා සාධාරණ මැතිවරණයක් සහතික කිරීම සඳහා මැදිහත් වීම**

2020 පාර්ලිමේන්තු මැතිවරණය කිසිවකු මග නොහැරෙන නිදහස් හා සාධාරණ ක්‍රියාවලියක් බවට සහතික කිරීම සඳහා කොමිෂන් සභාව මැදිහත්වීම් කිහිපයක් සිදු කළේය. මැදිහත්වීම් පිළිබඳ විස්තර සඳහා කරුණාකර 4.4.2 බලන්න.

2.3 ප්‍රතිසංස්කරණ සඳහා වෙනත් උපදේශන

- **කෝවිඩ් 19 - වසංගතය සම්බන්ධයෙන් මහජනතාවට කරන ආයාචනයක්**

දෙවන ලෝක සංග්‍රාමයෙන් පසු මෑත කාලයේ මානව වර්ගයා මුහුණ දෙන දැවැන්තම අභියෝගය වන කොවිඩ්-19 වසංගතය විසින් ගෙන එන ලද අභියෝග ජය ගැනීම සඳහා අධිෂ්ඨානශීලීව සහ ස්වයං සංයමයෙන් ක්‍රියා කරන ලෙස කොමිෂන් සභාව මහජනතාවගෙන් ඉල්ලා සිටී. මෙම තීරණාත්මක අවස්ථාවේදී තම සෞඛ්‍යය මෙන්ම සෙසු පුරවැසියන්ගේ සෞඛ්‍යය ආරක්ෂා කර ගැනීම සඳහා වගකීමෙන් කටයුතු කරන ලෙස එම නිවේදනය මගින් ජනතාවගෙන් වැඩිදුරටත් ඉල්ලා සිටියි කොමිෂන් සභාව සියලුම බලධාරීන්ට, විශේෂයෙන්ම සෞඛ්‍ය සේවා වෘත්තිකයන්ට සිය අවංක කෘතඥතාව පළ කළ අතර, වසංගතයට එරෙහිව සටන් කිරීම සඳහා ඔවුන්ගේ සියලු උත්සාහයන් සඳහා කොමිෂන් සභාවේ පූර්ණ සහයෝගය සහතික කරන ලදී. තවද, මුස්ලිම් ප්‍රජාවගේ ක්‍රියාකාරකම් හරහා වෛරසය ව්‍යාප්ත වීමට ඉඩ ඇති බවට සමාජ මාධ්‍ය මෙන්ම ප්‍රධාන ධාරාවේ මාධ්‍යවල මුස්ලිම් විරෝධී හැඟීම් වර්ධනය වීමත් සමඟ වසංගත තත්ත්වය තවදුරටත් උග්‍ර වන බව එම නිවේදනයේ විශේෂයෙන් සඳහන් වේ. මෙම වගකීම් විරහිත ක්‍රියාවන්හි අරමුණ හෝ පසුබිම කුමක් වුවත්, ප්‍රතිවිපාක වාර්ගික හෝ ආගමික අසමගියකට තුඩු දිය හැකිය. වෛරසය පැතිරීම එක් ප්‍රජාවකට හෝ සමාජ පන්තියකට සුවිශේෂී ලෙස හඳුනාගත නොහැකි බව මෙහි සහ විදේශයන්හි අත්දැකීම්වලින් පැහැදිලිවම පෙන්නුම් කර ඇති බවත් එබැවින් ශිෂ්ට සමාජයක් ලෙස අප සියලු පුරවැසියන් එක්සත් කරමින් සාමූහිකව වගකීම භාර ගත යුතු බවත් කොමිසම අවධාරණය කරයි.

- **2020 පාර්ලිමේන්තු මැතිවරණයට තරඟ කරන දේශපාලන පක්ෂ/ස්වාධීන කණ්ඩායම් සහ අපේක්ෂකයින් වෙත මහජන ආයාචනය**

2020 පාර්ලිමේන්තු මැතිවරණයට තරග කරන දේශපාලන පක්ෂ/ස්වාධීන කණ්ඩායම්වල සියලුම අපේක්ෂකයන්ගේ අවධානය මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද අංක 2178/25 හා 2020 ජූනි 03 දින දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් නිකුත් කර ඇති දේශපාලන පක්ෂ/ස්වාධීන කණ්ඩායම් සහ මැතිවරණ අපේක්ෂකයන් සඳහා තරග කරන ආචාර ධර්ම පද්ධතිය වෙත යොමු කරමින් වෛරී ප්‍රකාශවලින් වැළකී සිටින ලෙස කොමිෂන් සභාව සියලුම දේශපාලන පක්ෂ සහ අපේක්ෂකයින්ගෙන් ඉල්ලා සිටියේය. ප්‍රජාවන්ට හෝ සමාජ කණ්ඩායම්වලට, විශේෂයෙන් කාන්තාවන්, විශේෂ අවශ්‍යතා ඇති හෝ ආබාධිත පුද්ගලයින්, විවිධ ලිංගික නැඹුරුතාවන් සහ වෙනත් ආගමික හෝ වාර්ගික කණ්ඩායම්වලට තර්ජනය කරන,

අපහාස කරන, අගතියට පත් කරන හෝ වෙනස් කොට සැලකීමේ ඕනෑම ආකාරයක වෛරී ප්‍රකාශයක් හෝ ක්‍රියාවක් වැළැක්විය යුතු බව ආචාර ධර්ම සංග්‍රහය නියම කරයි. එම ප්‍රතිපාදනය උල්ලංඝනය කිරීම ආචාරධර්ම සංග්‍රහය උල්ලංඝනය කිරීමක් පමණක් නොව සමානාත්මතාවයට සහ වෙනස් කොට නොසැලකීමට ඇති අයිතිය තහවුරු කරන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) වගන්තිය උල්ලංඝනය කිරීමක් බව කොමිසම අවධාරණය කරයි. ප්‍රජාතන්ත්‍රවාදයේ නියම අර්ථය තහවුරු කිරීම සඳහා මැතිවරණ කාල සීමාවෙන් ඔබ්බට ආචාරධර්ම සංග්‍රහයේ අන්තර්ගතයට ගරු කළ යුතු බව සහතික කිරීම සඳහා අපේක්ෂකයින්ට විශේෂ වගකීමක් ඇති බව මානව හිමිකම් කොමිෂන් සභාව ද අවධාරණය කළේය.

- නිදහස් හා සාධාරණ මැතිවරණයක් සහතික කිරීම සඳහා මාධ්‍ය ආයතනවලට ඔවුන්ගේ කාර්යභාරය පිළිබඳව ආයාචනා කිරීම

2020 ජූනි 03 දිනැති අංක 2178/24 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 ආ(5)(අ) ව්‍යවස්ථාව යටතේ මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද මාධ්‍ය මාර්ගෝපදේශවලට අනිවාර්යයෙන්ම අනුකූල වන ලෙස කොමිෂන් සභාව සියලුම මාධ්‍ය ආයතනවලින් ඉල්ලා සිටියේය. මාර්ගෝපදේශ යළි යළිත් අවධාරණය කරමින්, මානව හිමිකම් කොමිසම සෑම මාධ්‍ය ආයතනයකින්ම ඉල්ලා සිටියේ ආගමික විශ්වාසයන්, ඇදහිලි, භාෂාව, ජනවාර්ගිකත්වය, සිරිත් විරිත් සහ කුලය ඇතුළු විවිධ හේතූන් මත ශ්‍රී ලාංකීය ජනතාව අතර වෛරය සහ නොඉවසීම වර්ධනය කරන හෝ පොළඹවිය හැකි තොරතුරු ප්‍රචාරණය කිරීමෙන්, විකාශනය කිරීමෙන් හෝ ප්‍රකාශ කිරීමෙන් වැළකීම සහ දේශපාලන ක්‍රියාකාරීන් අතර සහ සමාජය තුළ වෛරී දේශපාලනය ප්‍රවර්ධනය කරන ප්‍රචාරක ක්‍රියාකාරකම් ප්‍රචාරණය කිරීම, විකාශනය කිරීම හෝ ප්‍රකාශයට පත් කිරීම වළක්වන ලෙසයි.දැනුවත්භාවයෙන් යුක්තව ඡන්දය ප්‍රකාශ කිරීමට මහජනතාවට සහාය වීම සඳහා නිවැරදි, සමබර සහ අපක්ෂපාතී තොරතුරු සැපයීමට සහ විකෘති හෝ අතිශයෝක්තියෙන් යුත් ප්‍රවෘත්ති පළ කිරීමෙන් වැළකී සිටීමට මාධ්‍ය සංවිධානවලට බැඳීමක් ඇති බව කොමිසම සඳහන් කළේය.

2.4 එක්සත් ජාතීන්ගේ සාම හමුදා සඳහා ශ්‍රී ලාංකික හමුදා භටයන් තෝරා ගැනීම

ශ්‍රී ලංකා රජයේ ආරාධනයෙන් 2017 පෙබරවාරි මස එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම් සඳහා යෙදවීමට නියමිත හමුදා සාමාජිකයින්ගේ යෝග්‍යතාවය පරීක්ෂා කිරීම ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම විසින් ආරම්භ කරන ලදී. මෙම ක්‍රියාවලිය මඟින් යෙදවිය යුතු පුද්ගලයන්, මානව හිමිකම්වලට ගරු කිරීම සහ කැපවීම ඇතුළුව අවංකභාවයේ ඉහළම ප්‍රමිතීන් සපුරාලීම සහතික කෙරේ. පරීක්ෂණ ක්‍රියාවලිය හසුරුවන කාර්ය පටිපාටි රීතින්වල ඌණතාවයක් පැවති හෙයින්, පරීක්ෂණ ක්‍රියාවලිය විධිමත් කිරීම සඳහා සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටිය සැකසීමට 2018 දී වට මේස සාකච්ඡාවකදී තීරණය කරන ලදී. සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටිය සඳහා සියලුම පාර්ශවකරුවන් එකඟ වන තෙක් පරීක්ෂණ ක්‍රියාවලිය නතර කරන ලද අතර අවසානයේ

එය 2018 දෙසැම්බරයේ සිට ක්‍රියාත්මක විය. ක්‍රියාවලිය ඇනහිටීමේ ප්‍රතිඵලයක් වශයෙන් අයදුම්පත් ගොඩගැසුණු අතර එහිදී සියලුම පාර්ශ්වකරුවන් විසින් ද්විත්ත්ව පරීක්ෂණයක් පැවැත්වීමට තීරණය කරන ලදී. එනම් පරීක්ෂා කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා. කොමිෂන් සභාව මෙන්ම ජිනීවාහි මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලය විසින්ද අයදුම්පත් පරීක්ෂා කරන ලදී. මෙම ක්‍රියා පටිපාටිය 2020 අගෝස්තු දක්වා පැවතුණි. වාර්තා කරන වර්ෂය තුළ කොමිෂන් සභාව හමුදා භටයින් 571 ක් එනම් ශ්‍රී ලංකා යුධ හමුදා සාමාජිකයින් 346 ක්, ශ්‍රී ලංකා ගුවන් හමුදා භටයින් 218 ක්, ශ්‍රී ලංකා නාවික හමුදාවේ 2 ක් සහ ශ්‍රී ලංකා පොලිස් භටයින් 5 දෙනෙකු යෙදවීම සඳහා පරීක්ෂා කර තහවුරු කර ඇත.

2.5 අභියෝග

2020 වර්ෂයේදී කොමිෂන් සභාවට ජයග්‍රහණ රැසක් හිමි විය. එසේ වුවද, පෙර නොවූ විරූ කෝවිඩ්-19 වසංගතයේ බලපෑම නිසා ඇතිවූ අමතර අභියෝග සමඟ 2020 දී කොමිසමට බාධා කරන දිගුකාලීන අභියෝග දිගටම පැවතුනි. ප්‍රධාන අභියෝගය වූයේ 2020 වර්ෂයේ පළමු අඟුලු දැමීමේදී කාර්යාල පරිශ්‍ර වසා දැමීම සහ පසුව සීමිත කාර්ය මණ්ඩලයක් සහිතව ක්‍රියාකාරකම් නැවත ආරම්භ කිරීමත් සමග පරීක්ෂණ පැවැත්වීම සහ නිර්දේශ නිකුත් කිරීම ප්‍රමාද වීමයි. වසංගතය හේතුවෙන් අධීක්ෂණ ක්‍රියාකාරකම් වැඩි කිරීම සඳහා අඛණ්ඩව පවතින කාර්ය මණ්ඩල හිඟය සහ නිවසේ සිට බාධාවකින් තොරව වැඩ කිරීමේ විධිවිධාන සඳහා දැනට සිටින කාර්ය මණ්ඩලයේ තාක්ෂණික කුසලතා ප්‍රමාණවත් නොවීම කොමිසමේ කාර්යක්ෂම හා ඵලදායී ක්‍රියාකාරිත්වයට බාධාවක් විය.

කොමිෂන් සභාවට තවත් පුනරාවර්තී අභියෝගයක් වූයේ රාජ්‍ය අංශයේ පවතින පැරණි පරිපාලන හා මූල්‍ය රෙගුලාසි හේතුවෙන් ඇති වූ පරිපාලන දුෂ්කරතා සහ මෙම ගැටලු විසඳීම සඳහා නව්‍ය පරිපාලන විසඳුම් නොමැතිකම නිසා කොමිෂන් සභාවට අපේක්ෂිත මට්ටමින් පරිපාලන කටයුතුවල ප්‍රගතියක් ලබා ගැනීමට නොහැකි වීමය. තවද, පරීක්ෂණ සහ විමර්ශන අංශයේ ක්‍රියාත්මක නොවන අධීක්ෂණ ඒකකය මානව හිමිකම් කොමිසමේ නිර්දේශ ක්‍රියාවට නැංවීම පිළිබඳව උනන්දුවෙන් පසු විපරම් කළද, සැලකිය යුතු නිර්දේශ ප්‍රතිශතයකට රාජ්‍ය නිලධාරීන් විසින් අනුකූල නොවීම නිරන්තරයෙන් සැලකිල්ලට භාජනය කළයුතු කරුණක් ලෙස පවතී. මානව හිමිකම් ආරක්ෂා කිරීම සඳහා කොමිෂන් සභාවට පැවරී ඇති බලය පූර්ණ ලෙස සාක්ෂාත් කර ගැනීමට මෙය අහිතකර ලෙස බලපෑම් කරන ලදී. නීතිමය ගාස්තු සහ දිග්ගැස්සුනු ප්‍රමාදයන් හේතුවෙන් පාර්ශ්වයන්ට බරක් වන අධිකරණය මගින් සිය නිර්දේශ ක්‍රියාවට නැංවීම සහ ඒ සඳහා මව් පනතට සංශෝධනයක් ගෙන ඒමට වඩා වැරදි නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීම අනුකූලතාවය සහතික කිරීමේ හොඳම ක්‍රමය යන අදහසෙහි කොමිසම ස්ථාවර ලෙස රැඳී සිටියේය.

3 වන පරිච්ඡේදය:
පරීක්ෂණ හා විමර්ශන

3.1 සංක්ෂිප්ත සාරාංශය

3.1.1 සේවා ක්‍රමවේද ශක්තිමත් කිරීම

3.1.2 ලැබූ පැමිණිලි පිළිබඳ සංඛ්‍යාලේඛන

3.1.3 2020 අවසන් කළ විමර්ශන පිළිබඳ සංඛ්‍යාලේඛන

3.1.4 නිර්දේශ

3.2 හිමිකම් වර්ග අනුව එක් එක් පැමිණිලි පිළිබඳ නිදසුන්

3.2.1 අත්අඩංගුවේ සිටියදී වධහිංසා වලට භාජනය කිරීම (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වගන්තිය)

3.2.1 සමානාත්මතාවය සහ වෙනස් ලෙස නොසැළකීම (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 වගන්තිය)

3.2.2 බහුවිධ අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම

3.3 ස්වයං සිද්ධි අධ්‍යයන

3.4 සභාපති කාර්යාලයේ මැදිහත්වීම්

පරීක්ෂණ සහ විමර්ශන

3.1. සංක්ෂිප්ත සාරාංශය

කොමිෂන් සභාවට මහජනතාවගෙන් පැමිණිලි ලැබෙන අතර ඒ සමඟම මූලික අයිතිවාසිකම් උල්ලංඝණය කිරීම් තුළින් හෙළිදරව් වන ගැටලු පිළිබඳව ස්වයං මෙහෙයවීම මත විමර්ශනය කිරීමට, ගැටලු පිළිබඳව විමසීමට කොමිසමට එහි මව් පනතේ 14 වැනි වගන්තිය යටතේ බලය පවරා ඇත.

3.1.1. සේවා ක්‍රම ශක්තිමත් කිරීම

පරීක්ෂණ සහ විමර්ශන අංශයේ කාර්යක්ෂමතාව සහ ප්‍රතිචාර දැක්වීමේ හැකියාව ඉහළ නැංවීම සඳහා කොමිෂන් සභාව විසින් නව සේවා ක්‍රම හඳුන්වා දී ක්‍රියාත්මක කරන ලද අතර පවත්නා යාන්ත්‍රණයන් වැඩිදියුණු කරන ලදී.

- පැමිණිලි යාන්ත්‍රණය ක්‍රමවත් කිරීමට සහ විධාවත් ක්‍රමයෙන් පැමිණිලි ලැබීමට පහසුකම් සැලසීමට කොමිෂන් සභාව මානව හිමිකම් තොරතුරු පද්ධතිය (HURIN) දියත් කරන ලදී. විශේෂයෙන්ම කෝවිඩ්-19 ආශ්‍රිත අගුලු දැමීමේ කාලසීමාවන්හිදී කොමිසම වෙත පුද්ගලිකව නොපැමිණ පැමිණිලි කිරීම සඳහා මානව හිමිකම් තොරතුරු පද්ධතිය (HURIN) මඟින් පැමිණිලිකරුවන්ට හැකියාව ලබාදී ඇත.

- රාජ්‍ය ආයතන විසින් ක්‍රියාත්මක නොකරන ලද නිර්දේශ කාර්යක්ෂමව පසු විපරම් කිරීම සඳහා 2019 වසරේ පරීක්ෂණ සහ විමර්ශන අංශයේ ක්‍රියාත්මක නොවූ නිර්දේශ අධීක්ෂණය කිරීමේ ඒකකය (Non Implementation Monitoring Unit) විසින් අනුගමනය කරන ලද තේමාත්මක පොකුරු ක්‍රමය(Thematic Cluster Method) 2020 දී සාර්ථකව ක්‍රියාත්මක විය. (මෙම ඒකකය පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා 4.3 පරිච්ඡේදය බලන්න.

- නිර්දේශ නිකුත් කර අවසන් කරන ලද පැමිණිලි සඳහා හැර අනෙකුත් සියලුම බැහැර කළ පැමිණිලි සඳහා 2018 දී හඳුන්වා දුන් අභියාචනා යාන්ත්‍රණය 2020 දී සාර්ථකව ක්‍රියාත්මක විය. වසංගතයේ ප්‍රතිඵලයක් ලෙස අභියෝගාත්මක සේවා කොන්දේසි තිබියදීත්, පැමිණිලි නැවත බාර ගැනීමට හේතු තිබේද යන්න තීරණය කිරීම සඳහා 2020 තුළ සැලකිය යුතු අභියාචනා සංඛ්‍යාවක් සමාලෝචනය කරන ලදී.

3.1.2 ලැබුණු පැමිණිලි පිළිබඳ සංඛ්‍යා ලේඛන:

සමස්තයක් වශයෙන්, 2020 දී පැමිණිලි 6417 ක් මානව හිමිකම් කොමිසම වෙත ලැබී ඇත. එය පෙර වසරේ ලැබුණු පැමිණිලි 8983 හා සසඳා බැලීමේදී කෝවිඩ්-19 වසංගතයේ ප්‍රතිඵලයක් ලෙස අගුලු දැමීම් සහ සංචරණ සීමා කිරීම් හේතුවෙන් මහජනයා කොමිසමට ප්‍රවේශ වීමෙන් වැළැකුනු බැවින් මුළු පැමිණිලිවල සැලකිය යුතු අඩුවීමක් සිදු වීමට එය හේතු වන්නට ඇත.

මානව හිමිකම් තොරතුරු පද්ධතිය (HURIN) ක්‍රියාත්මක වුවද, එම පද්ධතිය හරහා එතරම් පැමිණිලි නොලැබුනේ සමහරවිට පැමිණිලිකරුවන්ට ඇති තාක්ෂණය පිළිබඳ නුහුරුකම නිසා විය හැකිය. (මානව හිමිකම් තොරතුරු පද්ධතිය (HURIN) පිළිබඳ වැඩි විස්තර සඳහා ඉහත 3.1.1 බලන්න). පෙර වසරවල මෙන්ම, ඒ ඒ කාණ්ඩ වශයෙන් ගත් කළ ලැබුණු පැමිණිලිවලින් 29%ක් වූ වැඩිම පැමිණිලි සංඛ්‍යාවක් ලැබී ඇත්තේ අත්අඩංගුවේ දී වධහිංසා පැමිණවීම සහ අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීම සහ රඳවා තබා ගැනීම ඇතුළු පුද්ගලික නිදහස උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙනි. සංඛ්‍යාත්මක වශයෙන් සමස්ත අඩුවීමක් තිබියදීත්, 2019 දී 1629ක් වූ පුද්ගලික නිදහස උල්ලංඝනය කිරීම සම්බන්ධ පැමිණිලි 2020 දී 1869 දක්වා ඉහළ ගොස් තිබීම සුවිශේෂී කරුණකි. පුද්ගල නිදහස උල්ලංඝණය කිරීමේ පුළුල් කාණ්ඩය තුළ, අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීම් සහ රඳවා තබා ගැනීම් උල්ලංඝනය කිරීම් සම්බන්ධ පැමිණිලි 2019 දී 775 සිට 2020 දී 910 දක්වා ඉහළ ගොස් ඇත. දෙවන වැඩිම පැමිණිලි සංඛ්‍යාව (853ක්) රජයේ ආයතනවල අක්‍රියත්වය සම්බන්ධ වන අතර ඉන් 502ක් පොලිසියට එරෙහි පැමිණිලි වේ. තෙවන ඉහළම පැමිණිලි කාණ්ඩය වන්නේ සේවා නියුක්තිය සම්බන්ධයෙන් වන 717ක් වන අතර එය මුළු පැමිණිලිවලින් 11%කි. ලැබී ඇති පැමිණිලි 6417 න් 3205 ක් ප්‍රාදේශීය කාර්යාල වෙත ලැබී ඇති අතර ඉතිරිය ප්‍රධාන කාර්යාලය වෙත ලැබී ඇත.

2020 දී එක් එක් කාණ්ඩයට ලැබුණු පැමිණිලි සංඛ්‍යාව 2019 සංඛ්‍යා සමඟ සංසන්දනයක්



ප්‍රධාන කාර්යාලයට හා ප්‍රාදේශීය කාර්යාලය වලට ලැබුණු පැමිණිලි වර්ග

පැමිණිලි ස්වභාවය	ප්‍රාදේශීය කාර්යාලය													ප්‍රාදේශීය කාර්යාල	ප්‍රධාන කාර්යාලය	මුළු එකතුව
	අම්පාර	අනුරාධපුර	බදුල්ල	මඩකලපුව	යාපනය	කිළිනොච්චිය	කල්මුනේ	මහනුවර	මාතර	නිකුණාමලය	වවුනියාව	මන්නාරම	මුත්තලම			
පෞද්ගලික නිදහස	21	124	18	67	114		31	99	142	28	56	16	119	875	994	1869
(අ)වදහිංසා කිරීම්(ශාරීරික සහ මානසික)	9	48	--	--	47	1	2	15	12	2	9	3	18	166	249	415
(ආ) අවමන් සහගත සැළකීම්	--	1	4	2	1	1	21	--	--	1	1	1	3	36	--	36
(ඇ) හිංසනය	2	--	9	8	21	1	--	21	--	7	14	4	15	102	213	315
(ඈ) ලිංගික අතවර	--	--	--	1	--	--	--	--	--	--	--	--	--	1	2	3
(ඉ)තර්ජනය කිරීම්	--	7	--	2	22	8	1	1	28	3	15	3	45	135	--	135
(ඊ)අත්තනෝමතික අත් අඩංගුවට ගැනීම්/රඳවා තැබීම්	10	63	4	53	22	29	7	58	98	15	17	5	38	419	491	910
(උ)අත්අඩංගුවේදී මරණයට පත්වීම්	--	3	1	1	--	--	--	--	3	--	--	--	--	8	21	29
(ඌ)නීතියට පිටින් සිදුවන ඝාතන	--	--	--	--	1	--	--	--	--	--			--	1	4	5
(එ) සිරකරු අයිතිවාසිකම්	--	2	--	--			--	4	1	--	--	--	--	7	14	21
වෙනත් සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම්	--	1	--	2	2	--	6	1		1	5	3	--	21	11	32

රැකියා	26	57	38	23	28	1	37	136	51	8	18	8	17	448	269	717
අධ්‍යාපන	--	13	14	8	16	1	11	43	60	--	1	2	4	173	138	311
රාජ්‍ය සුබ සාධන සේවා	--	17		5	4	2	1	11	3	--	2	7	6	58	1	59
යටිතල පහසුකම් සහ උපයෝගිතා	1	4	2	--	--	--	2	5	2	1	3	--	--	20	6	26
ඡන්ද ලියාපදිංචියට අදාල පැමිණිලි	--	--	--	3	2	--	--	1	--	--	2	--	1	9	2	11
රාජ්‍ය ආයතනයන්හි අක්‍රියත්වය පිළිබඳ පැමිණිලි	26	116	53	92	74	13	97	137	33	17	39	22	31	750	103	853
(අ)පොලීසිය	14	38	35	66	59	11	73	48	28	5	29	12	21	439	63	502
(ආ)වෙනත් රජයේ බලධාරීන්	12	78	18	26	15	2	24	89	5	12	10	10	10	311	40	351
ළමා අයිතිවාසිකම්	--	1	--	1	4	--	7	--	--	--	--	--	7	20	--	20
ආබාධිතයින්ගේ අයිතිවාසිකම්	--	7	--	1	1	--	1	1	1	--	--	--	--	12	1	13
භාෂාමය අයිතිවාසිකම්	--	--	--	--	1	--	--	--	--	--	1	--	--	2	2	4
සංක්‍රමණික වෘත්තීය අයිතිවාසිකම්	--	3	--	--	--	--	1	6			2			12	4	16
LGBT (සමරිසි ස්ත්‍රී, සමරිසි පුරුෂ, සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයින්,) අයිතිවාසිකම්	--	--	--	--	--	--	0	1	--	--	--	--	--	1	--	1
සෞඛ්‍යමය අයිතිවාසිකම්	--	2		1	--	2	1	--	--	--	2	--	6	14	--	14
ඉඩම් සහ දේපල අයිතිවාසිකම්	23	34	14	23	3	8	18	27	5	5	24	24	40	248	30	278

අභ්‍යන්තර අවතැන්වූ පුද්ගලයන්/නැවත පැමිණි සරණාගතයන්	--	--	--	--	1	--	--	--	--	--	5	--	--	6	--	6
පාරිසරික අයිතිවාසිකම්	1	1	--	4	--	--	2	1	3	--	1	--	1	14	5	19
පරිපාලන කටයුතු	2	--	28	8	7	1		44	5	11	--	--	12	118	50	168
වැඩිහිටි අයිතිවාසිකම්	--	--	--	--	--	--	--	--	--	--	--	--	--		2	2
කාන්තා අයිතිවාසිකම්	--	--	--	2	2	--	3	--	--	--	--	--	1	8	--	8
වෙනත් වර්ග (විෂය පථයට ඇතුලත් නොවන පැමිණිලි ඇතුළුව)	--	118	22	27	4	2	9	38	134	8	19	1	--	382	1594	1990
එකතුව	100	498	189	267	263	70	227	551	440	79	181	99	245	**3205**	**3212**	**6417**


2020 දී ලැබුණු පැමිණිලි
2000
1800
1600
1400
1200
1000
800
600
400
200
0
පෞද්ගලික නිදහස
වෙනත් සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම්
ජීවිත නියුක්තිය
අධ්‍යාපන
රාජ්‍ය සුභසාධන
යටිතල පහසුකම්
ඡන්දදායකයින් ලියාපදිංචිය
රජයේ ආයතන වල නොසළකාහැරීම්
ළමා අයිතිවාසිකම්
ආබාධිත අයිතිවාසිකම්
භාෂා අයිතීන්
සංක්‍රමණික ශ්‍රමික අයිතිවාසිකම්
LGBTIQ අයිතිවාසිකම්
සෞඛ්‍ය
ඉඩම් හා දේපළ අයිතිවාසිකම්
අභ්‍යන්තර අතුරුදහන්/පෙරළා පැමිණි සරණාගතයින්
පාරිසරික
පරිපාලන කාර්යයන්
වැඩිහිටි අයිතිවාසිකම්
කාන්තා අයිතිවාසිකම්

3.1.3 **2020** දී විමර්ශන අවසන් කළ පැමිණිලි පිළිබඳ විස්තර:

පැමිණිලි ප්‍රතිඵල අනුව වර්ගකිරීම්	අම්පාර	අනුරාධපුර	බදුල්ල	මඩකලපුව	යාපනය	කිළිනොච්චි	මහනුවර	කල්මුනේ	මාතර	මුලතිව්	මන්නාරම	වවුනියාව	පුත්තලම	ප්‍රධාන කාර්යාලය
සමථයකට පත්වීම්	10	195	22	221	115	49	16	29	2	5	29	18	--	45
මූලික අයිතිවාසිකම් කඩ නොවූ	11	58	34	27	86	71	211	10	153	56	18	29	--	112
විෂය පථයට අයත් නොවන	--	--	15	--	19	10	38	--	120	8	5	--	195	70
පැමිණිලිකරුගේ උනන්දුවක් නොමැති	24	60	25	25	11	10	98	30	75	41	10	7	--	231
ඉල්ලා අස්කර ගැනීම්	1	7	--	3	11	--	11	1	18	4	2	4	--	62
වෙනත් ආයතන වෙත යොමු කිරීම්	--	21	36	4	9	1	19	6	11	--	--	2	--	2
අවසන් නොවූ අධිකරණ ක්‍රියාමාර්ග	24	12	--	3	3	4	35	3	6	--	--	--	--	60
සහන ලබා දුන්	7	--	9	86	6	5	59	33	44	11	24	28	--	52
මගපෙන්වීම් ලබා දීම්	--	--	--	1	--	--	36	--	--	--	--	--	--	1
කාලාවරෝධී (නිර්දේශිත)	--	--	--	--	1	--	6	--	20	--	--	1	--	--
ලබා දුන් නිර්දේශ	--	--	--	--	--	--	--	--	--	--	--	--	22	60
උප එකතුව	**77**	**353**	**141**	**370**	**261**	**150**	**529**	**113**	**449**	**125**	**88**	**89**	**217**	**695**
එකතුව														**3657**

3.1.4 නිර්දේශ:

කොමිෂන් සභාව විසින් 2020 වසර තුළ දී සමස්ත නිර්දේශ **60** ක් ලබා දෙන ලදී. පසුගිය වසරවලට වඩා මෙම සංඛ්‍යාව අඩුවීමට හේතුව කොවිඩ්-19 වසංගතයේ ප්‍රතිඵලයක් වශයෙන් කොමිසමේ සාමාන්‍ය ක්‍රියාකාරකම් වලට බාධා සිදුවීමත්, වසංගතයෙන් පැන නැගුනු මානව හිමිකම් උල්ලංඝනය කිරීම් වසරේ අවසාන කාර්තු තුන තුළ සිදුවීම වැළැක්වීම සහතික කිරීම සඳහා අධීක්ෂණ කටයුතු වැඩි කිරීම අවශ්‍ය වීමත්ය.

එම නිර්දේශවලින් බහුතරයක් අධ්‍යාපනයට ඇති අයිතිය වැනි ආර්ථික හා සමාජීය අයිතීන් සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇති සමානාත්මතාවය සහ වෙනස්කම් නොකිරීමේ විධිවිධාන උල්ලංඝණය කිරීම පිළිබඳව විය. පසුගිය වසරට සමානව, රජයේ පාසල්වලට ඇතුළත් කර ගැනීම සම්බන්ධයෙන් වැඩිම නිර්දේශ සංඛ්‍යාවක් **(24)** නිකුත් කරන ලද අතර එය සෑම වසරකම කොමිෂන් සභාවට මැදිහත් විය යුතු වාර්ෂික ගැටලුවක්ව පවතී. සමස්ත නිර්දේශ අතුරින්, වධහිංසා පැමිණවීම් සහ නීතිවිරෝධී අත්අඩංගුවට ගැනීම් සහ රඳවා තබා ගැනීම් පිළිබඳ ලැබුණු පැමිණිලි සංඛ්‍යාව **14** ක් පමණි (**2020** දී නිකුත් කරන ලද සම්පූර්ණ නිර්දේශ ලැයිස්තුව සඳහා **2** වන උපග්‍රන්ථය බලන්න). සියලුම නිර්දේශ මහජන පරිශීලනය සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා වෙබ් අඩවියේ පළ කර ඇත.

2020 වසරේ ලබාදුන් නිර්දේශ

විෂය/ක්ෂේත්‍රය	නිර්දේශ සංඛ්‍යාව
ආර්ථික, සමාජ සහ සංස්කෘතික අයිතිවාසිකම්	**63**
- අධ්‍යාපනය හා සම්බන්ධ අයිතිවාසිකම්[1]	27
- වෙනත් ආර්ථික, සමාජ සහ සංස්කෘතික අයිතිවාසිකම්[2]	19
පුද්ගලික නිදහස හා සම්බන්ධ අදාල අයිතිවාසිකම්[3]	**14**
එකතුව	**60**

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මානව හිමිකම් සභාවේ පරිගණක දත්ත ගබඩාව

[1] මෙම නිර්දේශ පාසැල් වලට ඇතුළත් කිරීම්, ශිෂ්‍ය විනය ක්‍රියාමාර්ග, විශ්ව විද්‍යාල ප්‍රවේශ, අධ්‍යාපනික ආයතන වල හිරිහැර සහ අධ්‍යාපන ආයතනය වල රැකියා උසස්වීම් උල්ලංඝනය කිරීම් වලට අදාළ ඒවාය.

[2] නිර්දේශ තුළ ආර්ථික සමාජ හා සංස්කෘතික අයිතිවාසිකම් වලට අයත් විශ්‍රාම වැටුප්, ස්ථාන මාරු, ජීවන මාර්ග, වැටුප් වර්ධක, බඳවා ගැනීම්, වෘත්තිය සේවා තත්වයන්, සේවය අත්හිටුවීම්, සේවයෙන් පහ කිරීම්, වන්දි ගෙවීම් හා බලතල අවභාවිතා කිරීම් වලට අදාළ උල්ලංඝණ අයත් වේ.

[3] නීතිවිරෝධී අත්අඩංගුවට ගැනීම් හා රඳවා තබා ගැනීම්, වධහිංසා පැමිණවීම් හා අත්අඩංගුවේ සිටියදී මරණයට පත් කිරීම් වැනි උල්ලංඝන ඇතුළත් පුද්ගල නිදහසට අයත් අයිතීන්.



3.2. හිමිකම් වර්ග අනුව එක් එක් පැමිණිලි පිළිබඳ නිදර්ශන

3.2.1. අත්අඩංගුවේ සිටියදී සිදුවන මානව හිමිකම් උල්ලංඝනයන්

(ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන වගන්තිය)

- පොලිස් අත්අඩංගුවේ දී වධහිංසා පැමිණවීම හෝ කුරිරු, අමානුෂික හෝ අවමන් සහගත සැලකීම (පැමිණිලි අංකය: **HRC/AP/473/2014)**

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් පෙත්සම්කරුවන් දෙදෙනා සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වැනි වගන්තිය උල්ලංඝනය කර ඇති බැව් හඳුනා ගත් අතර 1 වන සහ 3 වන වගඋත්තරකරුවන්ට විසින් රු. 10,000/= ක් 1 වන පෙත්සම්කරුට වන්දි වශයෙන් ගෙවීමටත්, 6 වැනි සහ 9 වැනි වගඋත්තරකරුවන් විසින් රු. 10,000/= ක් 2 වැනි පෙත්සම්කරුට වන්දි වශයෙන්.ගෙවීමටත් නියෝග

කරන ලදී. අනුරාධපුර පොලිසිය විසින් පෙත්සම්කරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා අනුගමනය කළ ක්‍රියා පටිපාටිය තුළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(1) වගන්තිය උල්ලංඝනය වීමක් කොමිසම විසින් සොයා ගනු නොලැබීය. පෙත්සම්කරුවන් දෙදෙනා නීතිවිරෝධී මත්පැන් නිෂ්පාදනය සහ අලෙවි කිරීම සම්බන්ධයෙන් ලැබුණු බුද්ධි තොරතුරකට අනුව මෙම අත්අඩංගුවට ගැනීම සිදු කර ඇත. අත්අඩංගුවට ගන්නා අවස්ථාවේ පෙත්සම්කරුවන්ට වධ හිංසා පමුණුවා ඇති බවටද චෝදනාවක් තිබේ. අධිකරණ වෛද්‍ය නිලධාරි වාර්තාවේ අඩංගු වෛද්‍ය සාක්ෂි මගින් පෙත්සම්කරුවන් දෙදෙනාට තුවාල සිදුවී ඇති බවට පෙත්සම්කරුවන් චෝදනා කළ ආකාරය සනාථ වන බව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් සොයා ගන්නා ලදී. තවද වගඋත්තරකරුවන්ට එරෙහිව සුදුසු විනය ක්‍රියාමාර්ග ගැනීම සඳහා එම නිර්දේශයේ පිටපතක් පොලිස්පතිවරයාට සහ ජාතික පොලිස් කොමිසමේ සභාපතිවරයා වෙත යොමු කිරීමට කොමිෂන් සභාව නිර්දේශ කළේය.

3.2.2 සමානාත්මතාවය සහ වෙනස් කොට නොසැලකීම (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 වැනි වගන්තිය)

- **රජයේ පාසලක 1 ශ්‍රේණියට ඇතුළත් වීම (පැමිණිලි අංක: HRC/2571/18 සහ HRC/2572/18)**

කොළඹ ප්‍රධාන පෙළේ ජාතික පාසල් දෙකකට එරෙහිව පෙත්සම්කරුගේ දරුවාට මෙම පාසල්වල 1 ශ්‍රේණියට ඇතුළත් වීමේ සම්මුඛ පරීක්ෂණවලට සහභාගි වීමේ අවස්ථාව අසාධාරණ ලෙස අහිමි කර ඇති බවට පෙත්සම්කරු විසින් කරන ලද පැමිණිලි දෙකකට ප්‍රතිචාර දක්වමින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 (1) වගන්තිය උල්ලංඝනය කරන ලද බව නිශ්චය කර ගත් කොමිෂන් සභාව එකී රජයේ පාසල්වල ඇතුළත් වීමේ සම්මුඛ පරීක්ෂණවලට මුහුණ දීමට දරුවාට අවස්ථාව ලබා දෙන ලෙස නිර්දේශ කර ඇත. තම සැමියා නාවික හමුදාවේ ලුතිනන් කමාන්ඩර්වරයකු වන පෙත්සම්කාරිය නිල ස්ථාන මාරුවීම් කාණ්ඩය යටතේ තම දරුවා 1 ශ්‍රේණියට ඇතුළත් කර ගැනීමට පාසල් දෙකටම අයදුම්පත් ඉදිරිපත් කර ඇත. අයදුම්පත් ප්‍රතික්ෂේප කළ බව පාසල් දෙකම පෙත්සම්කරුට ලිඛිතව දන්වා ඇත. ඉන්පසුව ඇය එම පාසල්වල අදාල තීරණවලට එරෙහිව අභියාචනයක් ඉදිරිපත් කර ඇති නමුත් වගඋත්තරකාර පාසල් හෝ අධ්‍යාපන අමාත්‍යාංශයේ අභියාචනා මණ්ඩලය ඇයගේ අභියාචනයට ප්‍රතිචාර දක්වා නැත. වගඋත්තරකාර පාසල් සඳහන් කරන්නේ අංක 24/2018 චක්‍රලේඛය ප්‍රකාරව පෙත්සම්කරුගේ සැමියාගේ ස්ථාන මාරුව පිළිබඳ සාක්ෂි වශයෙන් අවශ්‍ය ලියකියවිලි අයදුම්පත්‍රය සමඟ සපයා නොමැති බැවින් ගැටලුවට අදාළ අයදුම්පත ප්‍රතික්ෂේප කළ බවයි. කෙසේ වෙතත්, එම චක්‍රලේඛයේ විධිවිධානවල එවැනි අවශ්‍යතාවයක් දක්වා නොමැති බවත්, පෙත්සම්කරුගේ දරුවාට ඇතුළත් වීමේ සම්මුඛ පරීක්ෂණයට මුහුණ දීමට අවස්ථාව ලබා දුන්නේ නම්, අදාළ ස්ථාන මාරුව පිළිබඳ තොරතුරු තහවුරු කර ගත හැකිව තිබූ බවත් කොමිසම සඳහන් කළේය.

පෙත්සම්කරුගේ අයදුම්පත වැරදි ලෙස ප්‍රතික්ෂේප කර ඇති බව සොයා ගත් කොමිසම, වගඋත්තරකාර පාසල් දෙකෙන්ම සම්මුඛ පරීක්ෂණයට මුහුණ දීමට පෙත්සම්කරුගේ දරුවාට අවස්ථාව ලබා දෙන ලෙස නිර්දේශ කළේය. දරුවා සම්මුඛ පරීක්ෂණයේදී කඩඉම් ලකුණට වඩා අවශ්‍ය ලකුණු ලබා ගන්නේ නම්, පෙත්සම්කරු තෝරා ගන්නා පාසලට දරුවා ඇතුළත් කළ යුතු බවට කොමිසම නිර්දේශ කළේය.

- **රජයේ පාසලක 1 ශ්‍රේණියට ඇතුළත් වීම**
  (පැමිණිලි අංකය: HRC/300/19)

පෙත්සම්කරුගේ දරුවාට කොළඹ ප්‍රධාන පෙළේ ජාතික පාසලකට ඇතුළත් කරගැනීම අසාධාරණ ලෙස අහිමි කර ඇති බවට කරන ලද පැමිණිල්ලකට ප්‍රතිචාර දක්වමින් කොමිෂන් සභාව විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) වගන්තිය උල්ලංඝනය කර ඇති බව නිශ්චය කරන ලදී. පෙත්සම්කාරිය තම දරුවා වගඋත්තරකාර පාසලේ 1 ශ්‍රේණියට ඇතුළත් කර ගැනීම සඳහා අයදුම්පත ඉදිරිපත් කර ඇත්තේ 'ආසන්නතාවය' යන කාණ්ඩය යටතේය. සම්මුඛ පරීක්ෂණයෙන් පසුව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය ඇයගේ දරුවාගේ අයදුම්පත ප්‍රතික්ෂේප කර ඇත්තේ අදාළ නිවසේ අයිතිය සම්බන්ධයෙන් ගැටලු පවතින බව පවසමිනි. එම තීරණයට එරෙහිව පෙත්සම්කරු අධ්‍යාපන අමාත්‍යාංශයේ අභියාචනා මණ්ඩලයට අභියාචනයක් ඉදිරිපත් කර තිබුණි. ඇයගේ අභියාචනය පිළිගනිමින් පරීක්ෂණ මණ්ඩලය ඇයට ලකුණු 70.4ක් ප්‍රදානය කර ඇති අතර එමඟින් දරුවා කඩඉම් ලකුණ වන 57 ඉක්මවා ඇත. එසේ වුවද, වගඋත්තරකාර පාසල 1 ශ්‍රේණියට ඇතුළත් කිරීමේ අවසන් ලැයිස්තුවට පෙත්සම්කරුගේ දරුවා ඇතුළත් කිරීමට අපොහොසත් වී ඇත. කොමිසම හමුවේ තැබූ සාක්ෂි සලකා බැලූ කොමිෂන් සභාව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 (1) වගන්තිය යටතේ සහතික කර ඇති අයිතීන් උල්ලංඝනය වී ඇති බැවින් එම රජයේ පාසලේ අදාළ ශ්‍රේණියට දරුවා ඇතුළත් කිරීමට නිර්දේශ කළේය.

- **විනය නියෝගයක් බලාත්මක කිරීම**
  (පැමිණිලි අංක HRC/1859/15)

වගඋත්තරකරු තම පරිපාලන සහ විධායක රාජකාරි ඉටු කිරීමේදී නොසැලකිලිමත් ලෙස හැසිරීම මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) වගන්තිය යටතේ සහතික කර ඇති පෙත්සම්කරුගේ අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බව කොමිසම නිශ්චය කළේය. විනය පරීක්ෂණයකින් මෙම දුක්ගැනවිල්ල මතු වූ අතර, ඉන් අනතුරුව පෙත්සම්කරුට එරෙහිව වගඋත්තරකාර පාර්ශවය විසින් විනය නියෝගයක් නිකුත් කර ඇත. කෙසේ වෙතත්, ස්ථාපිත ක්‍රියා පටිපාටියට පටහැනිව, වරද සිදු කළ දිනයේ සිට නොව එය ක්‍රියාත්මක කරන ලද අතර, එහි ප්‍රතිඵලයක් ලෙස 2008-2011 වෙනුවට 2010-2013 දක්වා දඬුවම් කාලය ගණනය කරන ලදී. එසේ ස්ථාපිත ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම පෙත්සම්කරුට උසස්වීම් සහ එමගින් වැටුප් වර්ධක සඳහා ඇති

බහුවිධ අවස්ථා අහිමි කිරීමට හේතු වූ බව පෙත්සම්කරු කියා සිටියේය. විනය නියෝගය ක්‍රියාත්මක කිරීම වරදක් සිදු වූ දින සිට කළ යුතුව තිබූ බව පිළිගත් වගඋත්තරකරුවන්, නිවැරදි ක්‍රියා පටිපාටිය සම්බන්ධයෙන් වගඋත්තරකරු රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස් දැනටමත් ලබාගෙන ඇති බව කොමිසමට දන්වා සිටියේය. වගඋත්තරකරුගේ එම හැසිරීම ආයතන සංග්‍රහයේ II වෙළුමේ XLVIII පරිච්ඡේදයේ 23.9 වගන්තිය යටතේ නියම කර ඇති ක්‍රියා පටිපාටිය; රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ 2009.02.20 දිනැති කාර්ය පටිපාටික රීති අංක 1589/30 හි VIII පරිච්ඡේදයේ 186(2) වගන්තිය; සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 03/2015 චක්‍රලේඛයේ විධිවිධාන උල්ලංඝනය කිරීමක් බව කොමිෂන් සභාව විසින් නිශ්චය කරන ලදී. කොමිෂන් සභාව පෙත්සම්කරු "සහකාර කම්කරු කොමසාරිස්" තනතුරට උසස් කිරීමට සහ එම තනතුරේ උසස්වීම් ප්‍රදානය කිරීමට නිර්දේශ කළේය. ඒ අනුව පෙත්සම්කරුට වැටුප් සහ අනෙකුත් දීමනා ප්‍රදානය කරන ලෙස වැඩිදුරටත් නිර්දේශ කළේය. පෙත්සම්කරු විසින් ආයාචනා කළ පරිදි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(1)(ඇ) ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමක් කොමිෂන් සභාව විසින් නිශ්චය නොකළේය.

- **ස්ථිර ආබාධිත රාජ්‍ය සේවකයින්ගේ විශ්‍රාම වැටුප් ගණනය කිරීම (HRC/3397/17)**

1996.01.31 දින ශ්‍රී ලංකා මහ බැංකුවට එල්ල වූ ත්‍රස්ත ප්‍රහාරයෙන් සදාකාලික ආබාධිත තත්ත්වයට පත් වූ පෙත්සම්කරුවන් 20 දෙනෙකු විසින් කරන ලද පැමිණිල්ලකට ප්‍රතිචාර දක්වමින් කොමිෂන් සභාව විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 (1) වගන්තිය බලාත්මක කිරීමට අදාළව 1996.10.13 දිනැති අංක S/N/COM/C/1 චක්‍රලේඛය මගින් නියම කරන ලද විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය උල්ලංඝනය කර ඇති බව නිශ්චය කරන ලදී. එම ත්‍රස්තවාදී ප්‍රහාරයෙන් සදාකාලික ආබාධිත තත්ත්වයට පත් වූ පුද්ගලයන් 28 දෙනා අතරට කොමිසම හමුවේ පැමිණිලි කළ පෙත්සම්කරුවෝ ද වූහ. විශේෂ තත්ත්වයන් සැලකිල්ලට ගනිමින් වගඋත්තරකාර මහ බැංකුව විශේෂ විශ්‍රාම වැටුප් ව්‍යුහයක් හඳුන්වා දුන් අතර ඒ යටතේ යෝජිත යෝජනා ක්‍රම දෙකෙන් එකක් තෝරා ගැනීමට පෙත්සම්කරුවන්ට අවස්ථාවක් තිබුණි. පෙත්සම්කරුවන් 'D' ("ඈ") යෝජනා ක්‍රමය තෝරාගෙන තිබුණි. එකී යෝජනා ක්‍රමය යටතේ, පෙත්සම්කරුවන් විශ්‍රාම යන වයස අවුරුදු 55 ඉක්මවූ අය ලෙස උපකල්පිත ලෙස සලකනු ලැබූ අතර, පෙත්සම්කරුවන්ට වයස අවුරුදු 55 සම්පූර්ණ වන තෙක් ලැබිය යුතු මූලික වැටුප් වර්ධක සැලකිල්ලට ගනිමින් විශ්‍රාම වැටුප ගණනය කර ඇත. ත්‍රිවාර්ෂික වැටුප් වර්ධකය, ත්‍රිවාර්ෂික වැටුප් වර්ධකයෙන් ලැබිය යුතු වැටුප් වැඩිවීම, ඔවුන්ගේ වත්මන් වැටුප් පරිමාණයේ උපරිම වැටුප් වර්ධකයට ළඟා වූ පසු උසස්වීම්වලට අනුව වැටුප් වැඩිවීම වැනි ක්‍රියාකාරී සේවයේ නියුතු සේවකයන්ට ප්‍රදානය කරන ලද අනෙකුත් වර්ධක සහ විශේෂ දීමනා සැලකිල්ලට ගැනීමට එවැනි ගණනය කිරීම් අපොහොසත් වූ බව පෙත්සම්කරුවෝ චෝදනා කළහ. වගඋත්තරකරු තර්ක කළේ සක්‍රීය සේවයේ යෙදී සිටින සේවකයින්ට ලබා දෙන එවැනි විශේෂ දීමනා සහ වර්ධක සැලකිල්ලට

ගැනීමට නම්, පෙත්සම්කරු විසින් නිකුත් කරන ලද චක්‍රලේඛයේ 'C' ("ඇ") ලෙස දක්වා ඇති විශ්‍රාම වැටුප් ක්‍රමය තෝරා ගත යුතු බවයි.

සමරවීර එදිරිව මහජන බැංකුව සහ වෙනත් අය 2 SLR 2007 වැනි නඩු තීන්දුවලින් පිළිගෙන ඇති පරිදි ඔවුන්ගේ විශ්‍රාම වැටුප් ගණනය කළ යුත්තේ ස්වභාවිකව වසර 55 ක් සක්‍රීය සේවයේ යෙදී සිටින විට ගණනය කළ පරිදි බවට පෙත්සම්කරුවන්ට නීත්‍යානුකූල අපේක්ෂාවක් ඇති බව කොමිසම නිශ්චය කළේය. එම චක්‍රලේඛයට අනුව විශ්‍රාම වැටුප් ලබාගත් පුද්ගලයින්ට ඔවුන් කුමන යෝජනා ක්‍රමය සඳහා තෝරා ගත්තද ඔවුන්ට සමාන ප්‍රතිලාභ හිමිවිය යුතු බව කොමිසම වැඩිදුරටත් අදහස් දැක්වීය. සක්‍රීය සේවයේ නියුතු සේවකයන් වයස අවුරුදු 55 වන තෙක් ලබා ගන්නා සියලු දීමනා, වැටුප් වර්ධක සහ අනෙකුත් ප්‍රතිලාභ සැලකිල්ලට ගනිමින් පෙත්සම්කරුවන්ගේ විශ්‍රාම වැටුප් නැවත ගණනය කරන ලෙසත්, ගෙවිය යුතු විශ්‍රාම වැටුප සහ හිඟ වැටුප් ප්‍රදානය කිරීම මාස 4ක කාල සීමාවක් තුළ කළ යුතු බවට කොමිසම නිර්දේශ කළේය.

3.2.3 බහුවිධ අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම්

- පාසල් සිසුවෙකුට ලබා දුන් ශාරීරික දඬුවම්
  (පැමිණිලි අංකය: HRC/AP/535/2017)

අනුරාධපුර රබෑව ප්‍රදේශයේ ප්‍රසිද්ධ පාසලක විදුහල්පතිවරයා සහ ගුරුවරයෙකු විසින් ශිෂ්‍යයෙකුට විනය අරමුණු සඳහා ශාරීරික දඬුවම් ලබාදීම සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 සහ 12 (1) වගන්ති උල්ලංඝනය කිරීමක් මානව හිමිකම් කොමිසම විසින් අනාවරණය කර ගන්නා ලදී. වින්දිත සිසුවා නුසුදුසු නිල ඇඳුමකින් සහ වැඩුණු රැවුලකින් පාසැලට පැමිණි බවත් පාසල් නිල ඇඳුම සහ ශරීර පෙනුම පිළිබඳ උපදෙස්වලට අවනත නොවීම හේතුවෙන් වින්දිතයාට වේවැල් පහරක් එල්ල කළ බවට විදුහල්පතිවරයාට චෝදනා එල්ල විය. අසභ්‍ය වචන භාවිත කරමින් සිසුවාට පහර දෙන බවට තර්ජනය කළ බවට ගුරුවරයාට චෝදනා එල්ල විය. පැමිණිල්ල විසින් චෝදනා කරන ලද කරුණු සනාථ කරන ඇසින් දුටු සාක්ෂිකරුවන් තිදෙනෙකුගේ සාක්ෂි කොමිසම විසින් සැලකිල්ලට ගන්නා ලදී. තවද, වින්දිත සිසුවා පාසල් කාලය තුළ භාරකරුවෙකු නොමැතිව අසල පිහිටි රූපලාවන්‍යාගාරයකින් රැවුල කපා ගැනීම සඳහා පාසලෙන් පිටත් කර යවා ඇත. අදාළ ගුරුවරයා සහ විදුහල්පතිවරයා සිසුන්ට විනය කටයුතු සඳහා පවා ශාරීරික දඬුවම් ලබාදීම තහනම් කරන අංක 12/2016 චක්‍රලේඛය උල්ලංඝනය කරමින් ක්‍රියා කර ඇති බව සොයා ගත් කොමිෂන් සභාව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 සහ 12(1) වගන්ති උල්ලංඝණය කර ඇති බව නිගමනය කළේය. ගුරුවරුන් තම සිසුන්ගේ ආදේශක මාපියන් වන අතර අංක 37/2012 චක්‍රලේඛය මගින් නියම කර ඇති පරිදි ඔවුන් හැසිරිය යුතු බව කොමිෂන් සභාව සඳහන් කළේය. 1 වන සහ 2 වැනි වගඋත්තරකරුවන්ට එරෙහිව අධ්‍යාපන අමාත්‍යාංශය මගින් විනය

ක්‍රියාමාර්ග ගන්නා ලෙස කොමිසම නිර්දේශ කළ අතර ඉහත චක්‍රලේඛවල අන්තර්ගතය පිළිබඳව පාසල්වල විදුහල්පතිවරුන් සහ ගුරුවරුන් දැනුවත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස අමාත්‍යාංශ ලේකම්වරයාට තවදුරටත් නිර්දේශ කළේය. අංක 12/2016 චක්‍රලේඛය කායික දඬුවම් පමණක් සැලකිල්ලට ගන්නා බැවින් එම චක්‍රලේඛයෙන් දක්වා ඇති ක්‍රියා පටිපාටියට සිසුන්ගේ මානසික යහපැවැත්මට බලපාන දඬුවම් ඇතුළත් කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශය පියවර ගත යුතු බව ද නිර්දේශ කරන ලදී.

- **නිසි පරීක්ෂණයකින් තොරව අත්තනෝමතික ලෙස පුද්ගලයෙකු අත්අඩංගුවට ගැනීම (පැමිණිලි අංක HRC/AP/220/14)**

විකිණීමේ අරමුණින් කංසා සන්තකයේ තබා ගැනීම සම්බන්ධයෙන් නිසි පරීක්ෂණයක් නොපවත්වා අනුරාධපුර පොලිසිය විසින් පෙත්සම්කරු අත්අඩංගුවට ගත් අවස්ථාවේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) සහ 13 වැනි වගන්ති යටතේ සහතික කර ඇති පෙත්සම්කරුගේ මූලික අයිතිවාසිකම් කඩ වී ඇති බව කොමිසම නිගමනය කළේය. පොලිසියේ පෞද්ගලික ඔත්තුකරුවෙකුගෙන් ලද තොරතුරක් මත පරීක්ෂා කිරීමේදී චින්දිත පුද්ගලයාගේ ත්‍රිරෝද රථයේ තිබී කංසා සොයා ගැනීමෙන් අනතුරුව මෙම අත්අඩංගුවට ගැනීම සිදුකළ බව වගඋත්තරකරුවන් කියා සිටියේය. චින්දිත පුද්ගලයා කියා සිටියේ පොලිසිය විසින් සොයා ගන්නා ලද කංසා තොගය ඔහුව කොටු කර ගැනීමේ අරමුණින් ඉහත කී පෞද්ගලික ඔත්තුකරුගේ උපාය දූතයින් විසින් සකස් කළ එකක් බවයි. චින්දිතයා අත්අඩංගුවට ගත් දිනයේ චින්දිතයාට මත්ද්‍රව්‍ය මිලදී ගන්නා ලෙස ඉල්ලා හිරිහැර කළ බව කියන තුන්වන පාර්ශවයක් සම්බන්ධයෙන් වාර්තා කිරීමට රථවාහන පොලිස් නිලධාරියෙකු සොයා චින්දිතයා ගොස් ඇති අතර තුන්වන පාර්ශවය (පසුව ඔහු තැරැව්කරුවා ලෙස හඳුනාගෙන ඇත) විසින් චින්දිතයාගේ ත්‍රිරෝද රථයේ යම් භාණ්ඩයක් තබනු දුටු බවට ඇසින් දුටු සාක්ෂිකරුවන් දෙදෙනෙක් සාක්ෂි දුන්හ. ප්‍රශ්නගත අත්අඩංගුවට ගැනීම් පිළිබඳ අක්‍රමිකතා සම්බන්ධයෙන් වැටලීමට සම්බන්ධ අනෙකුත් පොලිස් නිලධාරීන්ගෙන් (එම ස්ථානයේ සිටි රථවාහන පොලිස් නිලධාරියා වැනි) ප්‍රකාශ ලැබී තිබියදීත්, 6 වැනි වගඋත්තරකරු වන මූලස්ථාන පොලිස් පරීක්ෂකවරයා ඒ ගැන වැඩිදුර සොයා බැලීමකින් තොරව චින්දිතයාට එරෙහිව මහේස්ත්‍රාත් උසාවියේ චෝදනා ගොනු කර ඇති බව කොමිසම සඳහන් කළේය. එම පැමිණිල්ල පොලිසිය නොමග යැවීමේ අරමුණින් කර ඇති බවට හෙළිවීම නිසා පසුව පොලිසිය විසින් එම චෝදනා ඉල්ලා අස්කරගෙන ඇති අතර නඩුව නිෂ්ප්‍රභා කර ඇත. චින්දිතයාට වන්දි වශයෙන් රුපියල් 5000/- බැගින් ගෙවන ලෙස 1 වැනි සහ 6 වැනි වගඋත්තරකරුවන්ට කොමිසම නිර්දේශ කළේය. තවද, වගඋත්තරකරුවන්ට එරෙහිව සුදුසු විනය ක්‍රියාමාර්ග ගැනීම සඳහා එම නිර්දේශයේ පිටපතක් පොලිස්පතිවරයාට සහ ජාතික පොලිස් කොමිසමේ සභාපතිවරයාට යැවීමට කොමිසම නිර්දේශ කළේය.

- **නාවික නිලධාරියෙකු උසස් කිරීම (HRC/2314/15)**

පෙත්සම්කරුට උසස්වීම් ලබා දීම අසාධාරණ ලෙස හා ද්වේශ සහගත ලෙස වළක්වා ඇති බවට කරන ලද පැමිණිල්ලකට ප්‍රතිචාර දක්වමින් කොමිසම විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) සහ 14(1)(g) වගන්ති උල්ලංඝණය කර ඇති බව නිශ්චය කරන ලදී. තම පැමිණිල්ල ගොනු කරන අවස්ථාවේ වසර 30 ක සක්‍රීය සේවා පළපුරුද්දක් ඇති නාවික හමුදා නිලධාරියෙකු වූ පෙත්සම්කරු 2015.02.07. දින පැමිණිල්ල ගොනු කරන අවස්ථාවේදී, ජ්‍යෙෂ්ඨත්වයෙන් ඔහුට වඩා කණිෂ්ඨ නිලධාරීන්ට එම පුරප්පාඩුවටම උසස්වීම් ලබා දී තිබියදීත් තමන් කොමදෝරු තනතුරට උසස් නොකිරීම හේතුවෙන් තම මූලික අයිතිවාසිකම් කඩ වී ඇති බවට චෝදනා කළේය. වගඋත්තරකරුවන් කියා සිටියේ 2015 ජූලි මාසයේදී පෙත්සම්කරු උසස්වීම සඳහා අවශ්‍ය ලකුණු ලබා ගත්තද, යම් නිලධාරියෙකුට අධිකරණයක් හමුවේ නඩු පවරා ඇත්නම් කිසිදු උසස්වීමක් ලබා නොදීම නාවික හමුදාවේ සිරිත බවයි. එහි ප්‍රතිඵලයක් ලෙස, අධිකරණයේ විභාග වෙමින් පවතින නඩුවකට අදාළව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් කරන ලද පරීක්ෂණයකට පෙත්සම්කරු සම්බන්ධ වී සිටි බැවින් ඔහුට උසස්වීමක් නොලැබිණි. සත්‍ය වශයෙන්ම, 2015 පෙබරවාරි මාසයේදී, පෙත්සම්කරු එක්සත් ජනපදයේ පුහුණු වැඩසටහනකට සහභාගී වෙමින් සිටියදී, සිද්ධිය සම්බන්ධයෙන් ඔහුගේ ප්‍රකාශය ලබා ගැනීම සඳහා වැඩසටහන අතරමැද නැවත ශ්‍රී ලංකාවට පැමිණෙන ලෙස දන්වා වැඩසටහනට ආපසු යාමට ඉඩ ලබා දී නොමැත. වගඋත්තරකරුවන් කියා සිටියේ පෙත්සම්කරුට උසස්වීම ලබාදීමේ හැකියාව සම්බන්ධයෙන් නීතිපතිවරයාගෙන් සහ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ලබාගෙන ඇතත් තවමත් උපදෙස් ලැබී නොමැති බවයි. තමාට එරෙහිව කිසියම් නඩු විභාගයක් පවතී යන්න පෙත්සම්කරු ප්‍රතික්ෂේප කළ අතර වගඋත්තරකරුවන්ගේ හැසිරීම නිසා විදේශ පුහුණු වැඩසටහන් ද තමාට අහිමි වී ඇති බවට වැඩිදුරටත් චෝදනා කළේය. විමර්ශනයේදී, යුද සමයේදී ඔවුන් ක්ෂේත්‍රය තුළ සිදු කළ අසාමාන්‍ය සේවය අගයමින් 2009 දක්වා දිවෙන නිලධාරීන් 71 දෙනෙකුගේ නිර්දේශිත උසස්වීම් ලැයිස්තුවට පෙත්සම්කරුගේ නම ඇතුළත් කර ඇති බව ද අනාවරණය විය.

2009 වසරේ සිට පෙත්සම්කරුගේ මූලික අයිතිවාසිකම් අඛණ්ඩව උල්ලංඝනය වී ඇති බවට කොමිසම නිශ්චය කර ඇත. 2009 සිට 2015 දක්වා කාලය තුළ පෙත්සම්කරුට එරෙහිව කිසිදු නඩු විභාගයක් නොතිබූ බවත්, පෙත්සම්කරු විසින් කරන ලද අභියාචනා වගඋත්තරකරුවන් විසින් විභාග කර නොතිබූ බවත් එහි සඳහන් විය. ඒ අනුව, 2009 වසරේ නිර්දේශිත ක්ෂේත්‍ර උසස්වීම් ලැයිස්තුව තහවුරු කිරීමෙන් පසු පෙත්සම්කරුට ඔහුගේ උසස්වීම් සහ ඊට අනුරූප වැටුප් සහ අනෙකුත් දීමනා ප්‍රදානය කරන ලෙස කොමිසම නිර්දේශ කළේය. පෙත්සම්කරුගේ ජ්‍යෙෂ්ඨත්වය සහ උසස්වීම් අසාධාරණ ලෙස සහ හිතාමතා අහිමි කළ නිලධාරීන්ට සහ ලිපි ලේඛන අස්ථානගත කිරීමට වගකිව යුතු පාර්ශ්වයන්ට සහ නාවික හමුදාවට අපකීර්තියක් ගෙන එමින් හිතාමතාම ක්‍රියා කළ අයට එරෙහිව නාවික හමුදා පනතට අනුව නීතිමය ක්‍රියාමාර්ග ගන්නා ලෙස

ද වගඋත්තරකරුවන්ට නියම කළේය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) සහ 14(1)(g) වගන්ති යටතේ සහතික කර ඇති පෙත්සම්කරුගේ මූලික අයිතිවාසිකම් කඩ කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය ඕනෑම පියවරක් ගන්නා ලෙස ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව තවදුරටත් ආරක්ෂක අමාත්‍යාංශයට නිර්දේශයක් කළේය.

3.3. ස්වයං සිද්ධි විමර්ශන (Suo motu)

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 14 වගන්තිය අනුව කොමිෂන් සභාව තම ස්වයං මැදිහත් වීම යටතේ Suo motu ගැටලු කිහිපයකට මැදිහත් විය. බොහෝ විට, මාධ්‍ය අධීක්ෂණය සහ පුද්ගලයන් හෝ සංවිධාන විසින් එවැනි ගැටලු කොමිෂන් සභාවේ අවධානයට යොමු කිරීම තුළින් මැදිහත් විය යුතු ගැටලු හඳුනා ගැනේ. මෙම ක්‍රියාකාරකම මගින් විමර්ශන සහ පරීක්ෂණ අංශය, පර්යේෂණ සහ අධීක්ෂණ අංශය සහ ශ්‍රී ලංකා මානව හිමිකම් සභාවෙහි ප්‍රාදේශීය කාර්යාල අතර සමීප සහයෝගිතාවයක් දක්නට ලැබේ. සමස්තයක් වශයෙන්, කොමිෂන් සභාව 2020 කාලය තුළ විවිධ සිද්ධීන් සම්බන්ධයෙන් ස්වයං සිද්ධි පරීක්ෂණ 49ක් දියත් කරන ලදී (සම්පූර්ණ ස්වයං සිද්ධි පරීක්ෂණ ලැයිස්තුවක් සඳහා 3 වන උපග්‍රන්ථය බලන්න).

- **ආගම් පදනම මත රජයේ පාසලකට ඇතුළත් වීම ප්‍රතික්ෂේප කිරීම (HRC/SUO/MOTU/01/20)**

පියා හින්දු භක්තිකයෙකු වීම හේතුවෙන් 5 වසර ශිෂ්‍යත්ව විභාගයේ නියමිත ලකුණු ලබාගෙන තිබියදී ජාතික පාසලකට දරුවෙකු ඇතුළත් කර නොගැනීම සම්බන්ධයෙන් පුවත්පතක පළ වූ ලිපියකට අනුව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පරීක්ෂණයක් ආරම්භ කළේය. මානව හිමිකම් කඩකරන්නන්ට එරෙහිව අවශ්‍ය පරිපාලනමය ක්‍රියාමාර්ග ගන්නා ලෙසත්, ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳ විස්තර සහිත වාර්තාවක් කොමිසම වෙත ඉදිරිපත් කරන ලෙසත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ලේකම්වරයාට නියෝග කෙරිණි.

- **ක්ෂුද්‍ර මූල්‍ය ණය යෝජනා ක්‍රමවලට ගොදුරු වූවන් විසින් සිදු කරන ලද විරෝධතාව (HRC/SUO/MOTU/03/20)**

14(1)(ආ) වගන්තිය යටතේ වූ සාමකාමී විරෝධතා දැක්වීමේ අයිතිය ක්ෂුද්‍ර ණය යෝජනා ක්‍රමවලින් පීඩාවට පත් වූ පුද්ගලයන්ගේ මානව හිමිකම් උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් කොමිසම සිය මාධ්‍ය නිරීක්ෂණ ක්‍රියාකාරකම් හරහා කොමිසමේ අවධානයට යොමු වූ අවස්ථාවේ ස්වයං සිද්ධි විමර්ශනයක් ආරම්භ කළේය. කොමිසම මෙම විමර්ශනය 2020 අවසානය දක්වා පවත්වාගෙන ගියේය.

- **පොලිස් අත්අඩංගුවේ සිටි සැකකරුවෙකුගේ සැක සහිත මරණය (HRC/SUO/MOTU/19/2020)**

2020 ඔක්තෝබර් මාසයේදී පොලිස් අත්අඩංගුවේ සිටියදී ඝාතනයට ලක්වූ සමරසිංහ ආරච්චිගේ මධුෂ් ලක්ෂිත හෙවත් 'මාකඳුරේ මධුෂ්'ගේ සැක කටයුතු මරණය සම්බන්ධයෙන් පරීක්ෂණයක් ආරම්භ කෙරුණි. මධුෂ් ලක්ෂිත ඩුබායි සිට පිටුවහල් කර, පසුව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ පරීක්ෂණ සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ රඳවාගෙන සිටියේය. ඔහුගේ මරණයට දින හතරකට පෙර වැඩිදුර විමර්ශන සඳහා කොළඹ අපරාධ කොට්ඨාශය වෙත ගෙන යන ලදී. මධුෂ් ලක්ෂිතගේ ජීවිතයට තර්ජනයක් එල්ල වී ඇති බවට විවිධ මූලාශ්‍ර මගින් කොමිසමට දන්වා තිබූ අතර, ඒ අනුව මේ පිළිබඳව පුළුල් ලෙස සොයා බැලීමට කොමිෂන් සභාව වහා පියවර ගන්නා ලෙස දන්වා සිටියේය. වින්දිතයාගේ ජීවිතයට එල්ල විය හැකි තර්ජන පිළිබඳව කොමිසම කොළඹ අපරාධ කොට්ඨාශයට දැනුම් දුන් අතර ඔහු රඳවා තබා ගැනීමේ නියෝගයේ පිටපතක් කොමිසම වෙත එවන ලෙස ඉල්ලා සිටියේය. ඉන් දින දෙකකට පසු පොලිසිය සහ තවත් පාර්ශවයක් අතර ඇති වූ බව කියන වෙඩි හුවමාරුවකදී වින්දිතයා මාරාන්තික තුවාල ලබා ඇත. වින්දිතයාගේ මරණයෙන් පසු කොමිසම විසින් කොළඹ අපරාධ කොට්ඨාශයේ අධ්‍යක්ෂවරයා සහ ස්ථානභාර නිලධාරියා පරීක්ෂණයක් සඳහා කැඳවූ අතර, ඔවුන් ඊට අවනත නොවීය. මේ සම්බන්ධයෙන් පොලිස්පතිවරයාගෙන් කොමිසම පුළුල් වාර්තාවක් ඉල්ලා සිටියේය. මරණය සම්බන්ධයෙන් පරීක්ෂණ තවදුරටත් ක්‍රියාත්මකයි.

- **ගල්කිස්ස වෙරළ තීරයේ වෙරළ පෝෂණ වැඩසටහන (HRC/SUO/MOTU/06/20)**

විද්‍යුත් මාධ්‍යවල පළ වූ තොරතුරුවලට අනුව ගල්කිස්ස වෙරළ තීරයේ වෙරළ පෝෂණ වැඩසටහනේ පාරිසරික බලපෑම පිළිබඳව පරීක්ෂණයක් ආරම්භ කරන ලදී. වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව, රත්මලාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය, මධ්‍යම පරිසර අධිකාරිය, දෙහිවල සහ ගල්කිස්ස මහ නගර සභාව, නාගරික සංවර්ධන අධිකාරිය සහ ජාතික ජලජ සම්පත් සහ සංවර්ධන ආයතනය යන බලධාරීන්ගෙන් ප්‍රකාශන කොමිසම ඉල්ලා සිටියේය,

- **COVID-19 සහන අරමුදල සඳහා දායක මුදල් ලෙස සේවක වැටුප් අඩු කිරීම (HRC/SUO/MOTU/11/20)**

රජය විසින් පිහිටුවන ලද කෝවිඩ්-19 සහන අරමුදලට සිය දෛනික හෝ මාසික වැටුපෙන් යම් ප්‍රමාණයක් ස්වේච්ඡාවෙන් දායක කිරීමට සියලුම රාජ්‍ය අංශයේ

සේවකයින්ට අවස්ථාව සලසා දී ඇත. විවිධ දෙපාර්තමේන්තු සහ ආයතන සිය කාර්යමණ්ඩලය සමග ලිපි හුවමාරු කිරීමේදී සහන අරමුදලට එවැනි දායකත්වයක් ලබා දීම අනිවාර්ය බව වැරදි ලෙස සඳහන් කර ඇති බව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව නිරීක්ෂණය කළේය. අරමුදලට ලැබෙන දායකත්වය සම්බන්ධයෙන් ඇතැම් සේවකයන්ට සෘජු හෝ වක්‍ර බියවැද්දීම්වලට මුහුණ දීමට සිදු වූ බව ද එහි නිරීක්ෂණය විය. මෙය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 වැනි වගන්තිය උල්ලංඝනය කිරීමක් බැවින් වඩාත් දූරදර්ශී ක්‍රියාමාර්ගය වන්නේ මේ කරුණ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු හෝ ආයතන ප්‍රධානීන්ගේ අභිමතය පරිදි තීරණය ගැනීමට ඉඩ නොතබා, සේවකයන් සමඟ සෘජුව අදහස් හුවමාරු කර ඔවුන්ගේ කැමැත්තට දැඩිව ගරු කිරීම බව කොමිසම විසින් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ලිඛිතව නිර්දේශයක් කළේය.

- **පොලිස් නිලධාරීන් විසින් බාල වයස්කරුවෙකුට පහරදීම (HRC/SUO/MOTU/12/20)**

2020 මැයි මාසයේදී අලුත්ගම 'අඹගහ හන්දිය' මාර්ග බාධකයේදී 15 හැවිරිදි මානසික ආබාධිත දරුවෙකුට පොලිස් නිලධාරීන් පහරදීමේ සිද්ධිය සම්බන්ධයෙන් පළ වූ පුවත්වලට අනුව පරීක්ෂණයක් ආරම්භ කරන ලදී. සිද්ධිය සම්බන්ධයෙන් සවිස්තර වාර්තාවක් ලබාදෙන ලෙසට කොමිසම කළුතර කොට්ඨාශයේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරයා වෙත ලිපියක් යොමු කළේය. එය වෝහාරික වෛද්‍ය හා විෂ විද්‍යා ආයතනයේ ප්‍රධාන වෝහාරික වෛද්‍ය නිලධාරීවරයා වෙත යොමු කිරීමට ද අවශ්‍ය පියවර ගන්නා ලදී. විත්දිතයාගේ සිරුරේ නිරීක්ෂණය වූ තුවාල සහ සීරීම් වධහිංසා පැමිණවීමේ චෝදනාවලට අනුකූල බව වෛද්‍ය වාර්තාවේ සඳහන් විය. පනතේ 20(3) වගන්තිය යටතේ පැවරී ඇති බලය අනුව අලුත්ගම පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා තෙවරක් කොමිසමට කැඳවනු ලැබුවද, සෑම අවස්ථාවකදීම කොමිසම හමුවේ පෙනී සිටීමට අපොහොසත් විය. සිද්ධිය සම්බන්ධයෙන් පරීක්ෂණ තවදුරටත් ක්‍රියාත්මකයි.

- **මාධ්‍යවේදියෙකුගේ නිවසින් වෘත්තීය උපකරණ සෙවීම සහ අල්ලා ගැනීම (HRC/SUO/MOTU/13/20)**

2020 ජුනි මාසයේදී මාධ්‍යවේදියෙකුගේ නිවසින් ලැප්ටොප් පරිගණකයක් සෝදිසි කිරීම සහ අත්පත් කර ගැනීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් තමන්ගේම පරීක්ෂණයක් දියත් කරන ලද අතර, එය කොමිසමේ මාධ්‍ය නිරීක්ෂණ ක්‍රියාකාරකම් හරහා අවධානයට ලක් විය. එම විමර්ශනයට අදාළව පැහැදිලි කිරීමේ වාර්තාවක් කොමිසම වෙත ඉදිරිපත් කරන ලෙස කොමිසම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා සිටියේය. ජනාධිපතිවරණය ආසන්නයේම ස්විට්සර්ලන්ත තානාපති කාර්යාලයේ සේවිකාවක් පැහැරගෙන ගොස් ඇතැයි කියන සිද්ධියට අදාළව

මෙම විමර්ශනය සිදුකළ බවත්, අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 2019 ප්‍රකාරව කොළඹ මහේස්ත්‍රාත්වරයා විසින් නිකුත් කරන ලද අධිකරණ නියෝගයකට අනුව ලැප්ටොප් පරිගණකය සොයා ගෙන ඇති බවත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා කොමිසමට දැනුම් දුන්නේය.

- **වෘත්තීය සගයකු විසින් රාජ්‍ය අංශයේ සේවිකාවකට පහරදීම (HRC/SUO/MOTU/21/20)**

මාර්ග සංවර්ධන අධිකාරියේ (RDA) පිරිමි නිලධාරියෙකු විසින් නිලධාරිනියකට අඩත්තේට්ටම් කරන ලද බවට වීඩියෝවක් සමාජ මාධ්‍ය සහ දිනපතා ප්‍රවෘත්ති ප්‍රකාශය හරහා කොමිසමේ අවධානයට යොමු විය. මානව හිමිකම් කොමිසම මාර්ග සංවර්ධන අධිකාරියෙන් ඉල්ලා සිටියේ සිද්ධිය සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා පුළුල් වාර්තාවක් ඉදිරිපත් කරන ලෙසයි. ඒ අනුව වාර්තාව කොමිසමට ඉදිරිපත් කරන ලදී.

3.4 සභාපති කාර්යාලයේ මැදිහත්වීම්

සභාපති ධූරයට පත්වීමෙන් පසු පෙර වසරවල මෙන්ම, විමර්ශන හා පරීක්ෂණ ක්‍රියාවලියට අදාළ ප්‍රමාදයන් සහ වෙනත් ගැටලු හේතුවෙන් පීඩාවට පත් පැමිණිලිකරුවන්ට සහන සැලසීමට සභාපතිනිය මැදිහත් විය.

තවද, උචිත යැයි සැලකෙන අවස්ථාවන්හිදී බලධාරීන් සමඟ සෘජු මැදිහත්වීම් සභාපතිවරයා විසින් සිදු කරනු ලැබේ. සාමාන්‍යයෙන්, පරිපාලනමය ක්‍රියාමාර්ග හෝ අකර්මන්‍යතාවය හරහා ආර්ථික හා සමාජීය අයිතීන් බරපතල ලෙස උල්ලංඝනය කිරීම් පිළිබඳව ලැබෙන පැමිණිලි සම්බන්ධයෙන් එවැනි සෘජු මැදිහත්වීම් සිදු කෙරේ. ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ ජීවනෝපාය තීරණාත්මක ගැටලුවක් වන බැවින් විශ්‍රාම වැටුප් නොගෙවීම පිළිබඳව විශ්‍රාමිකයින්ගේ පැමිණිලි මේ සඳහා නිදසුනක් ලෙස ගත හැකිය.

4 වන පරිච්ඡේදය:
පර්යේෂණ හා අධීක්ෂණ

4.1. තේමාත්මක අනු කමිටු

4.2. ජාතික බන්ධනාගාර අධ්‍යයනය

4.3. නිර්දේශ ක්‍රියාත්මක නොවීම නියාමනය කිරීම

4.4. වෙනත් නියාමන කටයුතු

4.4.1. රැඳවුම් හා රැකබලා ගන්නා ස්ථාන නියාමනය කිරීම

4.4.2. පාර්ලිමේන්තු මැතිවරණය - 2020

4.4.3. වෙනත් නියාමන කටයුතු

පර්යේෂණ සහ අධීක්ෂණ

4.1. තේමාත්මක අනු කමිටු

සුවිශේෂී තේමාත්මක කරුණු පිළිබඳව අනු කමිටු 9 ක් 2016 වසරේ දී ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පත් කරන ලදී. 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 10 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකා රජයට කළ යුතු ප්‍රතිපත්තිමය මැදිහත්වීම් පිළිබඳ කොමිෂන් සභාව වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා අනුකමිටු විසින් එක් එක් තේමාවට අදාළ නීති සම්පාදනය, ප්‍රතිපත්ති සහ නිල භාවිතයන් සමාලෝචනය කිරීමට අපේක්ෂා කරන ලදී. තවද, අදාළ ගැටලු සම්බන්ධයෙන් අවශ්‍ය ප්‍රතිපත්ති සහ ප්‍රායෝගික මැදිහත්වීම් පිළිබඳව කොමිෂන් සභාවට උපදෙස් දීමට අනුකමිටු බලාපොරොත්තු විය. එම අනු කමිටු වන්නේ;

1. ආබාධිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ අනු කමිටුව
2. අධ්‍යාපන ප්‍රතිපත්තිය (මානව හිමිකම් දෘෂ්ටියෙන්) පිළිබඳ අනු කමිටුව
3. LGBTIQ පුද්ගලයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ අනු කමිටුව
4. වැව්ලි සේවක අයිතිවාසිකම් පිළිබඳ අනු කමිටුව
5. වධහිංසා හා අත්අඩංගුවේ දී සිදුවන උල්ලංඝනයන් වැළැක්වීම පිළිබඳ අනු කමිටුව
6. ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අනු කමිටුව
7. වැඩිහිටි අයිතිවාසිකම් පිළිබඳ අනු කමිටුව
8. ආර්ථික, සමාජ හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ අනු කමිටුව
9. සංක්‍රමණික සේවක අයිතිවාසිකම් පිළිබඳ අනු කමිටුව

අනුකමිටු සාමාජිකත්වය විශේෂඥයින් සහ සිවිල් සමාජ ක්‍රියාකාරීන්ගෙන් සමන්විත වේ. සෑම කමිටුවකම එක් කොමසාරිස්වරුයෙකු හෝ වැඩි දෙනෙකු සභාපතිත්වය දරන අතර ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා කාර්ය මණ්ඩල සාමාජිකයින් එක් එක් අනු කමිටුවේ ලේකම්වරුන් ලෙස කටයුතු කරයි.

2020 කාලය තුළ, වසංගතය හේතුවෙන් තේමාත්මක ගැටලු සාකච්ඡා කිරීමට අනුකමිටු සාමාජිකයින්ට රැස්විය නොහැකි විය. කෙසේ වෙතත්, ඉහත තේමාත්මක ක්ෂේත්‍රවලට අදාළ කරුණු සම්බන්ධයෙන් කොමිෂන් සභාවට එකී සාමාජිකයන් සහය විය. ඒ අනුව, විදේශ අමාත්‍යාංශය, විදේශ රැකියා ප්‍රවර්ධන අමාත්‍යාංශය සහ කම්කරු අමාත්‍යාංශය සමඟ ගමනාන්ත රටවල සිටින ශ්‍රී ලාංකික සංක්‍රමණික ශ්‍රමිකයන්ගේ සහ කෝවිඩ්-19 වසංගතය අතරතුර දැනට ශ්‍රී ලංකාවේ සේවය කරන විදේශ සංක්‍රමණික ශ්‍රමිකයන්ගේ ආරක්ෂාව සහ යහපැවැත්ම සම්බන්ධයෙන් කළ යුතු මැදිහත්වීම්

පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා පැවති සාකච්ඡාවට අනුකමිටු සාමාජිකයින් සහභාගී විය. කොවිඩ් 19 වසංගතය හේතුවෙන් පාසල් දරුවන්ගේ, විශේෂයෙන්ම 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයට, සාමාන්‍ය පෙළ විභාගයට සහ උසස් පෙළ විභාගය සඳහා පෙනී සිටින දරුවන්ගේ අධ්‍යාපන කටයුතු අඩාල වීම සහ අධ්‍යාපනය අඩාල වීමට ප්‍රතිචාර වශයෙන් පෞද්ගලික අංශය විසින් හඳුන්වා දුන් මාර්ගගත ඉගැන්වීම් ක්‍රියාකාරකම් සමාලෝචනය කිරීම පිළිබඳව කොමිෂන් සභාව විසින් සිදු කරන ලද තක්සේරුවට සාමාජිකයින් ද සම්බන්ධ විය.

4.2. ජාතික බන්ධනාගාර අධ්‍යයනය



රැඳවුම් කොන්දේසි අධීක්ෂණය කිරීම සහ එම තත්ත්වයන් වැඩිදියුණු කිරීම පිණිස නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා (පනතේ 28(2) වගන්තිය) ඕනෑම රැඳවුම් ස්ථානයක් පරීක්ෂා කිරීමට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලය අනුව කොමිෂන් සභාව ශ්‍රී ලංකාවේ බන්ධනාගාර පිළිබඳ පළමු ජාතික අධ්‍යයනය 2018 දී ආරම්භ කළේ ය.

අධ්‍යයනයෙන් අදහස් කළේ මූලික වශයෙන් සිරකරුවන්ට සැළකීම සඳහා එක්සත් ජාතීන්ගේ සම්මත අවම රීති (නෙල්සන් මැන්ඩෙලා නීති) වලට අනුකූලව සිරකරුවන්ට සැළකීම සහ තත්වයන් තක්සේරු කිරීම සහ ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතීන්ට අනුකූලත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීමයි. වාර්තාව සඳහා තොරතුරු සහ දත්ත රැස් කිරීම සඳහා පර්යේෂක කණ්ඩායම ශ්‍රී ලංකාවේ බන්ධනාගාර 20කට ගොස් ඇත.

අධ්‍යයනය පහත සඳහන් ප්‍රධාන ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කර ඇත: සැළකීම සහ තත්වයන්, පුනරුත්ථාපන ක්‍රියාවලිය, සිරකරුවන්ගේ විශේෂ කාණ්ඩය, බන්ධනාගාර කළමනාකරණය, අපරාධ යුක්ති ක්‍රියාවලිය, අඛණ්ඩව සිදුවන උල්ලංඝනයන් සහ සිරගත කිරීම සඳහා විකල්ප අධ්‍යයනයේ ප්‍රධාන සොයාගැනීම් තුන නම්:

- ශ්‍රී ලංකාවේ බන්ධනාගාර පද්ධතිය අධික තදබදයෙන් යුක්තය හා සම්පත් වලින් ඌණ ය.;
- එය පුනරුත්තාපනය කිරීමේ ආකෘතිය/ නිවැරදි කිරීමේ ක්‍රියාවලියට වඩා දඬුවම් කිරීමේ අංගයන් වැඩිවීම/ නිවැරදි කිරීම් අවධාරණය කිරීම;
- නිලධාරීන් අඩුපාඩු හොඳින් දන්නා අතර වෙනසට කැමතිබව.

මෙම අධ්‍යයනයේ සොයාගැනීම් සහ නිර්දේශ ශ්‍රී ලංකාවේ බන්ධනාගාර, දණ්ඩන සහ විශෝධන ක්‍රමය මෙන්ම පුළුල් අපරාධ යුක්ති විනිශ්චය පද්ධතිය පිළිබඳ අවබෝධයේ පවතින පරතරය ආමන්ත්‍රණය කරන අතර බන්ධනාගාර පද්ධතිය පිළිබඳ සාමාන්‍ය අවබෝධය ඉහළ නංවමින් රාමුවේ ඇති අඩුපාඩු ද ඉස්මතු කරයි. සිරකරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සහ නිවැරදි කිරීමේ ක්‍රමය ශක්තිමත් කිරීම සඳහා වඩා හොඳ භාවිතයන් සහ ප්‍රතිපත්ති සැකසීමට සහ ක්‍රියාත්මක කිරීමට මෙමගින් අපේක්ෂා කෙරේ.

අධ්‍යයනයේදී හඳුනාගත් අවධානයට ලක්විය යුතු ක්ෂේත්‍රවලට අදාළ නිර්දේශ ප්‍රධාන වශයෙන් තෙආකාරය:

(1) බන්ධනාගාරවල භෞතික තත්ත්වය සහ පරිපාලනය වැඩිදියුණු කිරීම
(2) සිරකරුවන්ගේ සුබසාධනය වැඩි දියුණු කිරීම
(3) අපරාධ යුක්ති විනිශ්චය පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම

එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන විසින් සපයන ලද මූල්‍ය ආධාර මත මෙම අධ්‍යයනය සිදු කරන ලදී. මෙම අධ්‍යයනයේ විද්‍යුත් අනුවාදය 2020 දී ප්‍රකාශයට පත් කරන ලද අතර එය https://www.hrcsl.lk/wp-content/uploads/2020/01/Prison-Report-Final-2.pdf මගින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා වෙබ් අඩවියෙන් ප්‍රවේශය ලබා ගත හැකිය. අධ්‍යයනයේ අඩංගු නිර්දේශ සඳහා ක්‍රියාත්මක කිරීමේ සැලැස්මක් ද කෙටි, මධ්‍ය කාලීන සහ දිගුකාලීන ක්‍රියාකාරකම් සමඟින් සකස් කරන ලදී.

4.3 නිර්දේශ ක්‍රියාත්මක නොවීම නියාමනය කිරීම

"මානව හිමිකම් කොමිසමෙහි පරීක්ෂණ, විමර්ශන සහ අධීක්ෂණ යාන්ත්‍රණයන් ශක්තිමත් කිරීම මගින් කඩිනම් සහ ඵලදායී පිළියම් සැපයීම" සඳහා වූ කොමිෂන් සභාවේ උපායමාර්ගික සැලැස්මේ හඳුනාගත් එක් ඉලක්කයකට අනුකූලව, කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද නිර්දේශ ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම සඳහා පිහිටුවන ලද පරීක්ෂණ සහ විමර්ශන අංශයේ ක්‍රියාත්මක නොකරන නිර්දේශ සොයාබලන ඒකකය 2020 දී සාර්ථකව ක්‍රියාත්මක විය. 2019 දී හඳුන්වා දුන් ප්‍රවේශය අනුගමනය කරමින්, මෙම වසරේ මෙම ඒකකය විසින් මානව හිමිකම් කොමිසමේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වූ ආයතන ලැයිස්තුවක් සම්පාදනය කරන ලද අතර විෂය කරුණු අනුව ක්‍රියාවට නංවා නොමැති නිර්දේශ ගොනු කරන ලදී. ක්‍රියාත්මක නොකළ නිර්දේශ සඳහා බොහෝ පොකුරු පරීක්ෂණ

පැවැත්වීමට කෝවිඩ් -19 වසංගතය ඉඩ නොදුන් නමුත්, පොලිසිය විසින් ක්‍රියාත්මක නොකළ නිර්දේශ පොකුරු වශයෙන් පසු විපරම් කරන ලදී. පොලිසියට යොමුකළ නිර්දේශ ක්‍රියාත්මක නොකිරීමේ ගැටලු මතුකර පැහැදිලි කිරීම් ලබාගැනීම සඳහා පොලිස්පතිවරයා සහ ජාතික පොලිස් කොමිසම සමඟ සාකච්ඡා කිහිපයක් පැවැත්විණි. එකවර නිර්දේශ කිහිපයක් ක්‍රියාත්මක නොකිරීම සම්බන්ධයෙන් රාජ්‍ය ආයතන කැඳවන ලද බැවින් තනි නිර්දේශ ක්‍රියාත්මක නොකිරීම ගැන සොයා බැලීමට වඩා පොකුරු ප්‍රවේශය ධනාත්මක ප්‍රතිඵල ලබා දීමට වඩා කාර්යක්ෂම විය. කොමිසමේ මැදිහත්වීම සාධාරණීකරණය කරමින් ක්‍රියාත්මක නොකිරීමේ ප්‍රමාණය මෙමගින් ඉස්මතු වූ අතර, විවිධ නිර්දේශ ක්‍රියාත්මක නොකිරීම සම්බන්ධයෙන් නිලධාරීන් කිහිප වතාවක්ම කැඳවීමට කොමිසමට හැකි වූ බැවින් නිලධාරීන් ද වඩාත් ප්‍රතිචාර දැක්වූහ.

නිර්දේශ ක්‍රියාත්මක නොවීම සොයාබැලීමේ ඒකකයේ ප්‍රයත්නයන්හි ප්‍රතිඵලයක් ලෙස බොහෝ ආයතන මෙම උපදෙස් පිළිගෙන එම නිර්දේශ ක්‍රියාත්මක කිරීමට තමන් ගෙන ඇති මූලපිරීම් සඳහන් කරමින් කොමිසමට ප්‍රතිචාර දක්වා ඇත. පසුගිය වසරවල නිර්දේශ ක්‍රියාවට නැංවීමේ ක්‍රමානුකූල වර්ධනයක් 2020 වර්ෂයේදී ද පෙන්නුම් කළ අතර එය ඒකකයේ සාර්ථකත්වයට සාක්ෂියකි.

4.4 වෙනත් නියාමන කටයුතු

කොමිෂන් සභාවේ විධිනියෝගය යටතේ, රැඳවියන්ගේ යහපැවැත්ම නිරීක්ෂණය කිරීම සඳහා රැඳවුම් ස්ථාන නැරඹීමට සහ රැඳවියන්ගේ අයිතිවාසිකම්වලට ගරු කිරීම සහ ආරක්ෂා කිරීම සහතික කිරීමේ අරමුණ ඇතිව රැඳවුම් තත්වයන් වැඩිදියුණු කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීමට කොමිසමට බලය ඇත. කොමිෂන් සභාව සිය බලතල ක්‍රියාත්මක කරමින්, වසර පුරාවට රැඳවුම් ස්ථාන වෙත ක්ෂණික (හදිසි) නිරීක්ෂණ චාරිකා සිදු කරයි. මෙම චාරිකාවන් ප්‍රධාන කාර්යාලයෙන් මෙන්ම ප්‍රාදේශීය කාර්යාල මගින්ද සිදු කෙරේ. නිරන්තර අධීක්ෂණයට භාජනය වන පොලිස් ස්ථාන වලට අමතරව, කොමිසම විසින් බන්ධනාගාර, රිමාන්ඩ් කුටි, තාවකාලිකව නවතා තබන නිවාස, පුනරුත්ථාපන මධ්‍යස්ථාන, ළමා නිවාස, ආබාධිත නිවාස සහ ආගමන රැඳවුම් මධ්‍යස්ථාන වැනි රැඳවුම් ස්ථාන පරීක්ෂා කොට ඇත. කොමිෂන් සභාව සති අන්තය ඇතුළුව සතිය පුරා ක්ෂනික සංචාර පවත්වන අතර මෙම සංචාරවලදී වධහිංසා සහ නීතිවිරෝධී ලෙස සැලකීම පිළිබඳ රැඳවියන් විසින් කරන ලද චෝදනා සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වයි.

4.4.1 රැඳවුම් හා රැකබලා ගන්නා ස්ථාන නියාමනය කිරීම

කොමිෂන් සභාව, එහි ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශීය කාර්යාල හරහා **2020** වර්ෂය තුළ පොලිස් ස්ථාන වෙත සංචාර **1003**ක් සිදු කර ඇත. වධහිංසා පැමිණිවීම් වැළැක්වීම සඳහා අනෙකුත් අදාළ රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන සමඟ

සම්බන්ධීකරණය සහ සහයෝගයෙන් කටයුතු කිරීමට අමතරව, මෙම චාරිකාවල පරමාර්ථය වන්නේ කාර්යක්ෂම ක්‍රියාකාරී සහ ප්‍රතික්‍රියාශීලී ක්‍රියාමාර්ග හරහා ශ්‍රී ලංකාව තුළ වධහිංසා පැමිණවීම් සහ වෙනත් ආකාරයේ හාරයේ සිටියදී හිරිහැර කිරීම් වැළැක්වීම, එවැනි උල්ලංඝනයන් සිදු කරන නිලධාරීන් හඳුනා ගැනීමට පියවර ගැනීම සහ ප්‍රතිකර්ම නිර්දේශ කිරීමයි.

මෙම සංචාර වලදී සමහර පොදු ගැටලු හඳුනා ගන්නා ලදී, ඒවා අතර:

- අත්අඩංගුවට ගැනීමේදී නියමිත ක්‍රියා පටිපාටිය අනුගමනය නොකිරීම
- අත්අඩංගුවේ දී අයහපත් ලෙස සැලකීම සහ වධහිංසා පැමිණවීම
- සැකකරුවන් අධිකරණයට ඉදිරිපත් කිරීම ප්‍රමාද කිරීම
- අධික තදබදය සහ සිර මැදිරි තුළ මූලික පහසුකම් නොමැතිකම

වධහිංසා පැමිණවීම, අයහපත් ලෙස සැලකීම සහ රඳවා තබා ගැනීමේ කොන්දේසි සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව සිය ප්‍රතිපත්තිමය මැදිහත්වීම් තුළ මෙම නිරීක්ෂණ යළි යළිත් ඉස්මතු කරයි.

මීට අමතරව, කොමිෂන් සභාව අනෙකුත් රැඳවුම් සහ රැකවරණ ස්ථාන වෙත සංචාර **102** ක් සිදු කළේය. සාමාන්‍යයෙන්, මෙම චාරිකා බොහෝ දුරට ප්‍රාදේශීය කාර්යාල හරහා සිදු කෙරේ. රැඳවියන්ගේ අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා රැඳවුම් ස්ථාන නිරීක්ෂණය කිරීමට කොමිසමට පැවරී ඇති බලය අනුව ප්‍රාදේශීය සහ උප කාර්යාලවල අධීක්ෂණ කටයුතු ඉතා වැදගත් වේ. කෙසේ වුවද, වසංගතය හේතුවෙන් සේවක හිඟයේ ප්‍රතිඵලයක් ලෙස වාර්තා කරන ලද වර්ෂයේ වැඩිම නිරීක්ෂණ චාරිකා සංඛ්‍යාවක් ප්‍රධාන කාර්යාලය විසින් සිදුකරන ලදී.

කෝවිඩ්-**19** වසංගතයෙන් ඇති වූ කාර්ය මණ්ඩල හිඟය හේතුවෙන් පෙර වසරවලට වඩා අඩු සංචාර ප්‍රමාණයක් තිබියදීත්, වධහිංසා පැමිණවීම් වැළැක්වීමට සහ රැඳවුම් ස්ථානවල තත්ත්වය වැඩිදියුණු කිරීමට කොමිෂන් සභාව සාර්ථක මැදිහත්වීම් සිදු කළේය. ඒ අනුව, රඳවා තබා ගැනීමේ තත්වයන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පහත සඳහන් රැස්වීම් පැවැත්වීය.

- රැඳවුම් නියෝග යටතේ රඳවාගෙන සිටින පුද්ගලයන් රඳවා තබා ගැනීම සහ දීර්ඝ කාලීනව රඳවා තබා ගැනීමේ කොන්දේසි සම්බන්ධයෙන් ත්‍රස්ත විමර්ශන කොට්ඨාසය, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සහ කොළඹ අපරාධ කොට්ඨාශය සමඟ රැස්වීම් කිහිපයක්.

- අත්අඩංගුව තුළ ප්‍රවණ්ඩත්වය, පොලිසියට එරෙහි වධහිංසා පැමිණිලි, සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුති පනත යටතේ

අත්අඩංගුවට ගැනීම සහ වෛරී ප්‍රකාශ, ත්‍රස්ත විමර්ශන ඒකකය, අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව, සහ කොලඹ අපරාධ විමර්ශන ඒකකය විසින් පරිපාලනමය වශයෙන් රඳවා තබා ගැනීම් සහ ඝාතනවලට සම්බන්ධ පැමිණිලිවල මෑත කාලීන ඉහළ යාම සම්බන්ධයෙන් 2020 අගෝස්තු 27 වන දින පොලිස්පතිවරයා සහ ජාතික පොලිස් කොමිසම හමුවීම.

- රැඳවියන් රඳවා තබා ගැනීමේ කොන්දේසි, වධහිංසා පැමිණවීම් පිළිබඳ පැමිණිලි සහ සිරකරුවන්ගේ සෞඛ්‍ය හා යහපැවැත්ම කළමනාකරණය කිරීම සහ කෝවිඩ්-19 වසංගතය තුළ ඔවුන්ගේ පවුලේ අය සමඟ සන්නිවේදනය කිරීම පිළිබඳව 2020 සැප්තැම්බර් 17 වැනි දින බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයා සමඟ පැවති රැස්වීම.

2020 වසරේ රඳවා තබාගැනීම්

රඳවුම් ස්ථාන හා සත්කාරක නිවාස	අම්පාර	අනුරාධපුර ය	බදුල්ල	මඩකලපුව	යාපනය සහ කිලිනොච්චි	කල්මුනේ	මහනුවර	මාතර	මුලතිව් සහ කිලිනොච්චි	වවුනියාව	ප්‍රධාන කාර්යාලය	එකතුව
පොලිස් ස්ථාන	44	100	105	60	71	42	97	100	26	27	331	1003
බන්ධනාගාර	05	--	3	6	4	1	9	--	--	1	12	41
ළමා නිවාස සහ ළමුන් සඳහා වූ පුනරුත්ථාපන මධ්‍යස්ථාන	--	15	1	4	--	10	--	1	--	--	--	31
විදේශීකයන් රඳවුම් මධ්‍යස්ථාන	--	--	--	--	--	--	--	--	--	--	02	02
පුනරුත්ථාපන මධ්‍යස්ථාන	--	--	--	--	--	--	--	--	--	--	--	--
කාන්තා නිවාස	--	--	--	01	--	--	--	--	--	--	01	02
වැඩිහිටි නිවාස	--	02	--	01	--	--	--	--	--	--	--	03
ආබාධිත නිවාස	--	01	--	--	--	--	--	--	--	--	--	01
ත්‍රස්ත විමර්ශන අංශය/අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව	--	--	--	--	--	--	--	--	--	02	08	10
විශේෂ / වෙනත්	--	--	--	--	--	--	--	--	--	02	10	12
එකතුව	49	118	109	72	75	53	106	101	26	32	364	1105

4.4.2 පාර්ලිමේන්තු මැතිවරණ - 2020

- **2020 පාර්ලිමේන්තු මැතිවරණය සඳහා ස්ථාපිත පැමිණිලි ඒකකය -2020**

2020 පාර්ලිමේන්තු මැතිවරණයට අදාළව රාජ්‍ය නිලධාරීන් විසින් මානව හිමිකම් කඩකිරීමේ චෝදනා සම්බන්ධයෙන් පැමිණිලි භාර ගැනීම සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් පැමිණිලි භාරගැනීමේ ඒකකයක් ස්ථාපිත කරන ලදී. තැපැල්, විද්‍යුත් තැපෑල හෝ ෆැක්ස් මගින් පිළිගත් ලිඛිත පැමිණිලි වලට අමතරව, කොමිසමට පැය **24** පුරා ක්‍රියාත්මක වන ක්ෂණික ඇමතුම් අංකය හරහා මැතිවරණ සම්බන්ධ පැමිණිලි ද ලැබිණි.

- රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සේවකයින්ට ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා වැටුප් සහිත නිවාඩු ඉල්ලීම

පාර්ලිමේන්තු මැතිවරණයේදී ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සේවකයන්ට (රාජ්‍ය ආයතනවල අනියම් සහ කොන්ත්‍රාත් පදනම මත සේවය කරන සේවකයන් ඇතුළුව) ඔවුන්ගේ නිවාඩු ශේෂයට බලපෑමක් නොමැතිව වැටුප් සහිත නිවාඩු ලබා දෙන ලෙස ඉල්ලමින් 2020.07.13 දින කොමිෂන් සභාව විසින් කම්කරු අමාත්‍යාංශයට, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයට සහ ආයෝජන මණ්ඩලයට වෙන් වෙන් වශයෙන් ලියා දන්වන ලදී. පුරවැසියන්ගේ පරමාධිපත්‍ය වන ඡන්ද අයිතිය ආරක්ෂා කිරීම සහතික කිරීම පිණිස සියලුම සේවකයින්ට ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා නිවාඩුවක් ලබා දෙන බව ප්‍රකාශ කරමින් පුවත්පත් ආදිය හරහා මහජන නිවේදනයක් නිකුත් කරන ලෙස කොමිසම නිර්දේශ කළේය. මෙම නිර්දේශය මැතිවරණ කොමිසමටද පිටපත් කර ඇත.

- **කිසිදු ඡන්දදායකයකු අත් නොහැරෙන ලෙස මැතිවරණ කොමිෂන් සභාව වෙත නිර්දේශ කිරීම**

2020 පාර්ලිමේන්තු මැතිවරණය, විශේෂයෙන්ම කෝවිඩ්-19 වසංගතයේ සන්දර්භය තුළ "කිසිදු ඡන්දදායකයෙකු අත්නොහැරෙන" මැතිවරණයක් බවට සහතික කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කරමින් කොමිසම මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිවරයාට ලිඛිතව දන්වා සිටියේය. කෝවිඩ්-19 වසංගතය හේතුවෙන් සාමාන්‍ය මහජනතාවගේ ඡන්ද අයිතිය ක්‍රියාත්මක කිරීමේදී යම් පැකිලීමක් ඇති විය හැකි බැවින් මැතිවරණයට අදාළ රාජකාරි සම්බන්ධයෙන් නිලධාරීන්ට සහ ඡන්දදායකයින්ට පැහැදිලි සෞඛ්‍ය මාර්ගෝපදේශ නිකුත් කිරීමේ වැදගත්කම එමගින් අවධාරණය කළේය. ආබාධ සහිත පුද්ගලයින්ගේ හෝ විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයින්ගේ සහ භූගෝලීය වශයෙන් හුදකලා වූ පුද්ගලයින්ගේ ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය සහතික කිරීම සඳහා විශේෂ දීමනා ලබා දීමේ රාජ්‍යයේ වගකීම කොමිසම අවධාරණය කළේය. 2019 මැතිවරණයේදී ඡන්ද හිමි නාමලේඛනවල නම් ඇතුළත් නොවීම පිළිබඳ ගැටලුව ද කොමිසම මතු කළ අතර පාර්ලිමේන්තු මැතිවරණයට පෙර එවැනි ගැටලුවලට විසඳුම් ලබා දෙන ලෙස මැතිවරණ කොමිෂන් සභාවෙන් ඉල්ලා සිටියේය. නිර්දේශ තවදුරටත් අවශ්‍ය වූ අංශ අතරට, ආගමික සිද්ධස්ථාන වැනි ඇතැම් ජනවාර්ගික හෝ ආගමික කණ්ඩායම්වල භාරකාරත්වය

යටතේ පැවතිය හැකි ස්ථාන වෙනුවට මධ්‍යස්ථ පොදු ස්ථාන ඡන්ද මධ්‍යස්ථාන ලෙස තෝරා ගැනීම; ජාතික හැඳුනුම්පත් අයදුම් කිරීමේ ක්‍රියාපටිපාටිය සම්බන්ධයෙන් මුහුණ දෙන ගැටළු හේතුවෙන් භික්ෂූනීන් වහන්සේලාට (කාන්තා බෞද්ධ පූජක පක්ෂයට) ඡන්දය ප්‍රකාශ කිරීමේ අවස්ථාව අහිමි නොවන බව සහතික කිරීම; අමතර ආරක්ෂාව සැලසීම කෙසේ වෙතත් එවැනි අමතර ආරක්ෂාව ඡන්දදායකයින්ට තම අයිතිය භාවිත කිරීමට බාධාවක් නොවන බව සහතික කිරීම මගින් නිදහස් හා සාධාරණ මැතිවරණයක් ජනතාවට තහවුරු කිරීම; මැතිවරණ නීති දැඩි ලෙස ක්‍රියාත්මක කිරීම; මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද මාධ්‍ය මාර්ගෝපදේශවලට අනුකූල වීම සහතික කිරීම; සහ මැතිවරණයෙන් පසු ගම් මට්ටමින් සහ ආයතන මට්ටමින් පරාජිත පක්ෂවල ආධාරකරුවන්ට හිරිහැර සහ ප්‍රචණ්ඩත්වය වැලැක්වීමට පියවර ගැනීම ද ඇතුළත් විය.

- **2020 පාර්ලිමේන්තු මැතිවරණයට අදාළව පොලිස් නිලධාරීන් සඳහා මාර්ගෝපදේශ සහ රාජ්‍ය සේවයේ සහ පළාත් රාජ්‍ය සේවාවල නිලධාරීන්ගේ ක්‍රියාකාරකම්වලට අදාළ උපදෙස්**

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ සෑම පුරවැසියෙකුටම ඡන්දය ප්‍රකාශ කිරීමට, නිදහසේ දේශපාලන කටයුතුවල යෙදීමට ඇති අයිතිය සහ නිදහස් හා සාධාරණ මැතිවරණ සඳහා ඇති අයිතිය සැලකිල්ලට ගනිමින්, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් මැතිවරණයට ආසන්න කාලය තුළ, මැතිවරණය පැවැත්වෙන දින සහ මැතිවරණය අවසන්වූ වහාම කාලසීමාව තුළ සියලුම පොලිස් නිලධාරීන් විසින් නිරීක්ෂණය කළ යුතු මාර්ගෝපදේශ නිකුත් කරන ලදී. කොමිෂන් සභාවේ පනත යටතේ කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලතල අනුව නිකුත් කරන ලද මෙම මාර්ගෝපදේශවලට අනුකූල වීම කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කරන ලදී.

ජනාධිපතිවරණයට අදාළව රාජ්‍ය නිලධාරීන්ට සහ පළාත් රාජ්‍ය සේවයේ නියුතු රාජ්‍ය නිලධාරීන්ට මැතිවරණය නිදහසේ සහ සාධාරණව පැවැත්වෙන බවට සහතික වන ලෙස කොමිසම නියෝග නිකුත් කළේය. නීතිය ක්‍රියාත්මක නොකිරීම සහ දේශපාලනික වශයෙන් පාර්ශවීය ලෙස බලතල භාවිතා කිරීම ඇතුළු බලතල අනිසි ලෙස භාවිතා කිරීම මූලික අයිතිවාසිකම් කඩවීමට හේතු වන බවත්, රාජ්‍ය වගකීම් දැරීමට අමතරව, උල්ලංඝන කිරීම් සම්බන්ධයෙන් ඒ ඒ නිලධාරීන් ද පුද්ගලිකව වගකිව යුතු බව එම නියෝග මගින් අවධාරණය කර ඇත.

4.4.3 වෙනත් නියාමන කටයුතු:

- **අධ්‍යාපනයට කොවිඩ් - 19 වසංගතයේ බලපෑම**

කොවිඩ්-**19** වසංගතය හමුවේ පාසල් වසා දැමීම හේතුවෙන් නිවෙස්වලට සීමා වී සිටින පාසල් දරුවන්ගේ**,** විශේෂයෙන්ම **5** ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයට**,** සාමාන්‍ය පෙළ විභාගයට සහ උසස් පෙළ විභාගයට පෙනී සිටින දරුවන්ගේ අධ්‍යාපන කටයුතු අඩාල වීම පිළිබඳව කොමිසම විසින් තක්සේරුවක් සිදු කරන ලදී. මෙම ගැටලුවට ප්‍රතිචාරයක් ලෙස පුද්ගලික අංශය විසින් හඳුන්වා දුන් මාර්ගගත ඉගැන්වීම් ක්‍රියාකාරකම් පිළිබඳ සමාලෝචනයක් ද මෙම තක්සේරුවේ කොටසක්

විය. පර්යේෂණ හා අධීක්ෂණ ඒකකය විසින් මෙම තක්සේරුව ප්‍රාදේශීය කාර්යාලවල සහාය ඇතිව සිදු කරන ලදී.

- **පුවත් වාර්තා අධීක්ෂණය**

ප්‍රාදේශීය සහ උප කාර්යාලවල විෂය පථයට අයත් මානව හිමිකම් උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යවල ප්‍රවෘත්ති වාර්තා ද කොමිෂන් සභාව අඛණ්ඩව අධීක්ෂණය කළේය. මෙම ක්‍රියාකාරකම කොමිෂන් සභාවට ස්වයං සිද්ධි මැදිහත්වීම් සිදු කිරීමට මෙන්ම වගඋත්තරකාර පාර්ශ්වයන්ගේ ප්‍රතිකර්ම ක්‍රියාමාර්ගවල ප්‍රගතිය පිළිබඳ පසු විපරම් කිරීමට සහාය වේ.

- **තවදුරටත් අධීක්ෂණය අවශ්‍ය මැදිහත්වීම්**

අදාළ බලධාරීන් සහ බලපෑමට ලක් වූ පාර්ශ්ව සමඟ සාකච්ඡා මාලාවක් පවත්වන ලද අතර කොමිෂන් සභාවේ මතය අනුව මැදිහත්වීම් සහ අඛණ්ඩ අධීක්ෂණය අවශ්‍ය වූ කරුණු සම්බන්ධයෙන් අවශ්‍ය මැදිහත්වීම් කරන ලදී. තෝරා ගත් නිදසුන් පහත දැක්වේ;

- ගමනාන්ත රටවල සිටින ශ්‍රී ලාංකික සංක්‍රමණික ශ්‍රමිකයන්ගේ සහ දැනට ශ්‍රී ලංකාවේ සේවයේ නියුතු විදේශ සංක්‍රමණික ශ්‍රමිකයන්ගේ ආරක්ෂාව සහ යහපැවැත්ම සම්බන්ධයෙන් කළ හැකි මැදිහත්වීම් පිළිබඳ සාකච්ඡාවක් විදේශ අමාත්‍යාංශය, විදේශ රැකියා ප්‍රවර්ධන අමාත්‍යාංශය සහ කම්කරු අමාත්‍යාංශයේ සහභාගීත්වයෙන් පැවැත්විණි .

- එක්සත් ජාතීන්ගේ සරණාගතයින් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලයේ ලියාපදිංචි සරණාගතයෙකු වන පකිස්ථාන ජාතිකයෙකු මිරිහාන රැඳවුම් මධ්‍යස්ථානයේ රඳවා තබා ගැනීම සම්බන්ධයෙන් සිවිල් සමාජ සංවිධානයකින් ලැබුණු පැමිණිල්ලකට අනුව මානව හිමිකම් කොමිසම වශයෙන් ආගමන විගමන පාලක ජනරාල්වරයාට මේ සම්බන්ධයෙන් මැදිහත් වී සුදුසු පියවර ගන්නා ලෙස නිල වශයෙන් දැනුම් දුන්නේය.

- 2019 පෙබරවාරි සිට සෞදි අරාබියේ රැකියා ස්ථානයේ හිරිහැරයට ලක්වන ශ්‍රී ලාංකික සංක්‍රමණික සේවිකාවකගේ නීතීඥවරියගෙන් ලැබුණු පැමිණිල්ලට අදාළව අවශ්‍ය පියවර ගන්නා ලෙස විදේශ රැකියා ප්‍රවර්ධන අමාත්‍යාංශයට සහ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට ලිඛිත මැදිහත්වීමක් කරන ලදී.

- ගල්කිස්ස වෙරළ තීරයේදී පාකිස්තානයේ සිට පැමිණි සරණාගත දැරියකට අතවර කළ බව කියන සිද්ධිය සම්බන්ධයෙන් පුවත්පතක පළ වූ ලිපියක් මත ක්‍රියාත්මක වූ කොමිසම ඒ සම්බන්ධයෙන් මැදිහත් වන ලෙස ප්‍රදේශයේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයාට දැනුම් දුන්නේය. විමර්ශනවල ප්‍රගතිය කොමිසම අඛණ්ඩව අධීක්ෂණය කරයි.

5 වන පරිච්ඡේදය:
අධ්‍යාපනය සහ බාහිර කටයුතු

5.1. මහජන දැනුවත් කිරීම්

5.1.1. ජාත්‍යන්තර දින සැමරුම

5.1.2. විවිධ ඉලක්කගත කණ්ඩායම් සඳහා වූ මානව හිමිකම් පුහුණු වැඩසටහන්

5.2. අනෙකුත් රාජ්‍ය ආයතන / වැඩසටන් සමග දැනුම බෙදා ගැනීම

5.3. මාධ්‍ය සමඟ කටයුතු කිරීම

5.3.1. සාම්ප්‍රදායික මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය යොදා ගැනීම

5.3.2. මාර්ගගත ක්‍රම භාවිතාව

5.4. සිවිල් සමාජය සමඟ කටයුතු කිරීම

5.4.1. ප්‍රාදේශීය සිවිල් සමාජ සම්බන්ධීකරණ කමිටු

5.4.2. මානව හිමිකම් සඳහා ප්‍රජා කාර්යසාධන බලකා

5.4.3. තේමාත්මක අනු කමිටු සාමාජිකයන් ලෙස සිවිල් සමාජ නියෝජිතයන්

5.4.4. සිවිල් සමාජ සංවිධානය කළ වැඩසටහන් සඳහා සහභාගීවීම

5.4.5.සිවිල් සමාජය සමග සාකච්ඡා

5.4.6. සිවිල් සමාජය පුහුණු කිරීම

5.5. උපදේශකත්වය

අධ්‍යාපනය සහ බාහිර කටයුතු

5.1 මහජනතාව දැනුවත් කිරීම

මේ පනතේ 10 වැනි වගන්තිය මගින් නියම කර ඇති පරිදි, මානව හිමිකම් පිළිබඳ ගැටළු පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම සහ සංවේදීතාව ඉහළ නැංවීම සඳහා සක්‍රීයව නිරත වීමට කොමිෂන් සභාව උත්සාහ කරයි. පුරවැසියාගේ මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම එහි පැවැත්මේ පරමාර්ථය වන බැවින් කොමිසම විසින් මහජනතාව සිය කාර්යයේ අනිවාර්ය අංගයක් ලෙස සලකන ලබයි. එබැවින්, 2020 වසර මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීමේ වැදගත් සිදුවීම් රැසකින් සනිටුහන් වන අතර, විටෙක කෝවිඩ්-19 වසංගතයේ බලපෑමට එරෙහිව නව්‍ය ප්‍රවේශයන් අනුගමනය කරයි.

5.1.1. ජාත්‍යන්තර දින සැමරීම

- **ජාත්‍යන්තර මානව හිමිකම් දිනය - 2020**

කෝවිඩ්-19 වසංගතය පිළිබඳව තේමාත්මකව අවධානය යොමු කර ඇති ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් 2020 ජාත්‍යන්තර මානව හිමිකම් දිනය සැමරීම වෙනුවෙන් අපගේ ප්‍රකෘතිමත් වීමේ ප්‍රයත්නයන් සඳහා මානව හිමිකම් කේන්ද්‍රීය විය යුතු බව සහතික කිරීම මත පදනම් වූ ඩිජිටල් දැනුවත් කිරීමේ ව්‍යාපාරයක් දියත් කරන ලදී. #recoverbetter #standup4humanrights යන හැෂ් ටැග් භාවිතා කරමින් 2020 ජාත්‍යන්තර මානව හිමිකම් දිනය සැමරීම සඳහා අලුතින් දියත් කරන ලද ෆේස්බුක් පිටුවේ සහ ඉන්ස්ටිග්‍රාම් ගිණුමේ 2020 දෙසැම්බර් 08 දින සිට මාසයක් පුරා මෙම ප්‍රචාරණය අඛණ්ඩව ක්‍රියාත්මක විය.

COVID-19 වසංගතය අතරතුර මානසික සෞඛ්‍යයේ අයිතිය ආරක්ෂා කිරීම පිළිබඳ පණිවිඩයක් ෆේස්බුක් පිටුවේ ප්‍රදර්ශනය කෙරේ

මානව හිමිකම්වල වැදගත්කම සහ වසංගතයෙන් මිදීමට මූලපිරීම් සඳහා ගෝලීය සහයෝගිතාවයේ අවශ්‍යතාවය මෙම ව්‍යාපාරයේදී අවධාරණය කරන ලදී. එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) මෙම මූලපිරීම සාර්ථක කර ගැනීම සඳහා මූල්‍ය ආධාර ලබා

දුන්නේය. ජාතික වැඩසටහනට සමගාමීව මානව හිමිකම් දිනය නිමිත්තෙන් කොමිෂන් සභාවේ ප්‍රාදේශීය කාර්යාල මගින් එකම තේමාවක් ඔස්සේ ගුවන් විදුලි වැඩසටහන් පවත්වන ලදී.

- **ජාත්‍යන්තර කාන්තා දිනය 2020**

ජාත්‍යන්තර කාන්තා දිනය සැමරීම සඳහා 'කාන්තාවන්ට එරෙහි තාක්ෂණය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වයට එරෙහි වීම' යන තේමාව යටතේ මහජන උත්සවයක් කොමිෂන් සභාව විසින් 2020 මාර්තු 06 වැනි දින ජාතික ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේදී සංවිධානය කරන ලදී. මෙහි ප්‍රධාන ආරාධිතයා ලෙස විශ්‍රාමලත් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු ශිරාණි තිලකවර්ධන මහත්මිය සහභාගි වූ අතර ශ්‍රී ලංකා ඩිජිටල් කාන්තා වාණිජ මණ්ඩලයේ සභාපතිනී ජයෝමි ලොකුලියන මහත්මිය ගෞරවනීය ආරාධිත අමුත්තා වූවාය. බස්නාහිර පළාතේ සියලුම පොලිස් ස්ථානවල ස්ථානාධිපතිවරුන්, පොලිස් ළමා හා කාන්තා කාර්යාංශයේ නිලධාරීන්, රාජ්‍ය නිලධාරීන්, සිවිල් සමාජ නියෝජිතයන්, පාසල් ගුරුවරුන්, එක්සත් ජාතීන්ගේ නියෝජිතායතනයන්හි නියෝජිතයන්, තරුණ ප්‍රජාව සහ අනුකමිටු සාමාජිකයන්ගෙන් මෙම ප්‍රේක්ෂකාගාරය සමන්විත විය (වැඩිදුර තොරතුරු සඳහා ඉහත තේමාත්මක උප කමිටු යටතේ 4.1 බලන්න). ග්‍රාස්රූට් ට්‍රස්ට් හි හාන්ස් බිලිමෝරියා මහතා; අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සයිබර් අපරාධ කොට්ඨාසයේ අධ්‍යක්ෂ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී දර්ශිකා කුමාරි, ජාතික ළමා ආරක්ෂණ අධිකාරියේ නීතිය බලාත්මක කිරීමේ අංශයේ උපදේශක විජේසේන විතාන මහතා; සහ ග්‍රවුන්ඩ්විස් හි සම කර්තෘ මනෝලි විජේතුංග මහත්මිය විශේෂඥ සම්පත් දායකත්වය ලබා දුන් අතර මයින්ඩ් ඇඩ්වෙන්ච් තියෙටර් සමාගම විසින් නාට්‍යමය ජවනිකාවක් කොමිසමේ ආරාධනයෙන් ප්‍රේක්ෂකයින් සඳහා ඉදිරිපත් කරන ලදී.

ප්‍රධාන ආරාධිතයා වූ විනිසුරු ශිරාණි තිලකවර්ධන මහත්මිය රැස්ව සිටි පිරිස අමතමින්

සාකච්ඡාවට ක්‍රියාකාරීව දායක වන සහභාගිවන්නන්

කාන්තාවන්ට එරෙහි තාක්ෂණය පදනම් කරගත් හිංසන සංකල්ප සහ සිදුවීම්, එවැනි හිංසනය වැළැක්වීම සහ ඒවාට එරෙහිව සටන් කිරීම, හානියට පත්වූවන් සඳහා ලබා ගත හැකි සහය සහ වගකිවයුතු ආයතන පිළිබඳව මහජනතාව සහ අදාළ නිලධාරීන් දැනුවත් කිරීම මෙම උත්සවයේ අරමුණ විය. රාජ්‍ය නිලධාරීන් මෙන්ම සාමාන්‍ය ජනතාව අතර තාක්ෂණය පදනම් කරගත් කාන්තා හිංසනය පිළිබඳ දැනුවත්භාවය සහ අධ්‍යාපනය නොමැතිකම සහ මෙම ගැටළු විසඳීම සඳහා නීති පද්ධතිය තුළ පවතින අඩුපාඩු පිළිබඳව අවධානය යොමු විය.

ජාත්‍යන්තර කාන්තා දිනය නිමිත්තෙන් මාතර, කල්මුණේ, බදුල්ල, සහ මහනුවර යන ප්‍රාදේශීය කාර්යාල මගින් ප්‍රාදේශීය මට්ටමින් සමාන්තර වැඩසටහන් පැවැත්විණි.

- **වදහිංසාවට ලක්වූ චින්දිතයන්ට සහාය දැක්වීමේ ජාත්‍යන්තර දිනය - 2020**

2020 වධහිංසාවට ලක්වූවන්ට සහය දැක්වීමේ ජාත්‍යන්තර දිනය සැමරීම සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව "ශ්‍රී ලංකාවේ වධහිංසා සහ වෙනත් ආකාරයේ සමාජ ප්‍රචණ්ඩත්වය: එක් ක්‍රියාවලියක කොටස්ද?" යන තේමාව යටතේ සිය පළමු වෙබ් සම්මන්ත්‍රණය (webinar) පැවැත්වීය.2020 ජූනි 26 දින සිංහල සහ දෙමළ භාෂාවලින් වෙබ් සම්මන්ත්‍රණ දෙකක් පැවැත්විණි. බොහෝ විට විවිධ ආකාරයේ සමාජ ප්‍රචණ්ඩත්වයට පොදු මූලයන් ඇති බවත්, විවිධ වර්ග අතර ඇති සම්බන්ධකම් සැලකිල්ලට ගනිමින් සමාජයේ ආවේණික ප්‍රචණ්ඩත්වයට විසඳුම් සෙවීමට මානව හිමිකම් කොමිෂන් සභාව සෑම අංශයකින්ම ක්‍රියා කළ යුතු බවත් යන අවබෝධය අනුව තේමාව තෝරා ගන්නා ලදී. එක් අතකින් පුද්ගලික ක්ෂේත්‍රය තුළ සිදුකරන ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය සහ පොදු ක්ෂේත්‍රයේ පෞද්ගලික පුද්ගලයින් විසින් සිදුකරන නවක වදය සහ අනෙක් පැත්තෙන් රාජ්‍ය බලයට මුවා වී පුරවැසියන්ට එරෙහිව රාජ්‍ය නිලධාරීන් විසින් අත්අඩංගුවේ සිටියදී වධහිංසා පැමිණවීම වැනි ප්‍රචණ්ඩත්වය අතර අන්තර් සම්බන්ධය මෙහිදී ගවේෂණය කරන ලදී. ගෘහස්ත ප්‍රචණ්ඩත්වය, හිරිහැර කිරීම් සහ පොලිස් වධ හිංසාවලට ගොදුරු වූවන්ට ඔවුන්ගේ අත්දැකීම් බෙදාහදා ගැනීමට ද අවකාශය සලසා දුන් ප්‍රවීණ සම්පත් මණ්ඩලයක් විසින් සම්පත් දායකත්වය සපයන ලදී.

වෙබ්නාර් හි පසුබිම

5.1.2. විවිධ ඉලක්කගත කණ්ඩායම් සඳහා වූ මානව හිමිකම් දැනුවත් කිරීම් සහ පුහුණු වැඩසටහන්

- **දැනුවත් කිරීමේ වැඩසටහන්**

කොමිෂන් සභාව තවත් දැනුවත් කිරීමේ වැඩසටහන් කිහිපයක් ද පවත්වන ලදී, එනම්;

- අඹගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරීන් සඳහා සිංහල සහ දෙමළ භාෂාවලින් දැනුවත් කිරීමේ වැඩසටහන් දෙකක් 2020 මාර්තු 12 දින සංවිධානය කරන ලදී. වතුකරයේ මහජනතාවට සේවා සැපයීම සහ ඔවුන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සහතික කිරීම සඳහා ජනතා හිතකාමී ප්‍රවේශයක් අනුගමනය කරන්නේ කෙසේද යන්න පිළිබඳව සාකච්ඡාවක් පැවැත්විණි.

- 2020 ජනවාරි 27 වන දින කල්මුණේ ප්‍රාදේශීය කාර්යාලය මගින් අලුතින් බඳවාගත් පාසල් ගුරුවරුන් සඳහා ළමා අයිතිවාසිකම් පිළිබඳ පුහුණු වැඩසටහන.

- **ප්‍රජා ජංගම සේවා**

රටේ ප්‍රදේශ කිහිපයක ආන්තික කණ්ඩායම් සඳහා අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද ජංගම සේවා සඳහා කොමිෂන් සභාව සහ ප්‍රාදේශීය කාර්යාල මගින් සහාය ලබා දෙන ලදී. ඒ අනුව මාතර ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ප්‍රාදේශීය කාර්යාලය මගින් රත්ගම සහ බෝපේ ප්‍රදේශවල ජංගම සේවා සඳහා ආධාර ලබා දෙන ලදී.පවතින කෝවිඩ්-19 වසංගතය හේතුවෙන් පෙර වසරවල මෙන් කොමිසමට තමන්ගේම අනුග්‍රහය යටතේ ප්‍රජා ජංගම සේවා පැවැත්වීමේ හැකියාවක් නොතිබුණි.

5.2 අනෙකුත් රාජ්‍ය ආයතන / වැඩසටහන් සමඟ දැනුම බෙදාගැනීම

කොමිෂන් සභාව, එහි ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශීය කාර්යාල හරහා, අනෙකුත් රාජ්‍ය ආයතන විසින් පවත්වනු ලබන වැඩසටහන් සඳහා සම්පත් පුද්ගලයන්ගේ මාර්ගයෙන් ද සහාය ලබා දෙන අතර අනෙකුත් රාජ්‍ය ආයතන විසින් කැඳවන ලද කොමිෂන් සභාවට අදාල වන සාකච්ඡා සඳහා සක්‍රීයව දායක වේ. 2020 වර්ෂයේදී, මානව හිමිකම් කොමිෂන් සභාවෙහි ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශීය කාර්යාල විසින් දේශන පවත්වන ලද අතර පහත සඳහන් මාතෘකා පිළිබඳ සාකච්ඡා සඳහා සහභාගී විය:

අ) ශ්‍රී ලංකා යුද හමුදාවේ මානුෂීය නීතිය සහ මානව හිමිකම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සංවිධානය කරන ලද වැඩමුළුවල එක් අංගයක් ලෙස සුළුතර අයිතිවාසිකම් පිළිබඳ දේශනයක්.

ආ) 2020 සැප්තැම්බර් 29 වැනි දින පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ නීති දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලද ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ පිළිබඳ සාකච්ඡාව.

ඇ) 2020 පෙබරවාරි 28 වන දින බදුල්ල තාක්ෂණ විද්‍යාලයේ සිසුන් සඳහා මූලික අයිතිවාසිකම්, ළමා අයිතිවාසිකම් සහ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවෙහි කාර්යභාරය පිළිබඳ දැනුවත් කිරීමේ සැසියක්.

2020 දී ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවෙ හි ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශීය කාර්යාල මගින් පවත්වන ලද මානව හිමිකම් පිළිබඳ දැනුවත් කිරීම් සහ පුහුණුව පිළිබඳ සම්පූර්ණ වැඩසටහන් සංඛ්‍යාව

	ප්‍රධාන කාර්යාලය	ප්‍රාදේශීය කාර්යාල
පුහුණුවීම්	04	09
දේශන සභාය	2	59
රැස්වීම් / වැඩමුළු	2	14
ජංගම සේවා	-	9
වෙබිනාර්	1	2

2020 දී ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවෙ හි ප්‍රාදේශීය කාර්යාල මගින් සපයනු ලබන මානව හිමිකම් පිළිබඳ දැනුවත් කිරීම් සහ පුහුණු වැඩ සටහන් සංඛ්‍යාව

ප්‍රධාන කාර්යාලය / ප්‍රාදේශීය කාර්යාල	ඉලක්ක කණ්ඩායම්			
	සන්නද්ධ හමුදා	රජයේ නිළධාරීන්	ශිෂ්‍යයින් / තරුණ කණ්ඩායම්	පොදු ජනතාව/සිවිල් සංවිධාන/ ආගමික නායකයින්/ ජන මාධ්‍යවේදීන්/වෙනත් පුද්ගලයින්
බදුල්ල	--	--	1	--
මහනුවර	1	--	--	1
කල්මුනේ	--	4	--	
මාතර	--	--	1	1

2020 දී ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවෙහි ප්‍රාදේශීය කාර්යාල මගින් සපයනු ලබන දේශන සඳහා මානව හිමිකම් සම්පත් සහාය දුන් අවස්ථා සංඛ්‍යාව

ප්‍රධාන කාර්යාලය/ ප්‍රාදේශීය කාර්යාලය	ඉලක්ක කණ්ඩායම්			
	සන්නද්ධ හමුදා/ පොලිසිය	රාජ්‍ය නිළධාරීන්	ශිෂ්‍යයින්/ තරුණ කණ්ඩායම්	පොදු ජනතාව/සිවිල් සංවිධාන/ ආගමික නායකයින්/මාධ්‍යවේදීන්/ වෙනත් පුද්ගලයින්
අම්පාර	1	1	1	--
අනුරාධපුරය	7	--	--	6
බදුල්ල	4	--	3	11
මඩකලපුව	2	2	6	4
යාපනය	--	--	1	--
මහනුවර	--	--	1	--
කල්මුනේ	--	1	2	--
මාතර	1	1	--	1
ත්‍රිකුණාමලය	2	--	--	--
පුත්තලම (ජංගම කාර්යාලය)	--	--	--	1

5.3. මාධ්‍ය සමග කටයුතු කිරීම

කොමිසමෙහි බාහිර ප්‍රයත්නයන්හි අංගයක් ලෙස, තීරණාත්මක කරුණු මෙන්ම කොමිසමේ ක්‍රියාකාරකම් පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම සඳහා මාධ්‍ය සමඟ සම්බන්ධ විය. කොමිෂන් සභාව ප්‍රවර්ධන කටයුතු සඳහා සම්ප්‍රදායික මුද්‍රිත සහ විද්‍යුත් මාධ්‍ය මෙන්ම මාර්ගගත මාධ්‍යයන් භාවිතා කරයි.

5.3.1. සාම්ප්‍රදායික මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය යොදා ගැනීම

2020 ජාත්‍යන්තර කාන්තා දිනය නිමිත්තෙන් විද්‍යුත් මාධ්‍ය වැඩසටහන් මාලාවකට කොමිසමේ කොමසාරිස්වරුන් සහ කාර්ය මණ්ඩලය සහභාගි වූහ. ඒ අනුව, 2020 මාර්තු 05 වැනි දින ලේක්හවුස් ඩිජිටල් යූ ටියුබ් නාලිකාව ඔස්සේ තාක්ෂණය පදනම් කරගත් කාන්තා හිංසනය පිළිබඳ කථිකාවක් සඳහා සභාපතිනියට ආරාධනා කරන ලදී. කාන්තාවන්ට එරෙහි තාක්ෂණය පදනම් කරගත් හිංසනය පිළිබඳ තේමාව මත 2020 මාර්තු 04 වැනි දින ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ උදෑසන වැඩසටහනේ සාකච්ඡාවකට සහ 2020 මාර්තු 06 දින උදයන් රූපවාහිනී උදෑසන වැඩසටහනේ සාකච්ඡාවක් සඳහා කොමසාරිස් අම්බිකා සත්කුනනාදන් මහත්මිය සහභාගී වූ අතර 2020 මාර්තු 04 දින සිරස රූපවාහිනියෙහි *ජීවිතයට ඉඩ දෙන්න* වැඩසටහනට අධ්‍යාපන සහ විශේෂ වැඩසටහන් අංශයේ අධ්‍යක්ෂක (වැඩබලන) සහභාගී විය.

තවද, 2020 පෙබරවාරි 21 වන දින අරණායක, දෝතළුඔය ප්‍රදේශයේ ජනතාව මුහුණ දෙන අධ්‍යාපනය ඇතුළු සේවාවන් සඳහා ප්‍රවේශවීමේ ගැටළු පිළිබඳ සිරස රූපවාහිනියේ *ඇහැරෙන්න* වැඩසටහනේ සාකච්ඡාවකට අධ්‍යාපන සහ විශේෂ වැඩසටහන් අංශයේ අධ්‍යක්ෂක (වැඩබලන) සහභාගී වන ලදී.

ද අයිලන්ඩ් පුවත්පත කළ විමසුමකට ප්‍රතිචාර වශයෙන් කෝවිඩ්-19 ට ගොදුරු වූ මුස්ලිම්වරුන්ගේ ආදාහනය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවෙහි ස්ථාවරය පිළිබඳ සභාපතිවරයාගේ ප්‍රකාශය 2020 අප්‍රේල් 7 වන දින *ද අයිලන්ඩ්* පුවත්පතේ පළ විය.

5.3.2 මාර්ගගත ක්‍රම භාවිතාව

කොමිෂන් සභාවේ සියලුම ප්‍රතිපත්ති නිර්දේශ, මැදිහත්වීම් සහ උපදේශන ප්‍රකාශ මෙන්ම කොමිෂන් සභාවේ විධානයන් කොමිෂන් සභාවේ වෙබ් අඩවියට යොමු කර මහජනතාවට ප්‍රවේශ විය හැකි පරිදි සකසා ඇත. උචිත අවස්ථාවන්හිදී, මෙම තොරතුරු සිවිල් සමාජ සංවිධාන, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ තේමා අනුකමිටු සාමාජිකයින්, ශ්‍රී ලංකාවේ රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩල, ජාත්‍යන්තර මානව හිමිකම් සංවිධාන සහ ආසියා ශාන්තිකර කලාපීය ජාතික මානව හිමිකම් ආයතන සමඟ ද විද්‍යුත් වශයෙන් බෙදා ගනු ලැබේ. කොමිෂන් සභාවේ වෙබ් අඩවිය නිතිපතා යාවත්කාලීන වන බැවින් (2020 දී යාවත්කාලීන කිරීම් 33 ක්), එය ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පිළිබඳ යාවත්කාලීන තොරතුරු සඳහා විශ්වාසදායක මූලාශ්‍රයකි.

කොමිෂන් සභාව කලාපයේ සහ ගෝලීය වශයෙන් පුළුල් ප්‍රේක්ෂක පිරිසක් වෙත තම කටයුතු බෙදා හැරීම සඳහා ආසියා ශාන්තිකර සංසදයේ ප්‍රකාශනය ද භාවිතා කරයි.

5.4. සිවිල් සමාජය සමඟ කටයුතු කිරීම

කොමිෂන් සභාව, විශේෂයෙන්ම ප්‍රාදේශීය කාර්යාල හරහා සිවිල් සමාජය සමඟ සමීපව කටයුතු කරයි. කොමිෂන් සභාව සිවිල් සමාජය සලකන්නේ කොමිසමේ කාර්යය පොහොසත් කරන මහා සම්පතක් ලෙස වන අතර කොමිසම මානව හිමිකම් පිළිබඳ සිවිල් සමාජයේ කටයුතු සඳහා ද දායක වේ.

5.4.1 ප්‍රාදේශීය සිවිල් සමාජ සම්බන්ධීකරණ කමිටු

සිවිල් සමාජ සම්බන්ධීකරණ කමිටු හරහා ප්‍රාදේශීය මට්ටමින් කොමිෂන් සභාව විසින් පෝෂණය කරන ලද සමීප සහයෝගීතාවය මානව හිමිකම් කඩවීම් හෝ කොමිසමේ මැදිහත්වීම අවශ්‍ය වන අවස්ථා හඳුනා ගැනීමට කොමිසමට සහාය වේ. ඒ ඒ ප්‍රදේශයන්හි මානව හිමිකම් ආරක්ෂා කිරීම අධීක්ෂණය කිරීමේදී මෙම සම්බන්ධීකරණ කමිටු කොමිසමට සහාය වේ. 2020 දී, මෙම රැස්වීම් සඳහා පහසුකම් සැලසීම කොමිෂන් සභාව විසින් අඛණ්ඩව පවත්වා ගෙන යන ලදී.

5.4.2 . මානව හිමිකම් සඳහා වූ ප්‍රජා කාර්යසාධන බලකා

ප්‍රජාවන්ට බිම් මට්ටමේ සිට ඔවුන්ගේ අයිතීන් ආරක්ෂා කර ගැනීමට සහ එම අයිතිවාසිකම් කඩකිරීම්වලට එරෙහිව සහන ලබා ගැනීමේ පහසුකම් සැලසීම සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමේ ප්‍රාදේශීය කාර්යාල විසින් පිහිටුවන ලද මානව හිමිකම් සඳහා වන ප්‍රජා කාර්ය සාධක බලකායන් 2020 තුළ ක්‍රියාත්මක විය. ප්‍රජා කාර්ය සාධක බලකාය සමන්විත වන්නේ කොමිෂන් සභාව සමඟ කටයුතු කිරීමට කැමැත්තක් දැක්වූ ප්‍රජාවේ ස්වේච්ඡා සාමාජිකයින්ගෙනි. ප්‍රජා කාර්ය සාධක බලකායේ සාමාජිකයින් විසින් කොමිෂන් සභාවේ අවධානයට යොමු කරනු ලබන අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමේ අවස්ථාවන්හිදී. කාලෝචිත මැදිහත්වීම් සක්‍රීය කිරීමට හැකි වන අයුරින් කාර්ය සාධක බලකායන් කොමිෂන් සභාව සහ ප්‍රජාවන් අතර සම්බන්ධීකාරකවරයෙකු ලෙස කටයුතු කරයි.

5.4.3 තේමාත්මක අනු කමිටු සාමාජිකයන් සිවිල් සමාජ නියෝජිතයන් ලෙස කටයුතු කිරීම

සිවිල් සමාජයේ සහ සිවිල් සංවිධානවල ක්‍රියාකාරී සාමාජිකයින් තේමාත්මක අනුකමිටු සාමාජිකයින් වන අතර, කොමිසමේ කටයුතු සඳහා වැඩිදුරටත් දායක වේ. කොමිෂන් සභාවේ ප්‍රතිපත්ති මට්ටමේ ප්‍රයත්නයන් හරවත් කිරීම සඳහා සිවිල් සමාජ සාමාජිකයින්ගේ ප්‍රවීණතාවයෙන් සහ පළපුරුද්දෙන් ප්‍රතිලාභ ලබා ගැනීමට අනුකමිටු කොමිසමට අවස්ථාවක් ලබා දේ.

5.4.4 සිවිල් සමාජ සංවිධාන පැවැත්වූ වැඩසටහන් සඳහා සහභාගී වීම

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවෙහි කොමසාරිස්වරුන් සහ කාර්ය මණ්ඩලය සිවිල් සමාජ සංවිධාන විසින් සංවිධානය කරන ලද බොහෝ වැඩසටහන් සඳහා සහභාගී වූහ: එනම්;

- නීතිය සහ සමාජ භාරය (Law & Society Trust) මගින් දකුණු ආසියානු සුළුතර කණ්ඩායම් රාජ්‍ය වාර්තාව එළිදැක්වීම

- ජාත්‍යන්තර කාන්තා දිනය-2020 වෙනුවෙන් කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය (Women & Media Collecion) ආයතනය විසින් සංවිධානය කරන ලද සමරු ගුවන් විදුලි වැඩසටහන.

- එක්සත් ජනපද ආධාර වැඩසටහනේ සංගත විවෘත, ප්‍රතිචාරාත්මක, ඵලදායී යුක්ති වැඩසටහන් (CORE justice) විසින් සංවිධානය කරන ලද නීති සිසුන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක කොටසක් ලෙස ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවෙහි කාර්යභාරය පිළිබඳ දේශනය.

- රයිට් ටු ලයිෆ් (Right to Life) සංවිධානය විසින් එහි ප්‍රාදේශීය සම්බන්ධීකාරකවරුන් සඳහා හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනයේදී සංවිධානය කරන ලද වැඩමුළුව.

- සංක්‍රමණයට දේශගුණික විපර්යාසවල බලපෑම පිළිබඳ සිල්කැන් භාරය (SLYCAN Trust) විසින් සංවිධානය කරන ලද විශේෂඥ උපදේශනය.

- සංක්‍රමණික හඬ එකමුතුව විසින් සංවිධානය කරන ලද කෝවිඩ් -19 වසංගතය තුළ සංක්‍රමණික සේවකයින්ගේ තත්ත්වය පිළිබඳව සිවිල් සමාජ සංවිධාන සහ වෘත්තීය සමිති නියෝජිතයන් අතර සාකච්ඡාවක්.

- ආසියාවේ සංක්‍රමණික සංසදය විසින් සංවිධානය කරන ලද සංක්‍රමණික සේවකයින්ගේ ගැටළු පිළිබඳ මාර්ගගත සාකච්ඡාවක්. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට අමතරව නේපාලය, මාලදිවයින සහ පිලිපීනය යන රටවල මානව හිමිකම් කොමිෂන් සභා නියෝජිතයින් ද මෙම සාකච්ඡාවට එක්ව සිටියහ.

5.4.5 සිවිල් සමාජය සමඟ සාකච්ඡා

වාර්තාකරණ වර්ෂය තුළ කොමිෂන් සභාව සිවිල් සමාජ ආයතන සමඟ විවිධ කරුණු සම්බන්ධයෙන් සාකච්ඡා කිහිපයක් පවත්වන ලදී.

2020-2022 වැඩ සැලැස්ම සහ කොමිෂන් සභාවේ වත්මන් කටයුතු පිළිබඳ සිවිල් සමාජ සංවිධාන සමඟ සාකච්ඡාවක් 2020 පෙබරවාරි 05 දින පැවැත්විණි. සැසියේදී පහත සඳහන් කරුණු සාකච්ඡා කෙරිණි.

- පාසල් සිසුන් සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ප්‍රකාශයට පත් කරන ලද ලිංගිකත්වය පිළිබඳ වැදගත් තොරතුරු ඇතුළත් 'අපේ හතේ පොත' පෙළ පොත සම්බන්ධයෙන් සමාජය තුළ පවතින නිශේධාත්මක අදහස් දුරු කිරීමට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට මැදිහත්වීමේ හැකියාව.

- රාජ්‍ය නොවන සංවිධාන නියාමනය කිරීම සඳහා වන නව නීතිරීතිවලට අදාළව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමේ මැදිහත්වීම.

- මානව හිමිකම් කොමිසම විසින් නිකුත් කරන ලද නිර්දේශ ක්‍රියාත්මක නොකිරීම සම්බන්ධයෙන් වහා පියවර ගැනීමේ අවශ්‍යතාවය.

- මානව හිමිකම් කොමිෂන් සභාවේ ප්‍රාදේශීය කාර්යාල සඳහා දෙමළ භාෂාව පිළිබඳ දැනුමක් ඇති නිලධාරීන් පත් කිරීම.

- 2018 මහනුවර සිංහල මුස්ලිම් ගැටුම සම්බන්ධයෙන් කොමිසමේ විමර්ශනය පිළිබඳ අවසන් වාර්තාව නිකුත් කිරීම කඩිනම් කිරීමේ අවශ්‍යතාවය.

- කොමිෂන් සභාවේ ශක්තිය සහ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා සිවිල් සමාජ සංවිධාන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.

- රටෙහි මානව හිමිකම් තත්ත්වය නිරීක්ෂණය කිරීම පිළිබඳ දෙමුහුන් සාකච්ඡාවක් 2020.08.24 දින කොමිෂන් සභා ප්‍රධාන කාර්යාලයේදී දිවයින පුරා සිවිල් සමාජ සංවිධාන සමඟ පැවැත්විණි. ප්‍රාදේශීය සිවිල් සමාජ සංවිධාන සූම් තාක්ෂණය හරහා සාකච්ඡාවට එක් වූ අතර, මහජන සෞඛ්‍ය මාර්ගෝපදේශ අනුගමනය කරමින් සිවිල් සමාජ සංවිධානවල නියෝජිතයන් කොමිසමට ආරාධනා කරනු ලැබූ අතර, කොමිෂන් සභාව දෙමුහුන් රැස්වීමක් පැවැත්වූ පළමු අවස්ථාව මෙය විය. දේශගුණික විපර්යාස සහ ව්‍යාපාර කරණය සහ මානව හිමිකම් වැනි නවමු කොමිෂන් සභාවේ නීති කවයක් මෙම රැස්වීමේදී ඉස්මතු විය.කෝවිඩ්-19 වසංගතයේ පසුබිම තුළ, සංක්‍රමණික ශ්‍රමිකයන්ගේ අයිතිවාසිකම්, පාරිසරික අයිතිවාසිකම්, සමාජ, සංස්කෘතික සහ ආර්ථික අයිතීන් මෙන්ම සංවර්ධනයෙන් ජනගහනයට ඇති අහිතකර බලපෑම් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරන ලෙස සිවිල් සමාජ සංවිධාන කොමිසමෙන් ඉල්ලා සිටියේය.

- කොමිෂන් සභාව පාරිසරික අයිතිවාසිකම් සම්බන්ධයෙන් කටයුතු කරන සිවිල් සංවිධාන සමඟ විශේෂ සාකච්ඡාවක් 2020.08.19 දින කොමිෂන් සභා පරිශ්‍රයේදී පැවැත්වීය. මෙම සාකච්ඡාව සඳහා උත්ප්‍රේරකය වූයේ ගල්කිස්ස වෙරළ තීරයේ වෙරළ පෝෂණ වැඩසටහන වන අතර, කෝවිඩ්-19 අගුලු දැමීමේ කාල සීමාව තුළ ගල්කිස්ස වෙරළ තීරයේ අතිරේක වැලි තැන්පත් කිරීම් සිදු කරන ලදී. අලුතින් එකතු කරන ලද අවසාදිතය රළ පහරින් සෝදා ගිය අතර, මෙම වැඩසටහන පිටුපස ඇති අභිප්‍රායන් මතභේදයට තුඩු දුන්නේය. ඒ සමගම සිංහරාජ රක්ෂිතය හරහා මාර්ගයක් ඉදිකිරීමේ හා වනාන්තර එළිපෙහෙළි කිරීමේ සිද්ධීන් කිහිපයක් මාධ්‍ය මගින් වාර්තා කිරීම ජනතා විරෝධයට හේතු විය. වැලි සහ පස් ප්‍රවාහන බලපත්‍ර අවශ්‍යතාවය ඉවත් කිරීම; වෙනත් අරමුණු සඳහා 'රක්ෂිත වනාන්තර' ලෙස නම් කර ඇති වනාන්තර අත්පත් කර ගැනීමට ප්‍රාදේශීය ලේකම්වරුන්ට බලය පවරන 02/2005 චක්‍රලේඛය අවලංගු කිරීම; සිංහරාජ රක්ෂිතය හරහා මාර්ගයක් ඉදිකිරීමෙන් සිදුවන පරිසර හානිය, ගල්කිස්ස වෙරළ පෝෂණ වැඩසටහන; සහ පුත්තලම ආනවිලන්දාව තෙත් බිම් අනවසරයෙන් එළිපෙහෙළි කිරීම වැනි කරුණු සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස සිවිල් සමාජ සංවිධාන කොමිසමෙන් ඉල්ලා සිටි. පාරිසරික අයිතිවාසිකම් තේමාත්මක අනුකමිටුවක් සඳහා වන ක්ෂේත්‍රයක් ලෙස පිළිගැනීමට සහ පාරිසරික ගැටළු සඳහා මැදිහත්වීමේ උපාය මාර්ගයක් කාලීන අවශ්‍යතාවයක් ලෙස සකස් කිරීමට කොමිෂන් සභාව එකඟ විය.

- කෝවිඩ්-19 වසංගතය අතරතුර විදේශයන්හි සේවය කරන ශ්‍රී ලාංකික සංක්‍රමණික ශ්‍රමිකයන්ගේ ආරක්ෂාව සහ අයිතිවාසිකම් පිළිබඳව සංක්‍රමණික අයිතිවාසිකම් පිළිබඳව කටයුතු කරන සිවිල් සමාජ සංවිධාන සමඟ සාකච්ඡාවක් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් 2021.09.16 දින පවත්වන ලදී. ආපසු පැමිණෙන සංක්‍රමණික සේවකයින් සඳහා මත්තල ගුවන් තොටුපළේ තොරතුරු කුටි වල අවශ්‍යතාවය ;සංක්‍රමණික සේවකයින් සඳහා වන රක්ෂණාවරණයට කොවිඩ් ආවරණයන් ඇතුළුව ආපසු පැමිණීමෙන් පසු නිරෝධායනය කිරීමේ පිරිවැය සේවකයන්ට පුද්ගලිකව දැරීමට සිදුවීම අබුඩාබි සංවාදය සහ කොළඹ ක්‍රියාවලිය සමඟ කොමිෂමේ සබඳතා ශක්තිමත් කිරීමේ අවශ්‍යතාවය වැනි ගැටලු පිළිබඳව මෙම සාකච්ඡාවේදී අවධානය යොමු කරන ලදී. මේවා කාලීන අවශ්‍යතා වන බැවින්, මෙම ගැටළු පිළිබඳව වගකිවයුතු ආයතන වෙත කඩිනමින් ඉදිරිපත් කරන බව කොමිසම දන්වා සිටියේය.

5.4.6 සිවිල් සමාජය සඳහා පුහුණුව

2020 වසර තුළදී, කෝවිඩ් - 19 වසංගතය මගින් පනවන ලද සීමාවන් නොතකා සිවිල් සමාජයේ සාමාජිකයින් සඳහා පුහුණු සහ සංවේදීකාරක වැඩසටහන් පැවැත්වීමට කොමිෂන් සභාව වෑයම් කළේය. පහත දැක්වෙන්නේ එවැනි පුහුණුවීම්වල සාරාංශයකි.

- මාතර ප්‍රාදේශීය කාර්යාලය මගින් ආබාධ සහිත පුද්ගලයින්ගේ ප්‍රයෝජනය සඳහා සංවිධානය කරන ලද මානව හිමිකම් මූලධර්ම, ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතීන් සහ ආබාධිත අයිතිවාසිකම් පිළිබඳ ශ්‍රී ලාංකේය නීති රාමුව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් 2020 පෙබරවාරි 27 දින පැවැත්විණි.

- කල්මුණේ ප්‍රාදේශීය කාර්යාලය විසින් සංවිධානය කරන ලද ආගමික නායකයින් සහ ප්‍රජාවේ සාමාජිකයින් සඳහා සංහිඳියාව සහ යහපාලනය පිළිබඳ පුහුණු වැඩසටහන 2020 ජුනි 27 වන දින කල්මුණේ දී පැවැත්විණි.

මීට අමතරව, පාසල් සහ විශ්ව විද්‍යාල සිසුන්, ත්‍රිවිධ හමුදාවේ නිලධාරීන්, පොලිස් නිලධාරීන්, රාජ්‍ය නිලධාරීන් සහ රාජ්‍ය නොවන සංවිධානවල නියෝජිතයන් වැනි විශාල පිරිසක් කොමිෂන් සභාව විසින් ප්‍රකාශයට පත් කරන ලද අත් පත්‍රිකා සහ පෝස්ටර් ආදී මානව හිමිකම් පිළිබඳ ප්‍රකාශන ලබා ගැනීම සඳහා පුද්ගලිකව කොමිසම වෙත පැමිණේ. එවැනි අවස්ථාවන්හිදී, කොමිෂන් සභාව මෙම පුද්ගල කණ්ඩායම් දැනුවත් කිරීමේ සාකච්ඡා තම පරිශ්‍රය තුළ පැවැත්වීමේ අවස්ථාව සාදරයෙන් පිළිගනී. 2020 වසර තුළ කොමිෂන් සභාව විසින් සැසිවාර කිහිපයක් පැවැත්වුවද, වසංගතය හේතුවෙන් එවැනි අවස්ථා සංඛ්‍යාත්මකව අඩු විය.

5.5 උපදේශනය

විශේෂයෙන්ම මානව හිමිකම් ප්‍රවර්ධනය සහ ආරක්ෂා කිරීම සඳහා රටේ තරුණ තරුණියන් වෙනුවෙන් ආයෝජනය කිරීම නිවැරදි ඉදිරි පියවරක් බවට වූ විශ්වාසය හේතුවෙන් 2017 වසරේදී නැවත පණ ගැන්වූ සීමාවාසික වැඩසටහන කොමිෂන් සභාව විසින් අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. 2020 වසර තුළ ස්වේච්ඡා පදනමක් මත සේවය කිරීම සඳහා ඕනෑම විෂයයක් පිළිබඳ උපාධි අපේක්ෂකයින් සහ මෑත කාලීන උපාධිධාරීන්ගෙන් අයදුම්පත් කැඳවන ලදී. වැඩසටහනේ අරමුණ වූයේ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවෙහි කාර්යභාරය, පර්යේෂණ ඇතුළු කොමිෂන් සභාවේ ප්‍රවර්ධනය සහ ආරක්ෂණ ක්‍රියාකාරකම් පිළිබඳව සාර්ථක අපේක්ෂකයින්ට අවබෝධයක් ලබා දීම සහ තරුණයින් තුළ මහජන අවශ්‍යතා සඳහා කැපවීම පෝෂණය කිරීමයි. සීමාවාසික පුහුණුව අවම වශයෙන් මාස 3 ක කාලයක් සඳහා වූ අතර, සීමාවාසිකයින්ට අධ්‍යක්ෂවරුන්ගේ හෝ ප්‍රාදේශීය සම්බන්ධීකාරකවරුන්ගේ සමීප අධීක්ෂණය යටතේ ප්‍රධාන කාර්යාලයේ හෝ ප්‍රාදේශීය කාර්යාලයක පුහුණුව ලැබීම තෝරා ගැනීමේ අවකාශයක් තිබුණි. කෙසේ වෙතත්, කෝවිඩ්-19 වසංගතය හේතුවෙන් සීමාවාසිකයින් යොදවා ඇත්තේ 2020 පළමු කාර්තුවේදී පමණි. ඒ අනුව, 2020 පළමු කාර්තුව තුළ සීමාවාසික 26 දෙනෙකු සඳහා දිවයින පුරා සීමාවාසික පුහුණුව ලබා දුන්හ. වැඩසටහන සාර්ථකව නිම කිරීමෙන් පසු, සීමාවාසිකයින්ට සහභාගී වීමේ නිල සහතිකයක් නිකුත් කරනු ලැබේ.

2020 සඳහා සීමාවාසිකයින්ගේ ව්‍යාප්තිය

අදාල කාර්යාලය	සීමාවාසිකයින්ගේ සංඛ්‍යාව
ප්‍රධාන කාර්යාලය	15
මාතර ප්‍රාදේශීය කාර්යාලය	1
මහනුවර ප්‍රාදේශීය කාර්යාලය	5
මඩකලපුව ප්‍රාදේශීය කාර්යාලය	3
කල්මුනේ ප්‍රාදේශීය කාර්යාලය	2

6 වන පරිච්ඡේදය:
ජාත්‍යන්තර සහයෝගීතා

6.1 ජාත්‍යන්තර බැඳීම්වලට අනුකූල වීම ප්‍රවර්ධනය කිරීම

6.2 ප්‍රාදේශීය මානව හිමිකම් සන්ධාන සමඟ සබඳතා ශක්තිමත් කිරීම

6.3 OPCAT යටතේ ජාතික වැළැක්වීමේ යාන්ත්‍රණය ලෙස ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පත් කිරීම

6.4 ජාත්‍යන්තර සංවිධාන සහ විශේෂඥයන් සමඟ වූ වෙනත් සහයෝගිතා

6.4.1. ද්විපාර්ශ්වික හමුවීම්

6.4.2. ලැබූ විදේශ අරමුදල්

ජාත්‍යන්තර සහයෝගීතාවය

6.1 ජාත්‍යන්තර බැඳීම්වලට අනුකූල වීම ප්‍රවර්ධනය කිරීම

කොමිෂන් සභාව විසින් එහි ව්‍යවස්ථාපිත බලතල අනුව ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර මානව හිමිකම් බැඳීම්වලට අනුකූල වීම ප්‍රවර්ධනය කිරීමේදී ජාත්‍යන්තර සහ කලාපීය මානව හිමිකම් සංවිධාන සහ ආරක්ෂණ යාන්ත්‍රණ සමඟ සක්‍රීයව සන්නිවේදනය සහ සහයෝගීතාවය 2020 දී අඛණ්ඩව පවත්වාගෙන යන ලදී.

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලයේ (OHCHR) දූත පිරිස ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත වීමේදී කොමිසම වෙත පිළිගන්නා ලදී. සභාපතිවරයා සහ කොමසාරිස්වරුන් නියෝජිත පිරිස සමඟ අන්‍යෝන්‍ය වශයෙන් අදාළ වන කරුණු සාකච්ඡා කළ අතර ඔවුන් විසින් පෙන්වා දුන් ඇතැම් කරුණු සඳහා ක්ෂණික ප්‍රතිචාර අවශ්‍ය බව පිළිගත්හ. මානව හිමිකම් කවුන්සිලයේ 40/1 යෝජනාවට අනුකූලව 30/1 කවුන්සිලයේ යෝජනාව ක්‍රියාත්මක කිරීමේදී ශ්‍රී ලංකාව තුළ සංහිඳියාව, වගවීම සහ මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීමේදී ලබා ඇති ප්‍රගතිය තක්සේරු කරමින් "ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ස්වාධීන සහ වෘත්තීයමය ආකාරයෙන් මානව හිමිකම් ආරක්ෂා කිරීම සඳහා ක්‍රියාශීලී සහ විවෘතව කටයුතු කර ඇත" යන්න 2020 මානව හිමිකම් පිළිබඳ මහකොමසාරිස් කාර්යාල වාර්තාවෙන් පිළිගත්තේය. 2019 අප්‍රේල් මාසයේ පාස්කු ප්‍රහාරයෙන් පසුව, අධිකතර හෝ වෙනස් කොට සැලකීමේ පියවරයන් වැලැක්වීමෙහිලා වැදගත් කාර්යභාරයක් ඉටු කළ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවෙහි කාලෝචිත මැදිහත්වීම් මහ කොමසාරිස්වරයාගේ පැසසුමට ලක් විය.

6.2 කලාපීය මානව හිමිකම් සන්ධාන සමඟ සබඳතා ශක්තිමත් කිරීම

වාරිත්‍රානුකූලව, කොමිසම 2020 සැප්තැම්බර් 9 වන දින පැවති ආසියා ශාන්තිකර සංසදයෙහි වාර්ෂික මහා සභා රැස්වීමට සහභාගී විය. සංවිධාන ඉතිහාසයේ ප්‍රථම වතාවට ආසියා ශාන්තිකර සංසදයෙහි වාර්ෂික රැස්වීම කෝවිඩ්-19 වසංගතය හේතුවෙන් මාර්ගගත ක්‍රමවේද අනුව පවත්වන ලදී. ආසියා ශාන්තිකර සංසදය යනු ජාතික මානව හිමිකම් ආයතන සඳහා තාක්ෂණික සහාය සපයන කලාපීය සම්මේලනයයි. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ආසියා ශාන්තිකර සංසදයෙහි සාමාජිකයෙකු වන අතර 2020 වාර්ෂික මහ සභා රැස්වීමේදී 'A' තත්ත්ව හිමි වූ මානව හිමිකම් කොමිසමක් ලෙස තීරණ ගැනීම සඳහා සහභාගී විය හැකිය.

6.3 OPCAT යටතේ ජාතික වැළැක්වීමේ යාන්ත්‍රණය ලෙස ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පත් කිරීම

2017 දෙසැම්බර් මාසයේ දී වධහිංසාවට එරෙහි ජාත්‍යන්තර සම්මුතියේ වෛකල්පික සන්ධානයට ශ්‍රී ලංකාව විසින් අපරානුමත කිරීම අනුව, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව, ජාතික වැළැක්වීමේ යාන්ත්‍රණය ලෙස ශ්‍රී ලංකා රජය විසින් නම් කරන ලදී. යටතේ, වැළැක්වීමේ චාරිකා හරහා වධහිංසා පැමිණවීම් සහ වෙනත් ආකාරයේ අත්අඩංගුවේදී සිදුවන අපචාර වැළැක්වීමට උත්සාහ කිරීම සඳහා ජාතික වැළැක්වීමේ යාන්ත්‍රණයක් හෝ කිහිපයක් පිහිටුවීමට රජය බැඳී සිටී. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හට එහි මව් පනත යටතේ පූර්ව අවසරයකින් තොරව රැඳවුම් ස්ථාන වෙත යාමට දැනටමත් නියම කර ඇති අතර බලය ලබා දී ඇත.

2020 ජූනි මාසයේදී, වධහිංසා වැළැක්වීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ අනුකමිටුව සිය හතළිස් එක් වන සැසිවාරය මාර්ගගතව පැවැත් වූ අතර, එය අන්තර්ජාල පරිසරයක් තුළ සම්පූර්ණ සැසියක් සහ සම්පූර්ණ වැඩ සටහනක් සහ විවිධ වේදිකා ක්‍රියාකාරකම් භාවිතා කරන එක්සත් ජාතීන්ගේ පළමු ගිවිසුම් ආයතනය බවට පත් විය. සැසිවාරය අතරතුර පැවති ආසියානු කලාපයේ ඒකාබද්ධ රැස්වීමට කොමිසම සහභාගී විය.

6.4 ජාත්‍යන්තර සංවිධාන සහ විශේෂඥයන් සමඟ වූ වෙනත් සහයෝගිතා

6.4.1 ද්විපාර්ශ්වික රැස්වීම්:

මානව හිමිකම් කොමිෂන් සභාව බහුවිධ ආයතන සමඟ ද්විපාර්ශ්වික රැස්වීම් හරහා සිය ජාත්‍යන්තර සහයෝගීතාව පුළුල් කළේය:

- කොමිෂන් සභාව ශ්‍රී ලංකාවේ විවිධ එක්සත් ජාතීන්ගේ සංවිධාන සමඟ රැස්වීම් සහ අවස්ථාවන් කිහිපයකට සහභාගී විය:

- “වගකිවයුතු ව්‍යාපාර සහ මානව හිමිකම්” යන තේමාව යටතේ 2020 පෙබරවාරි 10 වැනි දින සිවිල් සමාජ සංවිධානවල දත්ත රැස් කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදල විසින් නීතිය සහ සමාජ භාරය එක්ව සංවිධානය කරන ලද වැඩමුළුවට සහභාගී වීම.

- 2020 පෙබරවාරි 20 වැනි දින එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදලේ ඉල්ලීම පරිදි ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ ලිංගික ප්‍රජනන සෞඛ්‍ය සහ අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර උපදේශක ජූලියා කබාසි මහත්මිය හමුවීම.

- 2020 පෙබරවාරි 11 වන දින මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිෂන් සභාවෙහි ක්‍රියාමාර්ගය පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා යුරෝපා සංගමයේ නියෝජිත පිරිස හමුවිය.

- 2020 දී, මානව හිමිකම් කොමිෂන් සභාව විසින් විවිධ පුද්ගලයින් සමග පුද්ගල හෝ මාර්ගගත රැස්වීම් ද පැවැත්වීය:එනම්;
    - ශ්‍රී ලංකාවේ නෝර්වේජියානු තානාපති
    - එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ උපදේශක බ්‍රහ්මී පූලෝගසිංහම් මහත්මිය
    - යුරෝපය සහ ප්‍රංශය සඳහා වූ විදේශ කටයුතු අමාත්‍යාංශයේ ආසියා සහ ඕෂනියා අධ්‍යක්ෂ තියරි මාතෝ මහතා
    - ශ්‍රී ලංකාවේ ඕස්ට්‍රේලියානු මහ කොමසාරිස්
    - කොළඹ ස්විට්සර්ලන්ත තානාපති කාර්යාලයේ දේශපාලන කටයුතු පිළිබඳ පළමු ලේකම්.
    - "වගකිවයුතු ව්‍යාපාර සහ මානව හිමිකම්" යන තේමාව යටතේ ව්‍යාපාර සහ මානව හිමිකම් සම්පත් මධ්‍යස්ථානයේ නියෝජිතයින්.

6.4.2 ලැබූ විදේශ අරමුදල්

මානව හිමිකම් කොමිෂන් සභාව හට මූලික ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා එහි අරමුදල්වලින් බහුතරයක් භාණ්ඩාගාරයෙන් ලැබුණි. එසේ වුවද, මානව හිමිකම් කොමිෂන් සභාව සහ ජාත්‍යන්තර සංවර්ධන හවුල්කරුවන් අතර ඇතිකරගත් සහයෝගිතා තුළින් තම කටයුතු සඳහා මූල්‍ය සහය ලබා ගැනීමට කොමිසමට හැකි විය. ඒ අනුව 2020 දී කොමිෂන් සභාවට එහි බලතල ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට හැකි වන පරිදි කොමිෂන් සභාවේ වැඩසටහන්මය කටයුතු සඳහා, එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලය ස්විට්සර්ලන්ත ෆෙඩරල් රජය සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදල විසින් ලබා දී ඇති සහයෝගිතාව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම පිළිගෙන අගය කරයි.

කොමිසමේ ධාරිතාව ශක්තිමත් කිරීම සඳහා ස්විට්සර්ලන්ත ෆෙඩරල් රජය කොමිෂන් සභාවට අඛණ්ඩව සහයෝගය ලබා දුන්නේය. මෙම ප්‍රදානය හරහා, අතපසු වූ පැමිණිලි ගොඩගැසීමේ ගැටළුව විසඳීමට සහ පැමිණිලිකරුවන්ට ප්‍රතිකර්ම සැපයීමට අවශ්‍ය සම්පත් රැස් කිරීමට කොමිසමට හැකි විය. මෙමගින් ආයතනය කෙරෙහි මහජන විශ්වාසය වැඩි කිරීමට කොමිසමට හැකි වූ අතර, එමගින් එහි ඵලදායිතාවයට අත්‍යවශ්‍ය වන්නා වූ ශ්‍රී ලංකාවේ ජනතාවගේ අවශ්‍යතා සහ උත්සුකයන්ට ප්‍රතිචාර දැක්වීමට ඇති හැකියාව ද විදහා දැක්වීය .

යටිතල පහසුකම් සැපයීම මෙන්ම ධාරිතා ගොඩනැගීම හරහා උප කාර්යාල ශක්තිමත් කිරීම ඉලක්ක කරගත් ව්‍යාපෘතියකට එක්සත් ජාතීන්ගේ සරණාගතයින් පිළිබඳ මහකොමසාරිස් සහාය දැක්වීය. ව්‍යාපෘතියේ අරමුණ වූයේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් ඇතුළු මානව හිමිකම් ගැටලු වලට පිළියම් සෙවීම සඳහා ආපසු පැමිණෙන ජනගහනය, විශේෂයෙන්

අවදානමට ලක්විය හැකි සහ ආන්තික කණ්ඩායම්වලට මානව හිමිකම් කොමිසම වෙත ප්‍රවේශය සක්‍රීය කිරීම සහ ශක්තිමත් කිරීමයි.

එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදල විසින් මානව හිමිකම් තොරතුරු පද්ධතිය (HURIN), ජාත්‍යන්තර මානව හිමිකම් දිනය සඳහා සමාජ මාධ්‍ය ප්‍රචාරණය, කොමිෂන් සභාව සඳහා සන්නාම මාර්ගෝපදේශ සැකසීම සහ කොමිෂන් සභාව සඳහා නව වෙබ් අඩවිය සංවර්ධනය කිරීම සඳහා සෘජු මූල්‍ය ආධාර සපයන ලදී.

7 වන පරිච්ඡේදය:
මානව සම්පත්, පරිපාලන හා මූල්‍ය

7.1. කාර්ය මණ්ඩල සංවර්ධන වැඩසටහන්

7.1.1. මෙරට පුහුණුවීම් අවස්ථා

7.1.2. ජාත්‍යන්තර වැඩසටහන්

7.2. රැකියා හා පුරප්පාඩු

7.3. වාර්ෂික මූල්‍ය ප්‍රකාශන

මානව සම්පත්, පරිපාලනය සහ මූල්‍ය

7.1 කාර්ය මණ්ඩල සංවර්ධන වැඩසටහන්

2015 ඔක්තෝබර් මාසයේදී නිල කාලය අවසන් වන කොමිෂන් සභාවේ නිල කාලය ආරම්භ වූ දා සිට, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා කාර්ය මණ්ඩලයේ වෘත්තීය විශිෂ්ටත්වය සහ ධාරිතාව වර්ධනය කිරීමට වෑයම් කර ඇත. අලුතින් පත් කළ කොමිෂන් සභාව ද එම ගමාතාව පවත්වා ගැනීමට උත්සාහ කර ඇත. මානව හිමිකම් උල්ලංඝනය කිරීම්වලට ඵලදායී ලෙස ප්‍රතිචාර දැක්වීමට සහ මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීමට ආයතනික විශිෂ්ටත්වය අත්‍යවශ්‍ය බව කොමිෂන් සභාව වටහාගෙන ඇත. එබැවින්, කාර්ය මණ්ඩලයේ සේවය අපේක්ෂිත ප්‍රජාවන්ට උපකාර කිරීම පිනිස ප්‍රධාන කාර්යාලයේ මෙන්ම ප්‍රාදේශීය කාර්යාල යන දෙකොට්ඨාශයේම සිටින කාර්ය මණ්ඩලයේ වෘත්තීමයභාවය, කාර්යක්ෂමතාව, අභියෝග පිළිබඳ අවබෝධය සහ අවශ්‍ය සහාය ලබා දීමට තම කුසලතා උපයෝගී කර ගැනීමේ හැකියාව වැඩිදියුණු කිරීම සඳහා දේශීය හා ජාත්‍යන්තර වශයෙන් පවතින බොහෝ පුහුණු අවස්ථා වලින් ප්‍රයෝජන ගැනීම සඳහා ඔවුන් දිරිමත් කරන අතර එසේ කිරීමද අවශ්‍ය කෙරේ. කෝවිඩ්-19 වසංගතය ආරම්භයේ දී පනවන ලද ජාත්‍යන්තර සංචාරක සීමාවන් හේතුවෙන්, කාර්ය මණ්ඩලයට ජාත්‍යන්තර පුහුණු අවස්ථා ලබා ගැනීමට නොහැකි විය.

7.1.1 දේශීය පුහුණු අවස්ථා

- "කාන්තා අයිතිවාසිකම් ද මානව හිමිකම් වේ" යන තේමාව යටතේ 2020 පෙබරවාරි 24-28 දක්වා ස්ත්‍රී පුරුෂ සමාජ භාවය පිළිබඳ පුහුණුකරුවන්ගේ පුහුණු වැඩමුළුවක් පවත්වන ලදී. වැඩමුළුවේ අරමුණ වූයේ ප්‍රධාන කාර්යාලයේ සහ ප්‍රාදේශීය කාර්යාල යන දෙකොට්ඨාශයෙහිම මානව හිමිකම් කොමිෂන් සභා කාර්ය මණ්ඩලයේ ස්ත්‍රී පුරුෂ සමාජ භාවය පිළිබඳ ගැටළු පිළිබඳ දැනුම සහ ධාරිතාව ඉහළ නැංවීමයි. පුහුණුකරුවන් ලෙස පුළුල් ලෙස නිරාවරණය වී ඇති පළපුරුදු සම්පත් දායකයන්ගෙන් පුහුණුවට ඵලදායී දායකත්වයක් ලැබුණි.

- 2020 මාර්තු 06 වන දින මානව හිමිකම් කොමිෂන් සභාව එහි ප්‍රාදේශීය සම්බන්ධීකාරකවරුන් සඳහා කාන්තාවන්ට එරෙහි තාක්ෂණය පදනම් කරගත් හිංසනය මැඩපැවැත්වීම පිළිබඳ පුහුණු වැඩසටහනක් පවත්වන ලදී. පුහුණුවේ අරමුණ වූයේ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ තාක්ෂණයේ ශීඝ්‍ර දියුණුවේ සහ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවසන් කිරීම සඳහා මැදිහත්වීම සහ වැළැක්වීමේ ප්‍රයත්නයන් වැඩි දියුණු කිරීම සඳහා විද්‍යුත් සන්නිවේදන තාක්ෂණය භාවිතා කළ හැකි ආකාරය පිළිබඳව සහභාගිවන්නන් දැනුවත් කිරීමයි.

- ආයතනයේ කාර්යක්ෂම ක්‍රියාකාරිත්වයට අත්‍යවශ්‍ය වන කොමිෂන් සභාවේ ප්‍රාදේශීය කාර්ය මණ්ඩලයේ හැකියාවන් ඉහළ නැංවීමේ අවශ්‍යතාවය හඳුනා ගනිමින්, මානව හිමිකම් කොමිසමෙ හි ප්‍රාදේශීය කාර්යාලවල කාර්ය මණ්ඩලය සඳහා සූම් තාක්ෂණය

ඔස්සේ ඩිජිටල් සාක්ෂරතාව පිළිබඳ මාර්ගගත වැඩමුළු මාලාවක් පවත්වන ලදී. ත්‍රිකුණාමලය, අනුරාධපුරය, යාපනය සහ අම්පාර ප්‍රාදේශීය කාර්යාලවල කාර්ය මණ්ඩලය සඳහා 2020 අගෝස්තු-සැප්තැම්බර් කාලය තුළ මෙම වැඩමුළු පවත්වන ලදී.

- කොමිෂන් සභාවේ පළපුරුදු පරිපාලන නිලධාරියකුගේ සම්පත් දායකත්වයෙන් 2020 සැප්තැම්බර් 30 වැනි දින මානව හිමිකම් කොමිසමේ කාර්ය මණ්ඩලය සඳහා ගොනුකරණය කිරීම පිළිබඳ පුහුණු වැඩසටහනක් පවත්වන ලදී.

- 2020 මාර්තු මාසයේදී මහනුවර සහ බදුල්ල ප්‍රාදේශීය කාර්යාලවල කාර්ය මණ්ඩලයේ හැකියාවන් ඉහළ නැංවීම සඳහා සඳහා ගිණුම්කරණය සහ පරිපාලන උපාය මාර්ග පිළිබඳ තවත් වැඩමුළුවක් පවත්වන ලදී.

7.1.2 ජාත්‍යන්තර පුහුණු වැඩසටහන්

කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලයේ සහ ප්‍රාදේශීය කාර්යාලයන්හි කාර්ය මණ්ඩලය පසුගිය වසරවල බොහෝ ජාත්‍යන්තර පුහුණු වැඩසටහන්වලින් ප්‍රතිලාභ ලබා ඇති අතර, ඒවා කොමිෂන් සභාවේ ධාරිතාව සහ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට දායක වී ඇත. එසේ වුවද, කෝවිඩ් - 19 වසංගතයේ ආරම්භය හේතුවෙන්, වාර්තා කරන වර්ෂය තුළ කාර්ය මණ්ඩලයට කිසිදු ජාත්‍යන්තර පුහුණු වැඩසටහනකට සහභාගී වීමට නොහැකි විය.

7.2 රැකියා සහ පුරප්පාඩු

2018 මැයි මාසයේදී කොමිෂන් සභාවට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත බඳවා ගැනීමේ පරිපාටියේ සියලුම සේවක තනතුරු සඳහා අවසාන අනුමැතිය ලැබුණි. 2019 අවසන් කාර්තුව තුළ අන්තර්ග්‍රහණ ක්‍රියාවලිය පිළිබඳ ලැබුණු උපදෙස් අනුව, 2020 දී කොමිෂන් සභාව 2017.09.18 සිට 2020.09.17 දක්වා උසස්වීම් සඳහා සුදුසුකම් ලැබූ නිලධාරීන්ට නව බඳවා ගැනීමේ පටිපාටියෙහි I අදියර යටතේ උසස්වීම් ලබාදීම ආරම්භ කළේය. අන්තර්ග්‍රහණ ක්‍රියාවලියට අදාළ හිඟ වැටුප් ද 2020 දී සකස් කර අවසන් කරන ලදී. ඔවුන්ටම පුද්ගලික ලෙස අනුමත තනතුරුවල නිලධාරීන් සඳහා සකස් කරන ලද උසස්වීම් යෝජනා ක්‍රමය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර අනුමැතිය ලැබීමට නියමිතය.

පසුගිය වාර්තාකරණ වර්ෂයේදී, කාර්ය මණ්ඩල අන්තර්ග්‍රහණය කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධ දුක්ගැනවිලි සම්බන්ධයෙන් අභියාචනා ඉදිරිපත් කිරීමට මානව හිමිකම් කොමිසමේ කාර්ය මණ්ඩලයට අවස්ථාව සලසා දෙන ලදී. මෙම අභියාචනා සලකා බැලීම සඳහා මානව හිමිකම් කොමිෂන් සභා මණ්ඩලය විසින් පත් කරන ලද අභියාචනා කමිටුව අභියාචනාවලට ප්‍රතිචාර දැක්වීමට පෙර ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සහ ජාතික වැටුප් කොමිෂන් සභාව සමඟ සාකච්ඡා කළේය. අභියාචනා කමිටුව මානව හිමිකම් කොමිසමේ කොමසාරිස්වරුන් දෙදෙනෙකු සහ බාහිර සාමාජිකයෙකු ලෙස විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ සිවිල් සේවයේ නිළධාරියෙකුගෙන් සමන්විත විය. නව බඳවා ගැනීමේ පටිපාටිය ප්‍රකාරව 2020 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි සම්පූර්ණ කාර්ය මණ්ඩලය අන්තර්ග්‍රහණය කර

ගැනීම සඳහා වූ කමිටුවේ නිර්දේශය අනුව, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ වක්‍රලේඛවලට අනුකූලව අර්ධ රාජ්‍ය අංශයට අදාළ වැටුප් කේතයන්ට අනුව සම්පූර්ණ කාර්ය මණ්ඩලයට අදාළ වැටුප් ගෙවීම 2020 ජනවාරි 01 දින ආරම්භ විය.

අධ්‍යක්ෂ තනතුරු 05ක් සඳහා එනම් පරිපාලන සහ මුදල්, විමර්ශන සහ පරීක්ෂණ, අධ්‍යාපන සහ විශේෂ වැඩසටහන්, පර්යේෂණ සහ අධීක්ෂණ, සහ ජාත්‍යන්තර සබඳතා සඳහා වසර තුළ අයදුම්පත් කැඳවන ලදී. ගණකාධිකාරීවරයෙක්; සහ අභ්‍යන්තර විගණකවරයෙකු නව බඳවා ගැනීමේ පටිපාටිය යටතේ කොමිෂන් සභාව සඳහා අනුමත කරන ලදී. මීට අමතරව, නීති නිලධාරීන්ගේ තනතුරු සඳහා අභ්‍යන්තර අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබීය. සියලුම තනතුරු සඳහා සම්මුඛ පරීක්ෂණ පවත්වන ලද අතර නීති නිලධාරීන්ගේ තනතුරු සඳහා තෝරාගත් අභ්‍යන්තර අපේක්ෂකයින් සඳහා පත්වීම් ප්‍රදානය කිරීම 2020 දෙසැම්බර් මාසයේදී ආරම්භ විය.

7.3 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන

ප්‍රධාන ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා කොමිෂන් සභාවට අරමුදල්වලින් බහුතරයක් භාණ්ඩාගාරයෙන් ලැබුණි. 2020 දී කොමිසමේ ක්‍රමලේඛන කටයුතු සඳහා එක්සත් ජාතීන්ගේ සරණාගතයින් පිළිබඳ මහ කොමසාරිස් සහ සුවිස් ෆෙඩරල් රජය විසින් ලබා දුන් සහයෝගය කොමිසම පිළිගෙන අගය කරයි.

බාහිර පරිත්‍යාගශීලීන් විසින් ලබාදෙන මූල්‍යාධාර පහත පරිදි වේ.

ආධාර ආයතනය	ලැබුණු මුදල	වියදම	ශේෂය
සුවිස් ෆෙඩරල් රජය	1,351,000.00	341,810.92	1,009,189.08
එක්සත් ජාතීන්ගේ සරණාගතයින් පිළිබඳ මහ කොමසාරිස්	4,545,750.00	1,482,552.52	3,063,197.48

(බාහිර පරිත්‍යාගශීලීන් විසින් ලබා දෙන මූල්‍ය ආධාර පිළිබඳ වැඩි විස්තර සඳහා කරුණාකර 6.4.2 බලන්න

සමස්ත වාර්ෂික මූල්‍ය ප්‍රතිපාදන:

ආරම්භක ශේෂය	රු. 0.00
භාණ්ඩාගාරයෙන් ලැබුණු අක්මුදල	
පුනරාවර්තන	201,445,000.00
ප්‍රාග්ධන	4,920,736.00
තැන්පත් ගිණුමේ ශුද්ධ වෙනස	1,970,575.93
වෙනත් ලැබීම්	1,059,525.89
සමස්ත ලැබීම්	**209,395,837.82**
වියදම	
වැටුප්	128,184,522.72
ගමන් වියදම්	668,056.00
සැපයුම්	4,644,935.27
නඩත්තු වියදම්	2,442,922.68
සේවා	65,617,808.55
පැවරුම්	1,758,606.50
මානව හිමිකම් වැඩසටහන්	2,272,659.01
ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය සහ වැඩි දියුණු කිරීම	301,828.65
ප්‍රාග්ධන වත්කම් ප්‍රතිග්‍රහණය	1,446,135.00
ධාරිතා වර්ධනය	234,000.00
ශ්‍රී ලංකාවේ සාමය ගොඩනැගීම සඳහා උත්ප්‍රේරක සහාය එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදල **(UNDP)**	-
ආපසු පැමිණෙන්නන්ට ඔවුන්ගේ අයිතිවාසිකම් වෙත ප්‍රවේශ වීමට හැකියාව ලබා දීම **(UNHCR)**	1,482,552.52
මානව හිමිකම් කොමිසමේ ධාරිතාව ශක්තිමත් කිරීම් **(SWISS)**	341,810.92
සමස්ත වියදම	**209,395,837.82**

උපග්‍රන්ථ

ශ්‍රී ලංකාව තුළ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ව්‍යාප්තිය: සිතියම

නිර්දේශ ලැයිස්තුව

	පැමිණිලි අංකය	නිකුත්කළ දිනය	ලත් පැමිණිලි වර්ගය	උල්ලංඝනය වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා වගන්ති/ය	වගඋත්තරකරු
1	HRC/AP/272/17	3/1/2020	රැකියා උසස්වීම්	12(1) වගන්තිය	ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව (SLBC)
2	HRC/2066/16	3/1/2020	විනය පරීක්ෂණයේ ප්‍රමාදය	12(1) වගන්තිය	කොළඹ විශ්ව විද්‍යාලය
3	HRC/1915/15	24/1/2020	පාසැලට දරුවන් ඇතුලත් කිරීම	12(1) වගන්තිය	රිච්මන්ඩ් විද්‍යාලය ගාල්ල
4	HRC/5033/14	24/1/2020	පාසැලට දරුවන් ඇතුලත් කිරීම	12(1) වගන්තිය	රිච්මන්ඩ් විද්‍යාලය ගාල්ල
5	HRC/AP/535/17	24/1/2020	පාසැලට දරුවන් ඇතුලත් කිරීම	12(1) වගන්තිය	රඹෑව මධ්‍ය විද්‍යාලය, අනුරාධපුරය්
6	HRC/AM/61/18/B	24/1/2020	රැකියා උසස්වීම්	12(1) වගන්තිය	පොලිස්පති/බදුල්ල පොලීසිය
7	HRC/AM/25/17 HRC/AM/26/17 HRC/AM/27/17	24/1/2020	රැකියා උසස්වීම්	12(1) වගන්තිය	සෞඛ්‍ය අමාත්‍යාංශය සහ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය
8	HRC/AM/75/17	19/2/2020	රැකියා උසස්වීම්	12(1) වගන්තිය	ස්‍රී ලංකා මහවැලි අධිකාරිය
9	HRC/260/19	3/3/2020	පාසැලට දරුවන් ඇතුලත් කිරීම	12(1) වගන්තිය	ෆර්ග්‍යුසන් උසස් විද්‍යාලය,රත්නපුර
10	HRC/3756/16	10/3/2020	රැකියා උසස්වීම්	12(1) වගන්තිය	රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව
11	HRC/3088/18	2/7/2020	පාසැලට දරුවන් ඇතුලත් කිරීම	12(1)	ඩී.එස්.සේනානායක විද්‍යාලය, කොළඹ 7
12	HRC/2501/17 HRC/2503/17	2/7/2020	වධහිංසා කිරීම	11 වගන්තිය	ඇහැලියගොඩ පොලීසිය

13	HRC/AP/23/18 HRC/AP/24/18	2/7/2020	රැකියාවෙන් නෙරපීම	12(1) වගන්තිය	මාර්ග සංවර්ධන සේවා අධිකාරිය, වයඹ පළාත
14	HRC/K/130/SUO/MOTU/18	2/7/2020	වධහිංසා කිරීම	11 වගන්තිය	නයාපාන මහා විද්‍යාලය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, කොත්මලේ
15	HRC/K/685/16	2/7/2020	පාසැලට දරුවන් ඇතුලත් කිරීම	12(1) වගන්තිය	කින්ග්ස්වුඩ් විද්‍යාලය, මහනුවර
16	HRC/3258/18 HRC/3256/18	2/7/2020	පාසැලට දරුවන් ඇතුලත් කිරීම	12(1) වගන්තිය	තර්ස්ටන් විද්‍යාලය, කොළඹ 3 රාජකීය විද්‍යාලය, කොළඹ 7
17	HRC/AP/220/14	1/7/2020	අත්අඩංගුවට ගැනීම/රදවා ගැනීම	13(1) වගන්තිය	අනුරාධපුර පොලීසිය
18	HRC/K/502/16A	1/7/2020	පාසැලට දරුවන් ඇතුලත් කිරීම	12(1) වගන්තිය	කින්ග්ස්වුඩ් විද්‍යාලය, මහනුවර
19	HRC/K/577/16	1/7/2020	පාසැලට දරුවන් ඇතුලත් කිරීම	12(1) වගන්තිය	කින්ග්ස්වුඩ් විද්‍යාලය, මහනුවර
20	HRC/300/19	17/7/2020	පාසැලට දරුවන් ඇතුලත් කිරීම	12(1) වගන්තිය	රාජකීය විද්‍යාලය, කොළඹ 7, මහානාම විද්‍යාලය, කොළඹ 3
21	HRC/3298/18	17/7/2020	පාසැලට දරුවන් ඇතුලත් කිරීම	12(1) වගන්තිය	ආනන්ද විද්‍යාලය, කොළඹ 10
22	HRC/4537/14 HRC/83/16	17/7/2020	විශ්‍රාම වැටුප්	12(1) වගන්තිය	දුම්‍රිය දෙපාර්තමේන්තුව
23	HRC/155/13	17/7/2020	සේවා කොන්දේසි	12(1) වගන්තිය	පොලිස්පති
24	HRC/BD/146/12	12/8/2020	විශ්‍රාම ප්‍රතිලාභ	Article 12(1) වගන්තිය	පළාත් මහ රෝහල, බදුල්ල සෞඛ්‍ය අමාත්‍යාංශය
25	HRC/2304/18	12/8/2020	වධහිංසා කිරීම	11 වගන්තිය	මොරොන්තුඩුව පොලිසිය
26	HRC/3397/17	24/8/2020	විශ්‍රාම වැටුප්	12(1) වගන්තිය	ශ්‍රී ලංකා මහ බැංකුව
27	HRC/MT/286/18	7/9/2020	පාසැලට දරුවන් ඇතුලත් කිරීම	12(1) වගන්තිය	රාහුල විද්‍යාලය, මාතර

28	HRC/1859/15	15/9/2020	රැකියා උසස්වීම්	12(1) වගන්තිය	කමකරු දෙපාර්තමේන්තුව
29	HRC/3506/16	15/9/2020	මහජන අධිකාරියේ අක්‍රියත්වය	12(1) වගන්තිය	ප්‍රාදේශීය ලේකම්, හංවැල්ල/ තක්සේරු දෙපාර්තමේන්තුව
30	HRC/K/692/18	15/9/2020	පාසැලට දරුවන් ඇතුලත් කිරීම	12(1) වගන්තිය	ධර්මරාජ විද්‍යාලය, මහනුවර
31	HRC/AM/34/19	15/9/2020	රැකියා උසස්වීම්	12(1) වගන්තිය	කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
32	HRC/3767/15	15/9/2020	වධහිංසා කිරීම	11 වගන්තිය	කොහුවල පොලීසිය
33	HRC/AM/97/17	15/9/2020	රැකියා උසස්වීම්	12(1) වගන්තිය	අම්පාර මහ රෝහල /සෞඛ්‍ය අමාත්‍යාංශය
34	HRC/1373/16	15/9/2020	මත්පැන් බලපත්‍රයක් අවලංගු කිරීම	12(1) වගන්තිය	සුරාබදු දෙපාර්තමේන්තුව
35	HRC/269/19	16/9/2020	පාසැලට දරුවන් ඇතුලත් කිරීම	12(1) වගන්තිය	රාජකීය විද්‍යාලය, කොළඹ 7
36	HRC/2195/17	14/10/2020	පාසැලට දරුවන් ඇතුලත් කිරීම	12(1) වගන්තිය	යසෝදරා දේවි බාලිකා විද්‍යාලය, ගම්පහ
37	HRC/AM/123/16	14/10/2020	රැකියාව අවසන් කිරීම	12(1) වගන්තිය	අමිසිරි ගුණරත්න පිරිවෙන,මහඔය
38	HRC/AP/384/16	14/10/2020	වධහිංසා කිරීම	11 වගන්තිය	අනුරාධපුර පොලීසිය
39	HRC/V/25/19	16/11/2020	අත්අඩංගුවට ගැනීම/රදවා ගැනීම	13(1) වගන්තිය	වව්නියාව පොලීසිය
40	HRC/1450/19	11/11/2020	පාසැලට දරුවන් ඇතුලත් කිරීම	12(1) වගන්තිය	කෑගල්ල බාලිකා විද්‍යාලය, කෑගල්ල
41	HRC/4347/16	11/11/2020	අත්අඩංගුවට ගැනීම/රදවා ගැනීම	13(1) වගන්තිය	කුලියාපිටිය පොලීසිය
42	HRC/AP/104/16	11/11/2020	බඳවා ගැනීම්	12(1) වගන්තිය	ලංකා විදුලිබල මංඩලය
43	HRC/K/541/16	11/11/2020	පාසැලට දරුවන් ඇතුලත් කිරීම	12(1) වගන්තිය	කින්ග්ස්වුඩ් විද්‍යාලය, මහනුවර

44	HRC/51/18	11/11/2020	පාසැලට දරුවන් ඇතුලත් කිරීම	12(1) වගන්තිය	නාලන්ද විද්‍යාලය, කොළඹ 10
45	HRC/K/30/11	14/12/2020	වධහිංසා කිරීම	11 වගන්තිය	විල්ගමුව පොලීසිය
46	HRC/BD/62/15	14/12/2020	අත්අඩංගුවට ගැනීම/රදවා ගැනීම	13(1) වගන්තිය	කළුතර උතුර පොලීසිය
47	HRC/887/15	14/12/2020	වධහිංසා කිරීම	11 වගන්තිය	මරදාන පොලීසිය
48	HRC/5244/16	14/12/2020	පාසැලට දරුවන් ඇතුලත් කිරීම	12(1) වගන්තිය	මලියදේව බාලක විද්‍යාලය, කුරුණෑගල
49	HRC/2763/19	14/12/2020	පාසැලට දරුවන් ඇතුලත් කිරීම	12(1) වගන්තිය	රාජකීය විද්‍යාලය, කොළඹ 7
50	HRC/AP/473/14(I)	9/12/2020	වධහිංසා කිරීම	11 වගන්තිය	අනුරාධපුර පොලීසිය
51	HRC/1025/19	9/12/2020	පාසැලට දරුවන් ඇතුලත් කිරීම	12(1) වගන්තිය	ධම්මිස්සර ජාතික පාසැල, නාත්තන්ඩිය
52	HRC/3010/18	10/12/2020	පාසැලට දරුවන් ඇතුලත් කිරීම	12(1) වගන්තිය	සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලය, කොළඹ 7
53	HRC/760/20	9/12/2020	පාසැලට දරුවන් ඇතුලත් කිරීම	12(1) වගන්තිය	මහමායා බාලිකා විද්‍යාලය, මහනුවර
54	HRC/757/17	9/12/2020	බඳවා ගැනීම්	12(1) වගන්තිය	ජාතික තරුණ සේවා සභාව
55	HRC/639/17	23/12/2020	අත්අඩංගුවට ගැනීම/රදවා ගැනීම	e 13(1) වගන්තිය	පොලිස්පත් /සියඹලාණ්ඩුව පොලීසිය
56	HRC/2314/15	10/12/2020	රැකියා උසස්වීම්	12(1) වගන්තිය	ශ්‍රී ලංකා නාවුක හමුදාව
57	HRC/1925/13	9/12/2020	වධහිංසා කිරීම	11	බුත්පිටිය මහා විද්‍යාලය, බුත්පිටිය්
58	HRC/1148/19	9/12/2020	වෙනස්කොට සැළකීම	12(1) වගන්තිය	කොළඹ විශ්ව විද්‍යාලය
59	HRC/2404/28	3/12/2020	බලය අයුතු ලෙස භාවිතා කිරීම	12(1) වගන්තිය	ක්‍රීඩා අමාත්‍යාංශය
60	HRC/2571/18 HRC/2572/18	3/12/2020	පාසැලට දරුවන් ඇතුලත් කිරීම	12(1) වගන්තිය	සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලය, කොළඹ 7

සිදුකළ ස්වයං සිද්ධි විමසුම් ලැයිස්තුව

(පනතේ 14 වන වගන්තිය යටතේ තම බලය භාවිතා කරමින් කොමිෂන් සභාව කළ මැදිහත්වීම්):

	දිනය	නඩු අංකය	විෂය	වගඋත්තරකරු
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලය				
1	17/2/2020	HRC/SUO/MOTU/01/2020	ජනවර්ගය මත පදනම්ව වෙනස් ලෙස සැළකීම	නාලන්ද විද්‍යාලයය, කොළඹ 5
2	4/3/2020	HRC/SUO/Motu/02/20	සේවයේ නැවත පිහිටුවීම	ජාතික නිවාස සංවර්ධන අධිකාරිය
3	4/3/2020	HRC/Suo/Motu/03/20	හිතුවක්කාර ලෙස අත් අඩංගුවට ගෙන පහර දීම	ශ්‍රී ලංකා පොලිසිය
4	6/3/2020	HRC/SUO/MOTU/04/20	වධහිංසා කිරීම	සිරි සීවලී ප්‍රාථමික විද්‍යාලය සහ පානදුර දකුණ පොලිසිය
5	14/5/2020	HRC/SUO/MOTU/05/20 HRC/TEM/SUO/MOTU/01/20	වධහිංසා කිරීම	ග්‍රෑන්ඩ්පාස් පොලිසිය
6	14/5/2020	HRC/SUO/MOTU/06/20 HRC/TEM/SUO/MOTU/16/20	වෙරළ පෝෂණ වැඩසටහනේ පාරිසරික බලපෑම	වෙලළ සංරක්ෂණ සහ වෙරළබඩ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව, රත්මලාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, භූවිද්‍යා සමීක්ෂණ සහ කැණීම් කාර්යංශය, මධ්‍යම පරිසර

				අධිකාරිය, දෙහිවල ගල්කිස්සමහ නගර සභාව, නාගරික සංවර්ධන අධිකාරිය, සහ ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන ආයතනය.
7	14/5/2020	HRC/SUO/MOTU/07/20 HRC/1391/20	වධහිංසා කිරීම	බන්ධනාගාර දෙපාර්තමේන්තුව මහර බන්ධනාගාරය
8	20/5/2020	HRC/SUO/MOTU/08/20	පොලීසිය හිරිහැර කිරීම	වේයන්ගොඩ පොලිසිය
9	20/5/2020	HRC/SUO/MOTU/09/20	අත්අඩංගුවට ගැනීම/රදවා ගැනීම	මෝදර පොලීසිය
10	20/5/2020	HRC/SUO/MOTU/10/20	වධහිංසා කිරීම	හංවැල්ල පොලීසිය
11	20/5/2020	HRC/SUO/MOTU/11/20 HRC/903/20	කොවිඩ්-19 අරමුදලට වැටුප් දායකත්වය	රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය
12	20/5/2020	HRC/SUO/MOTU/12/20	වධහිංසා කිරීම	අඹගහ හන්දිය පොලීස් මුරපොල
13	20/5/2020	HRC/SUO/MOTU/13/20	හිරිහැර කිරීම	අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව
14	20/5/2020	HRC/SUO/MOTU/14/20	අත්අඩංගුවට ගැනීම/රදවා ගැනීම	වරාය පොලීසිය
15	20/5/2020	HRC/SUO/MOTU/15/20	අත්අඩංගුවේ සිටියදී මරණයට පත්වීම	නාරාහේන්පිට පොලීසිය
16	17/7/2020	HRC/SUO/MOTU/16/20	අනීතික මරණය	අහුලාන පොලීසිය
17	3/9/2020	HRC/SUO/MOTU/17/20	අත්අඩංගුවේ සිටියදී මරණයට පත්වීම	අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මොනරාගල, ගම්පහ, අහුලාන, මුල්ලේරියාව, ඔරුතොට, සහ නවගමුව පොලීසිය
18	21/9/2020	HRC/SUO/MOTu/18/20 HRC/2202/20	වධහිංසා කිරීම	වැලිකඩ පොලීසිය

19	14/10/2020	HRC/SUO/MOTU/19/20 HRC/2564/20 HRC/2510/20	අත්අඩංගුවේ සිටියදී මරණයට පත්වීම	කොළඹ අපරාධ කොට්ඨාශය
20	5/11/2020	HRC/SUO/MOTU/20/20	අත්අඩංගුවේ සිටියදී මරණයට පත්වීම	නවගමුව පොලීසිය
21	25/11/2020	HRC/SUO/MOTU/21/20	වධහිංසා කිරීම	මාර්ග සංවර්ධන අධිකාරිය (බස්නාහිර පළාත)
22	1/12/2020	HRC/SUO/MOTU/22/20	සිරකරු අයිතිවාසිකම්	බන්ධනාගාර දෙපාර්තමේන්තුව සහ මහර බන්ධනාගාරය
23	14/10/2020	HRC/SUO/MOTU/23/20	වධහිංසා කිරීම	පූගොඩ පොලීසිය
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම - ප්‍රාදේශීය කාර්යාල				
24	21/01/2020	HRC/JA/SUOMOTU/001/2020	වධහිංසා කිරීම	කයිට්ස් පොලීසිය
25	07/02/2020	HRC/JA/SUOMOTU/002/2020	විශ්ව විද්‍යාල තුළ නවක වදය	යාපනය විශ්ව විද්‍යාලය
26	10/02/2020	HRC/JA/SUOMOTU/003/2020	ළමයෙකුට ශාරීරික දඬුවම් පැමිණවීම	කලාප අධ්‍යාපන කාර්යාලය - වඩමාරච්චිය
27	18/02/2020	HRC/JA/SUOMOTU/004/2020	විශ්ව විද්‍යාල තුළ නවක වදය	යාපනය විශ්ව විද්‍යාලය
28	04/03/2020	HRC/JA/SUOMOTU/005/2020	රාජ්‍ය සුබසාධනය	සමුර්දි සංවර්ධන නිළධාරි සහ , ප්‍රාලේ මරුතන්කර්නි ප්‍රාලේ කොට්ඨාශය
29	12/04/2020	HRC/JA/SUOMOTU/006/2020	වධහිංසා කිරීම	පූනරින් මුහුදේ ශ්‍රී ලංකා නාවුක හමුදාව
30	20/04/2020	HRC/JA/SUOMOTU/007/2020	බලය අයුතු ලෙස භාවිතා කිරීම	සතොස - කිළිනොච්චි
31	20/04/2020	HRC/JA/SUOMOTU/008/2020	වධහිංසා කිරීම	වඩුක්කෝඩ්ඩෙයි පොලීසිය
32	22/04/2020	HRC/JA/SUOMOTU/009/2020	සංචරණ නිදහස	ශ්‍රී ලංකා යුධ හමුදාව
33	26/04/2020	HRC/JA/SUOMOTU/010/2020	වධහිංසා කිරීම	වඩුක්කෝඩ්ඩෙයි පොලීසිය
34	15/05/2020	HRC/JA/SUOMOTU/011/2020	ළමා දූෂණය	
35	21/05/2020	HRC/JA/SUOMOTU/012/2020	වධහිංසා කිරීම	ශ්‍රී ලංකා නාවුක හමුදාව

36	21/06/2020	HRC/JA/SUOMOTU/013/2020	අනීතික මිනීමැරුම	ශ්‍රී ලංකා යුධ හමුදාව
37	21/08/2020	HRC/JA/SUOMOTU/014/2020	ගොඩනැගිලි වෙත ප්‍රවේශ වීමට ආබාධිත පුද්ගලයින්ට ඇති අයිතිය	ලංකා බැංකුව, උරුම්පිරෙයි ශාඛාව
38	16/04/2020	HRC/SUOMOTU/01/95/20(S)	අත්අඩංගුවේ සිටියදී මරණයට පත්වීම	බන්ධනාගාර අධිකාරී, අනුරාධපුරය
39	16/04/2020	HRC/SUOMOTU/02/96/20(s)	අත්අඩංගුවේ සිටියදී මරණයට පත්වීම	ස්ථාන භාර නිළධාරී, පොල්පිතිගම පොලිසිය
40	08/12/2020	HRC/SUOMOTU/03/355/20(s)	බලහත්කාරයෙන් කඩා බිඳ දැමීම	වන සත්ව දෙපාර්තමේන්තුව
41	06/01/2020	HRC/K/20/SUOMOTU/20-W	අත්අඩංගුවේ සිටියදී මරණයට පත්වීම	බන්ධනාගාර නිළධාරී, කෑගල්ල බන්ධනාගාරය
42	03/02/2020	HRC/K/58/SUOMOTO/20-A	වධහිංසා කිරීම	බන්ධනාගාර නිළධාරී, දුම්බර බන්ධනාගාරය
43	26/10/2020	HRC/K/441/SUOMOTO/20-W	වධහිංසා කිරීම	පූජාපිටිය පොලිසිය
44	03/01/2020	HRC/MT/SUOMOTO/01/20/V	මහජන පීඩාව	වැලිගම ක්ලීනින්ග් සර්විස් හිමිකරු, ස්ථාන භාර නිළධාරී- කොටවිල, මහජන සෞඛ්‍ය පරීක්ෂක- කඹුරුගමුව, ප්‍රාදේශීය ලේකම්- වැලිගම, මධ්‍යම පරිසර අධිකාරිය- මාතර, ප්‍රාදේශීය සභාව-වැලිගම
45	02/03/2020	HRC/MT/SUOMOTO/02/20/G	පහරදීම	පොලිස් විශේෂ කාර්ය බලකාය, සූරියවැව
46	08/06/2020	HRC/MT/SUOMOTO/03/20/V	අත්අඩංගුවට ගැනීම/රදවා ගැනීම	ස්ථාන භාර නිළධාරී, අකුරැස්ස පොලිසිය
47	19/06/2020	HRC/MT/SUOMOTO/04/20/V	අත්අඩංගුවේ සිටියදී මරණයට පත්වීම	ස්ථාන භාර නිළධාරී, හික්කඩුව පොලිසිය
48	04/12/2020	HRC/MT/SUOMOTO/05/20/N	පහරදීම	හුංගම පොලිසිය
49	21/12/2020	HRC/MT/SUOMOTO/06/20/N	පොලිස් කෘරත්වය	ස්ථාන භාර නිළධාරී, ගන්දර පොලිසිය

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. ජේපීඒ/ඊ/එච්ආර්සී/2020/එෆ්ඒ/25

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2021 ජූනි/4 දින.

ලේකම් (ප්‍රධාන ගණන්දීමේ නිලධාරී)
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 **තත්ත්වාගණනය කළ මතය**

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ

එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප නොවේ.

(ආ) මෙම වාර්තාවේ අංක 1.6.2.1.(අ) දරන ඡේදයේ ඇතුලත් නිරීක්ෂණය සම්බන්ධයෙන් ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී නිවැරදි කර නොතිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2020 වර්ෂය සඳහා වැටුප් චේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ වැය ලෙජරය අනුව රු.128,852,579 ක් වුවත් ඉදිරිපත් කර තිබුණු මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ එය රු.128,184,523 ක් ලෙස දක්වා තිබුණි.

(ආ) 2020 වර්ෂය සඳහා අනෙකුත් භාණ්ඩ හා සේවා වියදම් වැය ලෙජරය අනුව රු.74,978,326 ක් වුවත් ඉදිරිපත් කර තිබුණු මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ එය රු.75,646,381 ක් ලෙස දක්වා තිබුණි.

1.6.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

1.6.2.1 මූල්‍ය නොවන වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සියළු වත්කම් මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ ඇතුළත් කළ යුතු වුවත් 2004 ජනවාරි 01 දිනෙන් පසු අත්පත් කර ගත් වත්කම් පමණක් මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ ඇතුළත් කර තිබුණු අතර 2004 වර්ෂයට පෙර පැවති වත්කම් ඇතුළත් කර නොතිබුණි.

(ආ) ප්‍රවාහන උපකරණ වටිනාකම්, භාණ්ඩාගාර මුද්‍රිත සටහන් හා කොමිෂන් සභාවේ වාහන ලේඛනය අතර රු.7,552,881ක වෙනසක් පැවතුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුල ජනාධිපති ලේකම් කාර්යාලය වෙත පවරා දී තිබුණු වාහනයක හා අපහරණය කරන ලද වාහනයක පිරිවැය මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශනයෙන් ඉවත් කර නොතිබුණි.

(ඈ) ඉකුත් වර්ෂයේදී මිලදී ගන්නා ලද වාහනයක පිරිවැය ප්‍රාග්ධනීත කිරීමට 2021 පෙබරවාරි 28 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

1.6.3 ලේඛණ හා පොත්පත් පවත්වා නොකිබීම

මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව රජයේ සෑම ආයතනයක් විසින් ම මුදල් රෙගුලාසි 102 යටතේ වන හානි පිළිබඳ වාර්තා කරනු ලැබුවා වූ හෝ නොකරනු ලැබුවා වූ හෝ අත්තිකාරම් ගිණුම්වල හානි සහ වෙනත් කටයුතුවලදී සිදු වන හානි පිළිබඳ විස්තර සටහන් පවත්වා ගෙන යාම සඳහා වෙන වෙනම පොත් දෙකක් පවත්වාගෙන යා යුතු වුවත් ආයතනය විසින් එවැනි හානි පිළිබඳ පොත්පත් ලේඛන කිසිවක් පවත්වා ගෙන ගොස් නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 770	කොමිෂන් සභාව විසින් වාහන පිළිබඳ සමීක්ෂණයක් සිදු කර නොතිබුණි.
(ආ) 2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12 ඡේදය	අපහරණය කළයුතු වාහන හඳුනාගෙන ඒ පිළිබඳ ඉදිරි කටයුතු සිදුකර නොතිබුණි.

(ඇ)	**2016** දෙසැම්බර් **29** දිනැති අංක **30/2016** රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	
	(i) 3.1 ඡේදය	වාහන සම්බන්ධයෙන් ඉන්ධන පරීක්ෂාවන් සිදු කර නොතිබුණි.
	(ii) 5.1 ඡේදය	වාහනවල ලොග් සටහන් පොත්වල ඇතුලත් කළයුතු අනිවාර්ය තොරතුරු ඇතුළත් කර නොතිබුණි.
(ඇ)	2017 ජුනි මස 28 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය	වාහන පිළිබඳව යාවත්කාලීන කරන ලද තොරතුරු ඇතුළත් කරමින් වාහන ලැයිස්තුවක් සකස් කර නොතිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 සැලසුම් කිරීම

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2020 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

3.1.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

2020 ජනවාරි 01 දිනට විසඳීම සඳහා පැමිණිලි 4,266 ක් ඉතිරිව තිබුණු අතර 2020 වර්ෂය තුල පැමිණිලි 6,284 ක් ලැබී තිබුණි. ඉන් පැමිණිලි 3,812 ක් 2020 වර්ෂය තුල විසඳා තිබුණු අතර 2020 දෙසැම්බර් 31 දිනට විසඳීම සඳහා පැමිණිලි 6,738 ක් ඉතිරිවී තිබුණි. මින් පැමිණිලි 1,804 ක් වර්ෂ 3 ත් වර්ෂ 10ත් අතර කාලය තුල ලැබුණු හා පැමිණිලි 23 ක් වසර 10 ට වැඩි කාලයක් තුල ලැබුණු පැමිණිලි වූ අතර පැමිණිලි 2,134 ක් වර්ෂ 01ත් වර්ෂ 03ත් අතර කාලය තුල ලැබුණු ඒවා විය.

3.1.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2020 අගෝස්තු 28 දිනැති 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16.2 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු 2020 වර්ෂය සඳහා වූ කාර්යසාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමඟ විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

3.2 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රාජ්‍ය නොවන සංවිධාන විසින් ලබාදුන් වාහන 03 ක පිරිවැය ප්‍රාග්ධනිත කර නොතිබුණු අතර එලෙස පරිත්‍යාග ලෙස ලැබූ දැනට නොමැති එක් වාහනයක පිරිවැය ඉවත් කර නොතිබුණි.

(ආ) යතුරු පැදි 04 ක් ප්‍රධාන කාර්යාල පරිශ්‍රය තුල ධාවනයෙන් තොරව ගාල් කර පැවතුනි.

(ඇ) ඡායාපිටපත් යන්ත්‍ර 02 ක් භාවිතයකින් තොරව නිශ්ක්‍රීයව පැවතුනි.

(ඈ) 2014 වර්ෂයේදී ලංකා බැංකු මූල්‍ය පහසුකම් යටතේ භාණ්ඩාගාරය විසින් ලබා දී තිබුණු මෝටර් රථ 03 හි කල් බදු කාලය අවසන්ව පැවතියද 2021 මාර්තු 23 දින වන විටත් එම වාහන 03 හි අයිතිය පවරා ගැනීමට අපොහොසත් වී තිබුණි.

(ඉ) කොමිෂන් සභාව නමින් ලියාපදිංචි වූ වාහන 19 ක පිරිවැය තහවුරු කර ගැනීමට නොහැකි වූ අතර වාහන 20 ක පිරිවැය සිගාස් වැඩසටහන යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ඊ) 2019 වර්ෂය සඳහා සිදුකර තිබුණු භාණ්ඩ සමීක්ෂණය අනුව ප්‍රධාන කාර්යාලයේ සමීක්ෂණ වාර්තාවල අදාල භාණ්ඩ පවත්නා අංශය සඳහන් කර නොතිබුණු බැවින් එම භාණ්ඩ භෞතිකව පවතින අංශය තහවුරු කර ගැනීමට නොහැකි විය.

(උ) 2018 හා 2019 වර්ෂවල සිදුකළ භාණ්ඩ සමීක්ෂණවලදී අපහරණය කිරීමට නිර්දේශ කළ භාණ්ඩ අපහරණය කර එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණු අතර 2018 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයේදී විකිණීම, අලුත්වැඩියා කිරීම සහ භාවිතයෙන් ඉවත් කිරීමට නිර්දේශ කර තිබුණ භාණ්ඩ සම්බන්ධයෙන් එම නිර්දේශ ක්‍රියාත්මක කර

නොතිබුණද 2019 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ එවැනි නිර්දේශ කිසිවක් දක්වා නොතිබුණි.

(ඌ) 2019 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේදී අබලි භාණ්ඩ වශයෙන් හඳුනාගෙන තිබුණු වානේ ඇදි පුටු 14 ක් හා පාපැදියක් අස්ථානගතවී තිබුණි.

(එ) ප්‍රාදේශීය කාර්යාල වෙත භාණ්ඩ නිකුත් කළ භාණ්ඩ සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ තොග පොතෙහි භාණ්ඩ නිකුත් කළ ප්‍රාදේශීය කාර්යාලය පැහැදිලිව දක්වා නොතිබුණි.

3.3 කළමනාකරණ දුර්වලතා

ප්‍රාදේශීය කාර්යාල 14 ක් විසින් මාසිකව තම කාර්යාලයේ වැඩ සැලසුම් හා එම සැලැස්මට අදාලව ප්‍රගතිය පිළිබඳව වාර්තා ප්‍රධාන කාර්යාලයට ලබා දිය යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුල එම වාර්තා නිසි පරිදි ලබා දී නොතිබුණි. මෙම වැඩ සැලසුම් ඉදිරිපත් නොකිරීම සම්බන්ධව ප්‍රධාන කාර්යාලය විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

4. මානව සම්පත් කළමනාකරණය

(අ) 2018 ජනවාරි 04 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 6.1 ඡේදය ප්‍රකාරව මානව සංවර්ධන සැලැස්මක් සකස් කර නොතිබු අතර උක්ත චක්‍රලේඛයේ 01 ඡේදය ප්‍රකාරව ආයතනයේ සේවයේ නියුතු සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ 11 පරිච්ඡේදයේ 05 ඡේදය ප්‍රකාරව තනතුරක පුරප්පාඩුවක් ඇති වූ විගස එම තනතුරට සුදුසු නිලධාරීන් පත් කළයුතු වුවද 2020 දෙසැම්බර් 31 දිනට තනතුරු 95 ක පුරප්පාඩු පැවතුනි.

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ 11 පරිච්ඡේදයේ 13.3 වගන්තිය අනුව වැඩ බැලීමේ පත් කිරීමක් කළ යුත්තේ නිත්‍ය පත්වීමක් කරන තෙක්

තාවකාලික ප්‍රතිකර්මයක් වශයෙන් පමණි. එහෙත් ආයතනයේ බදවාගැනීමේ පටිපාටි අනුමත වී වසර 02ක් ගතව තිබුණද තවදුරටත් නියෝජ්‍ය අධ්‍යක්ෂ (පරීක්ෂණ හා විමර්ශන) සහ ප්‍රාදේශීය සම්බන්ධීකරණ නිලධාරී තනතුරු 02 සඳහා නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු නොකර වැඩ බැලීම සඳහා නිලධාරීන් පත්කර තිබුණි.

(ඇ) මූලික අයිතිවාසිකම් කඩවීම් පිළිබඳව ඉදිරිපත් වන පැමිණිලි සම්බන්ධව සෘජුව කටයුතු කරන නීති නිලධාරී තනතුරු 22න් 12ක්ද මානව හිමිකම් නිලධාරී තනතුරු 47න් 23ක්ද පුරප්පාඩුව පැවතුනි.

(ඉ) 2017 සැප්තැම්බර් 18 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අධ්‍යක්ෂ පාලන හා තවත් අධ්‍යක්ෂ තනතුරු තනතුරු 04ක් ඇතුළුව තනතුරු 233ක් අනුමත කර තිබුණි. මෙම අධ්‍යක්ෂ තනතුරු සඳහා නිලධාරීන් බඳවා ගැනීමට 2020 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණු අතර වර්ෂ 02 සිට වර්ෂ 05 දක්වා කාලයක් රාජකාරි ඉටු කිරීම සඳහා නිලධාරීන් පත් කර තිබුණි. ඉන් අධ්‍යක්ෂ (පාලන) හා අධ්‍යක්ෂ (පරීක්ෂණ හා විමර්ශන) යන තනතුරු දෙකෙහි රාජකාරි ඉටුකිරීමට අදාල පත්කිරීම් සඳහා විධිමත් අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

(ඊ) කොමිෂන් සභාව විසින් අධ්‍යක්ෂ (පාලන) තනතුර සඳහා 2018 පෙබරවාරි 06 දින සිට පරිපාලන නිලධාරියෙකු රාජකාරී ඉටු කිරීම සඳහා පත්කර තිබුණි. එසේ වුවද මෙම අධ්‍යක්ෂ (පාලන) තනතුර කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 හි උපලේඛන III හි සඳහන් සේවා වර්ගීකරණයට අනුව ජ්‍යෙෂ්ඨ මට්ටමට අයත් තනතුරක් වන අතර පරිපාලන නිලධාරී තනතුර තෘතීය මට්ටමට අයත් තනතුරක් බවත් පුරප්පාඩු වී පවතින ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරෙහි රාජකාරි ඉටු කිරීම සඳහා තෘතීය මට්ටමේ නිලධාරියෙකු පත් කිරීම සම්බන්ධයෙන් එකඟ විය නොහැකි බවත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව දන්වා තිබුණි. කෙසේ වෙතත් කොමිෂන් සභාවේ අනුමත බඳවා ගැනීමේ පරිපාටීන් අනුව නියමිත සුදුසුකම් ලත් නිලධාරීන් නොසිටී නම්ද, පුරප්පාඩු වී ඇති තනතුරු වහාම පිරවිය යුතුව ඇත්නම්ද, එම තනතුරුවල රාජකාරි ඉටු කිරීම සඳහා වඩාත් සුදුසු නිලධාරීන් පත් කිරීමට සහ එම නිලධාරීන් වෙනුවෙන් ආයතන සංග්‍රහයේ විධිවිධාන යටතේ ගෙවීම් කටයුතු සිදු කිරීමට හැකියාව පවතින බව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව 2019 පෙබරවාරි 06 දින දන්වා තිබුණි. නමුත් ඒ පිළිබඳ අවධානය යොමු නොකර, රාජකාරි ඉටු කිරීම සඳහා වඩාත් සුදුසුම නිලධාරියකු නොවන උක්ත නිලධාරියා පත් කර 2018 පෙබරවාරි 06 සිට 2019 පෙබරවාරි 05 දක්වා දීමනා වශයෙන් රු.932,208 ක් ගෙවා තිබුණි.

(ඇ) කොමිෂන් සභාවේ අනුමත බදවා ගැනීමේ පරිපාටීන් අනුව නියමිත සුදුසුකම් ලත් නිලධාරීන් නොසිටී නම්ද, පුරප්පාඩු වී ඇති තනතුරු වහාම පිරවිය යුතුව ඇත්නම්ද, එම තනතුරුවල රාජකාරි ඉටු කිරීම සඳහා වඩාත් සුදුසු නිලධාරීන් පත් කිරීමට සහ එම නිලධාරීන් වෙනුවෙන් ආයතන සංග්‍රහයේ විධිවිධාන යටතේ ගෙවීම් කටයුතු සිදු කිරීමට හැකියාව පවතින බව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව 2019 පෙබරවාරි 06 දින කොමිෂන් සභාව වෙත දන්වා තිබුණි. එසේ වුවද ජ්‍යෙෂ්ඨතා ලේඛනයට අනුව ඉහළින් නිලධාරීන් සිටියදී අධ්‍යක්ෂ (පරීක්ෂණ හා විමර්ශන) තනතුරෙහි රාජකාරි ඉටු කිරීමට ද්විතීය මට්ටමේ තනතුරු ගණයට අයත් විමර්ශන නිලධාරිනියක් පත් කර එම නිලධාරිනියට 2018 ජූනි 04 සිට 2019 පෙබරවාරි 05 දක්වා දීමනා වශයෙන් රු. 684,881ක් ගෙවා තිබුණි.

එම්.ජී.බී.ඒ.පී.ප්‍රනාන්දු
සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ලේඛන/ 2020/ 25

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2021 ජුලි 16 දින.

RECEIVED 30 JUL 2021 H.R.C.S.L.



ලේකම්

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

02 ජාතික විගණන පනතේ 39(1) උප වගන්තියේ සඳහන් විධිවිධාන අනුව කටයුතු කර මෙම වාර්තාවේ දින සිට මාස 03 ක් ඇතුළත යෝජනා කරනු ලබන ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග හෝ සැලකිල්ලට ගත් ක්‍රියාමාර්ග පිළිබඳව මා වෙත දැනුම් දියයුතුය.

03. පනතේ 39(2) උප වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාවේ ඇතුළත් මා විසින් පෙන්වා දී ඇති යම් ක්‍රියාමාර්ගයක් හෝ කරුණක් පිළිබඳව ක්‍රියාත්මක කිරීමේ හෝ නොහැකි වීමේ හේතු තිබේ නම් ඒ බවද මා වෙත දන්වා එවන මෙන් කාරුණිකව දන්වමි.

P. H [signature]

එම්.අයි.පුෂ්පා හේමමාලි

සහකාර විගණකාධිපති

විගණකාධිපති වෙනුවට.

පිටපත : මුදල් අමාත්‍යතුමා , මුදල් අමාත්‍යාංශය

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. ජේපීඒ/ඊ/ එච්ආර්සී/2020/එෆ්ඒ/25

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2021 ජූලි 16දින

ලේකම්,

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (2) වගන්තිය ප්‍රකාරව වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව වූ මෙම වාර්තාව නිකුත් කරනු ලබන අතර ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් ජාතික විගණන පනතේ 39 වන වගන්තියේ සඳහන් විධිවිධාන අනුව කටයුතු කර මෙම වාර්තාවේ දින සිට මාස 03 ක් ඇතුළත යෝජනා කරනු ලබන ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග හෝ සැලකිල්ලට ගත් ක්‍රියාමාර්ග පිළිබඳව මා වෙත වාර්තා කළ යුතුය. මෙම වාර්තාවේ පෙන්වා දී ඇති යම් ක්‍රියාමාර්ගයක් හෝ කරුණක් පිළිබඳව ක්‍රියාත්මක කිරීමේ හෝ නොහැකිවීමේ හේතු තිබේ නම් ඒ බවද මා වෙත දන්වා එවිය යුතුය.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) පුනරාවර්තන වියදම්

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ පුනරාවර්තන වියදම් ගිණුම්ගත කිරීමේදී පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(i)	2020 වර්ෂය සඳහා වැටුප් වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ වැය	වියදම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.	මෙම වෙනසට හේතුව ගමන් වියදම වන අතර

	ලෙජරය අනුව රු.128,852,579 ක් වුවත් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ එය රු.128,184,523 ක් ලෙස දක්වා තිබුණි.	යුතුය.	එය වෙනත් පුනරාවර්ථන වියදම් යටතේ දක්වා ඇත.
(ii)	සමාලෝචිත වර්ෂයේ අනෙකුත් භාණ්ඩ හා සේවා වියදම් වැය ලෙජරය අනුව රු.74,978,326 ක් වුවත් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ එය රු.75,646,381 ක් ලෙස දක්වා තිබුණි.	වියදම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.	නිරීක්ෂණය හා එකඟ වෙමි. ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි.

(ආ) **දේපළ පිරියත හා උපකරණ**

දේපළ පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

	<u>විගණන නිරීක්ෂණය</u>	<u>නිර්දේශය</u>	<u>ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම</u>
(i)	සියළු වත්කම් මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ ඇතුළත් කළ යුතු වුවත් 2004 වර්ෂයට පෙර අත්පත් කර ගත් වත්කම් එහි ඇතුළත් කර නොතිබුණි.	සියළු වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.	නිරීක්ෂණය හා එකඟ වෙමි.ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි.
(ii)	වාහනවල වටිනාකම, මූල්‍ය ප්‍රකාශනවල හා කොමිෂන් සභාවේ වාහන ලේඛනය අතර රු.7,552,881ක වෙනසක් පැවතුණි.	වෙනස්කම් හඳුනාගෙන නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.	වාහනවල වටිනාකම් නිවැරදිව හඳුනා ගැනීමට කටයුතු කරමින් පවතින අතර ඒ අනුව ඉදිරියේදී නිවැරදි කිරීමට එකඟ කටයුතු කරනු ලැබේ.

(iii)	2019 හා 2015 වර්ෂයන්හිදී ජනාධිපති ලේකම් කාර්යාලය වෙත පවරා දී තිබුණු වාහන 02 ක රු.27,697,804 ක්වූ පිරිවැය මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශනයෙන් ඉවත් කර නොතිබුණි.	අපහරණය කරන ලද වාහනයේ පිරිවැය මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශනයෙන් ඉවත් කළ යුතුය.	නිරීක්ෂණය හා එකඟ වෙමි.
(iv)	ඉකුත් වර්ෂයේදී මිලදී ගත් පිරිවැය රු.294,900 ක්වූ යතුරු පැදියක් ප්‍රාග්ධනිත කිරීමට 2021 පෙබරවාරි 28 දින වන විටත් කටයුතු කර නොතිබුණි.	මිලදී ගන්නා ලද යතුරු පැදියේ පිරිවැය ප්‍රාග්ධනිත කළ යුතු වීම	නිරීක්ෂණය හා එකඟ වෙමි. ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කෙරෙනු ඇත.

(ඇ) **ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව රජයේ සෑම ආයතනයක් විසින් ම මුදල් රෙගුලාසි 102 යටතේ වන හානි පිළිබඳ වාර්තා කරනු ලැබුවා වූ හෝ නොකරනු ලැබුවා වූ හෝ අත්තිකාරම් ගිණුම්වල හානි සහ වෙනත් කටයුතුවලදී සිදු වන හානි සටහන් කිරීමට වෙන වෙනම පොත් දෙකක් පවත්වාගෙන යා යුතු වුවත් කොමිෂන් සභාව එපරිදි කටයුතු කර නොතිබුණි.	මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛන පවත්වාගත යුතුය.	නිරීක්ෂණය හා එකඟ වෙමි.

(ඉ) **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

නිරීක්ෂණය --- නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	වටිනාකම රු.	අනුකූල නොවීම	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි • මුදල් රෙගුලාසි 104		සමාලෝචිත වර්ෂයේදී එක් වාහනයකට සිදුවූ අනතුරක් සම්බන්ධයෙන් පරීක්ෂණයක් කර නොතිබුණි.	රජයේ වාහනයකට සිදු වන අනතුරකදී පාඩුවක් හෝ අලාභ හානියක් සිදු වූ වහාම එහි ප්‍රමාණය නිශ්චිත වශයෙන් දැන ගැනීමටත්, එයට වගකිවයුත්තන් නිශ්චය කිරීමටත් පරීක්ෂණයක් ආරම්භ කළ යුතුය.	නිරීක්ෂණය හා එකඟ වෙමි.

• මුදල් රෙගුලාසි 751	ප්‍රාදේශීය කාර්යාල 06 ක බඩු වට්ටෝරු පොත් නිසි පරිදි නඩත්තු කර නොතිබුණි.	රජයේ ආයතන වෙත ලැබෙන සියළු භාණ්ඩ බඩු වට්ටෝරු පොතේ සටහන් කළ යුතුය.	නිරීක්ෂණය හා එකඟ වෙමි.
• මුදල් රෙගුලාසි 770	සමාලෝචිත වර්ෂයේදී වාහන සමීක්ෂණයක් සිදු කර නොතිබුණි.	රජයේ ආයතනවල අබලන් වූ පාවිච්චි කළ නොහැකි වාහන හඳුනා ගැනීම සඳහා මුදල් රෙගුලාසි ප්‍රකාරව වාහන සමීක්ෂණ කළ යුතුය.	නිරීක්ෂණය හා එකඟ වෙමි. ඉදිරියේදී යාවත්කාලීන කිරීමට කටයුතු කරමි.
(ii) 2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12 ඡේදය	අපහරණය කළයුතු වාහන හඳුනාගෙන ඒ පිළිබඳ ඉදිරි කටයුතු කර නොතිබුණි.	රාජ්‍ය මුදල් චක්‍රලේඛය පරිදි කටයුතු කළ යුතුය.	නිරීක්ෂණය හා එකඟ වෙමි.

(iii) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය --- • 3.1 ඡේදය	වාහන සම්බන්ධයෙන් ඉන්ධන පරීක්ෂාවක් සිදු කර නොතිබුණි.	චක්‍රලේඛය ප්‍රකාරව ඉන්ධන පරීක්ෂාවක් කළ යුතුය.	නිරීක්ෂණය හා එකඟ වෙමි.
• 5.1 ඡේදය	වාහනවල ලොග් සටහන් පොත්වල වාහනය පිළිබඳ මූලික තොරතුරු, දැවෙන ඉන්ධන ප්‍රමාණය, වාර්ෂික බලපත්‍ර විස්තර ආදී තොරතුරු ඇතුළත් කර නොතිබුණි.	වාහන ලොග් සටහන් පොත් නිසි පරිදි නඩත්තු කළ යුතුය.	නිරීක්ෂණය හා එකඟ වෙමි.
(iv) 2017 ජුනි මස 28 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය	වාහන පිළිබඳව යාවත්කාලීන කරන ලද තොරතුරු ඇතුළත් කරමින් වාහන	චක්‍රලේඛය ප්‍රකාරව වාහන ලැයිස්තුවක් සකස් කළ යුතුය.	නිරීක්ෂණය හා එකඟ වෙමි.

ලැයිස්තුවක්
සකස් කර
නොතිබුණි.

2. මෙහෙයුම් සමාලෝචනය

2.1 සැලසුම් කිරීම

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව පිළියෙල කළ යුතු වීම	නිරීක්ෂණය හා එකඟ වෙමි.

2.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(i) සමාලෝචිත වර්ෂය ආරම්භයට නොවිසඳුනු පැමිණිලි 4,266 ක් තිබුණු අතර වර්ෂය තුළදී තවත් පැමිණිලි 6,284 ක් ලැබී තිබුණි. පැමිණිලි 3,812 ක් වර්ෂය තුළ විසඳා සමාලෝචිත වර්ෂය අවසානය පැමිණිලි 6,738 ක් විසඳීමට ඉතිරිවී තිබුණි. මින් පැමිණිලි 1,804 ක් වර්ෂ 3 ත් වර්ෂ 10ත් අතර කාලයක්, පැමිණිලි 23 වසර 10 ට වැඩි කාලයක් හා	ලැබෙන පැමිණිලි විසඳීම සඳහා කඩිනම් වැඩපිළිවෙලක් සකස් කර ගත යුතුය.	කාර්ය මණ්ඩල හිඟය හා කොවිඩ් 19 වසංගතය නියා ලැබෙන පැමිණිලි සංඛ්‍යාව අවසන් කිරීමට නොහැකි වී ඇත. සියළුම ඉතිරිවී ඇති පැමිණිලි විසඳීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

පැමිණිලි තුල ලැබුණු පැමිණිලි වූ අතර පැමිණිලි 2,134 ක් වර්ෂ 01ත් වර්ෂ 03ත් අතර කාලය තුල ලැබිණි. එවා විය.

(ii) සමාලෝචිත වර්ෂය තුළ ප්‍රධාන කාර්යාලය හා ප්‍රාදේශීය කාර්යාල විසින් බන්ධනාගාර, පොලීසිය හා අපරාධ පරීක්ෂණ, ළමා නිවාස සහ ත්‍රස්ත විමර්ශන කාර්යාල පරීක්ෂා කිරීම් 1,009 ක් සිදු කර තිබුණු නමුත් වවුනියාව ප්‍රාදේශීය කාර්යාලය විසින් එවැනි කිසිදු පරීක්ෂාවක් සිදු කර නොතිබුණි.	සෑම දිස්ත්‍රික්කයක්ම ආවරණය වන පරිදි පරීක්ෂා කිරීම් කළ යුතුය.	නිරීක්ෂණය හා එකඟ වෙමි.

2.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
2020 අගෝස්තු 28 දිනැති 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16.2 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු 2020 වර්ෂය සඳහා වූ කාර්යසාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමඟ විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතුය.	පිළිගනිමි. නිවැරදි කිරීමට අවශ්‍ය පියවර ගනිමි.

2.4 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය		නිර්දේශය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(i)	රාජ්‍ය නොවන සංවිධාන විසින් ලබාදුන් වාහන 03 ක පිරිවැය ප්‍රාග්ධනිත කර නොතිබුණු අතර භෞතිකව නොමැති එක් වාහනයක පිරිවැය ඉවත් කර නොතිබුණි.	වත්කම්වල භෞතික පැවැත්ම හා අයිතිය පරීක්ෂා කර වත්කම් ගිණුම්ගත කළ යුතුයි.	පිළිගනිමි. තක්සේරු වාර්තාව ලබා ගත් පසු ප්‍රාග්ධනිත කිරීමටත් කොමිෂන් සභාවේ නොමැති වාහනවල පිරිවැය පොත්වලින් ඉවත් කිරීමටත් කටයුතු කරමි.
(ii)	දිගු කාලයක සිට යතුරු පැදි 04 ක් ප්‍රධාන කාර්යාල පරිශ්‍රය තුල ධාවනයෙන් තොරව ගාල් කර පැවතුනි.	ධාවනය නොකරන වාහන සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.	පිළිගනිමි. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනතුරුව යාවත්කාලීන කිරීමට සටහන් කරගෙන ඇත.
(iii)	දිගු කාලයක සිට ඡායාපිටපත් යන්ත්‍ර 02 ක් භාවිතයකින් තොරව නිශ්ක්‍රීයව පැවතුනි.	භාවිතා නොකරන වත්කම් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.	පිළිගනිමි. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනතුරුව අපහරණය කිරීමට සටහන් කරගෙන ඇත.
(iv)	2014 කල්බදු පදනම යටතේ ලබාගත් මෝටර් රථ 03 හි බදු කාලය අවසන්වී පැවතියද 2021 මාර්තු 23 දින වන විටත් එම වාහන 03 හි අයිතිය පවරා ගැනීමට අපොහොසත් වී තිබුණි.	එම වාහන 03 හි අයිතිය පවරා ගැනීමට ක්‍රියා කළ යුතුය.	පිළිගනිමි. වහාම පවරා ගැනීමට කටයුතු කර පොත් යාවත්කාලීන කිරීමට උපදෙස් දී ඇත.

(v)	කොමිෂන් සභාව නමින් ලියාපදිංචි වූ වාහන 19 ක පිරිවැය තහවුරු කර ගැනීමට නොහැකි වූ අතර වාහන 20 ක පිරිවැය සිගාස් වැඩසටහන යටතේ ගිණුම්ගත කර නොතිබුණි.	ආයතනය සතු සියළු වාහනවල පිරිවැය තහවුරු කරගෙන ගිණුම්ගත කළ යුතුය.	පිළිගනිමි. නත්තේරු කර අවසන් වූ වහාම පොත්වලට ගෙන යාවත්කාලීන කිරීමට උපදෙස් දී ඇත.
(vi)	ඉකුත් වර්ෂයේ ප්‍රධාන කාර්යාලයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවල අදාල භාණ්ඩ පවත්නා අංශය සඳහන් කර නොතිබුණු බැවින් එම භාණ්ඩ හෙංචිකව පවතින අංශය තහවුරු කර ගැනීමට නොහැකි විය.	ප්‍රධාන කාර්යාලයේ සමීක්ෂණ වාර්තාවල ද අදාල භාණ්ඩ පවත්නා අංශය සඳහන් කළ යුතුය.	2020 භාණ්ඩ සමීක්ෂණය අවසන් වූ වහාම නිවැරදි කිරීමට උපදෙස් දී ඇත.
(vii)	2018 හා 2019 වර්ෂවල භාණ්ඩ සමීක්ෂණ අනුව නිර්දේශ භාණ්ඩ අපහරණය කර එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. එසේම 2018 වර්ෂයේ ප්‍රධාන කාර්යාලයේ භාණ්ඩ සමීක්ෂණ නිර්දේශ අනුව භාණ්ඩ අයිතම් 16 ක් හාවිතයෙන් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණු අතර 2019 භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ එවැනි නිර්දේශයක් හෝ කර නොතිබුණි.	එක්‌ලේඛ ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණ සිදු කර ඒවායේ නිර්දේශ ක්‍රියාත්මක කළ යුතුය.	භාණ්ඩ සමීක්ෂණය සිදු කර තිබුණද අවසන් කර නොමැති බව පිළිගනිමි. 2020 භාණ්ඩ සමීක්ෂණය දැනට ආරම්භ කර ඇති බැවින් එම අඩුපාඩුද සකස් කර වාර්තාව ඉදිරිපත් කරමි.
(viii)	2019 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේදී අබලි භාණ්ඩ වශයෙන් හඳුනාගෙන තිබුණු වානේ ඇදි පුටු 14 ක හා පා පැදියක ඌණතාවයක් පැවතුනි.	ඌණතාවයන් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වීම.	මෙම භාණ්ඩ අස්ථානගතවී ඇත්ද යන්න නිවැරදිව හඳුනා ගැනීමට නොහැකි අතර 2020 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයෙන්

අනතුරුව මේ පිළිබඳව කටයුතු කරමි.

(ix)	ප්‍රාදේශීය කාර්යාල වෙත භාණ්ඩ නිකුත් කිරීමේදී කොමිෂන් සභාවේ තොග පොතෙහි භාණ්ඩ නිකුත් කළ ප්‍රාදේශීය කාර්යාලය පැහැදිලිව දක්වා නොතිබුණි.	තොග පොතෙහි භාණ්ඩ නිකුත් කළ ප්‍රාදේශීය කාර්යාලය පැහැදිලිව දැක්විය යුතුය.	2020 භාණ්ඩ සමීක්ෂණයෙන් පසුව නිවැරදි කිරීම සඳහා උපදෙස් දී ඇත.

2.5 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(i)	ප්‍රාදේශීය කාර්යාල විසින් මාසිකව තම කාර්යාලයේ වැඩ සැලසුම් හා එම සැලැස්මට අදාලව ප්‍රගතිය ප්‍රධාන කාර්යාලයට ලබා දිය යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුල එම ප්‍රාදේශීය කාර්යාල 14 ක් විසින් මාසිකව වැඩ සැලසුම් හා ප්‍රගතිය ලබා දී නොතිබුණි. මෙම වැඩ සැලසුම් ඉදිරිපත් නොකිරීම සම්බන්ධව ප්‍රධාන කාර්යාලය විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.	ප්‍රාදේශීය කාර්යාල විසින් නිසි පරිදි මාසිකව වැඩ සැලසුම් හා ප්‍රගතිය පිළිබඳ වාර්තා ලබා දිය යුතුය.	කොවිඩ් වසංගතය හේතුවෙන් වැඩ සැලැසුම් ඉදිරිපත් කිරීමට නොහැකි වූ අතර ඉදිරියේ දී මෙය නිවැරදි කිරීමට කටයුතු කරමි.
(ii)	කොමිෂන් සභාවේ වාහන ලිපිගොනු නිසි පරිදි නඩත්තු කර නොතිබුණි.	වාහන ලිපිගොනු නිසි පරිදි නඩත්තු කළ යුතු වීම.	පරිපාලන නිලධාරියාගේ අධීක්ෂණය යටතේ මෙම කටයුතු සිදු කරන ලෙසට උපදෙස් දී ඇත.

3. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(i)	2018 ජනවාරි 04 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 6.1 ඡේදය ප්‍රකාරව මානව සංවර්ධන සැලැස්ම සකස් කර නොතිබූ අතර උක්ත චක්‍රලේඛයේ 01 ඡේදය ප්‍රකාරව ආයතනයේ සේවයේ නියුතු සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර නොතිබුණි.	චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය.	2021 වර්ෂයේ සිට මෙම අඩුපාඩු සකස් කිරීමට සියළුම නිලධාරීන් දැනුවත් කර ඇත.
(ii)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ 11 පරිච්ඡේදයේ 05 ඡේදය ප්‍රකාරව තනතුරක පුරප්පාඩුවක් ඇති වූ වහාම එම තනතුරට සුදුසු නිලධාරීන් පත් කළ යුතු වුවද 2020 දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාවේ තනතුරු 95 ක් පුරප්පාඩුව පැවතුණි.	පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුය.	බඳවා ගැනීමේ පරිපාටි අනුමත වී නිබුණද කාර්ය මණ්ඩලය අන්තර්ග්‍රහණය කිරීමට අවශ්‍ය අවසන් උපදෙස් නොලැබීම හේතුවෙන් අන්තර්ග්‍රහණ කටයුතු ප්‍රමාද වී ඇත. නව කාර්ය මණ්ඩලය බඳවා ගැනීමෙන් සිටින සේවකයින් හට අසාධාරණයක් වන බැවින් අන්තර්ග්‍රහණ කටයුතු නිම වන තෙක් නව බඳවා ගැනීම් කටයුතු සිදු කර නැත.

(iii)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ 11 පරිච්ඡේදයේ 13.3 වගන්තිය අනුව වැඩ බැලීමේ පත් කිරීමක් කළ යුත්තේ නිත්‍ය පත්වීමක් කරන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් වශයෙන් පමණි. එහෙත් ආයතනයේ බඳවාගැනීමේ පටිපාටි අනුමත වී වසර 02ක් ගතව තිබුණද නියෝජ්‍ය අධ්‍යක්ෂ (පරීක්ෂණ හා විමර්ශන) සහ ප්‍රාදේශීය සම්බන්ධීකරණ නිලධාරී තනතුරු 02 සඳහා නිලධාරීන් බඳවා නොගෙන වැඩ බැලීම පදනම මත නිලධාරීන් බඳවාගෙන තිබුණි.	ආයතන සංග්‍රහයේ උපදෙස් පරිදි කටයුතු කළ යුතුය.	බඳවා ගැනීමේ පරිපාටි අනුමත වී තිබුණද කාර්ය මණ්ඩලය අන්තර්ග්‍රහණය කිරීමට අවශ්‍ය අවසන් උපදෙස් නොලැබීම හේතුවෙන් අන්තර්ග්‍රහණ කටයුතු ප්‍රමාද වී ඇත. නව කාර්ය මණ්ඩලය බඳවා ගැනීමෙන් සිටින සේවකයින් හට අසාධාරණයක් වන බැවින් අන්තර්ග්‍රහණ කටයුතු නිම වන තෙක් නව බඳවා ගැනීම් කටයුතු සිදු කර නැත.
(iv)	මූලික අයිතිවාසිකම් කඩවීම් පිළිබඳව ඉදිරිපත් වන පැමිණිලි සම්බන්ධව ඍජුව කටයුතු කරන නීති නිලධාරී තනතුරු 22 න් 12 ක්ද මානව හිමිකම් නිලධාරී තනතුරු 47 න් 23 ක්ද පුරප්පාඩුව පැවතුනි.	පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වීම.	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් නීති නිලධාරී තනතුරු 10 ක් සඳහා පමණක් බඳවා ගැනීමට අවසර ලබාදී ඇත. මේ වන විට මානව හිමිකම් නිලධාරී තනතුරේ පුරප්පාඩු 23 කි.
(v)	2017 සැප්තැම්බර් 18 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අධ්‍යක්ෂ පාලන හා තවත් අධ්‍යක්ෂ තනතුරු 04 ක් ඇතුළුව තනතුරු 233 ක්	අදාල පත්කිරීම් සඳහා නිසි අනුමැතිය ලබා ගත යුතු වීම.	2017, 2018 හා 2020 වර්ෂවලදී බඳවා ගැනීම් සිදු කිරීමට පුවත්පත් දැන්වීම් පළ කළද වසර 15 ක පලපුරුද්දක් සහිත අයදුම්කරුවන් ඉල්ලුම්

අනුමත කර තිබුණි. මෙම අධ්‍යක්ෂ තනතුරු සඳහා නිලධාරීන් බඳවාගෙන නොතිබුණු අතර වර්ෂ 02 ත් වර්ෂ 05 ත් අතර කාලයක් රාජකාරි ඉටු කිරීම සඳහා නිලධාරීන් පත් කර තිබුණද අධ්‍යක්ෂ (පාලන) හා අධ්‍යක්ෂ (පරීක්ෂණ හා විමර්ශන) යන තනතුරු සඳහා අදාල පත් කිරීම්වලට විධිමත් අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

නොකිරීම හේතුවෙන් පුරප්පාඩු පිරවීමට නොහැකිවී ඇත. එබැවින් කොමිසමේ රාජකාරී බාධාවකින් තොරව පවත්වාගෙන යාම සඳහා නිලධාරීන් පත් කිරීමට සිදුවී ඇත.

(vi) කොමිෂන් සභාවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරක් වන අධ්‍යක්ෂ (පාලන) තනතුර සඳහා 2018 වර්ෂයේදී තෘතීය මට්ටමේ නිලධාරියකු රාජකාරි ඉටු කිරීම සඳහා පත් කර 2019 පෙබරවාරි 05 දක්වා කාලයට රු.932,208 ක් ගෙවා තිබුණි. මෙම පත් කිරීම සම්බන්ධයෙන් එකඟ විය නොහැකි බව DMS/1020/Vol iv හා 2018 ජූනි 25, 2018 ඔක්තෝබර් 10 දිනැති ලිපි වලින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව දන්වා තිබුණි.

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ දැනුම්දීමට අනුගත විය යුතු වීම.

කොමිෂන් සභා පනත ප්‍රකාරව කොමිෂන් සභාවේ කාර්යයන් සඳහා අවශ්‍ය නිලධාරීන් පත් කිරීමේ බලය කොමිෂන් සභාව සතුවේ. ඒ අනුව අදාල තනතුර සඳහා වඩාත්ම සුදුසු බවට හඳුනාගත් නිලධාරියා ඒ සඳහා පත් කර ඇත. එම නිලධාරියා පත් කිරීම සම්බන්ධයෙන් එකඟ විය නොහැකි බව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් එවන ලද ලිපි සම්බන්ධව කොමිෂන් සභාව විසින් ගන්නා ලද මාණ්ඩලික තීරණයන් හා රාජ්‍ය සේවා කොමිෂන් සභාව හා වැටුප් කොමිෂන් සභාව

විසින් එවන ලද ලිපි ඉදිරිපත් කරමි.

(vii)	කොමිෂන් සභාවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරක් වන අධ්‍යක්ෂ (පරීක්ෂණ හා විමර්ශන) තනතුර සඳහා 2018 වර්ෂයේදී ද්විතීය මට්ටමේ නිලධාරිනියක රාජකාරී ඉටු කිරීම සඳහා පත් කර 2019 පෙබරවාරි 05 දක්වා කාලයට රු.684,881 ක් ගෙවා තිබුණි. මෙම පත් කිරීම් සම්බන්ධයෙන් එකඟ විය නොහැකි බව DMS/1020/Vol iv හා 2018 ඔක්තෝබර් 18 දිනැති ලිපියෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව දන්වා තිබුණි.	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ දැනුම්දීමට අනුගත විය යුතු වීම.	කොමිෂන් සභා පනත ප්‍රකාරව කොමිෂන් සභාවේ කාර්යයන් සඳහා අවශ්‍ය නිලධාරීන් පත් කිරීමේ බලය කොමිෂන් සභාව සතුවේ. ඒ අනුව පත්වීම් බලධාරියා වශයෙන් කොමිෂන් සභාව මෙම පත්කිරීම කර ඇත.

P. H. Hemamali

එම්.අයි.පුෂ්පා හේමමාලි

සහකාර විගණකාධිපති

විගණකාධිපති වෙනුවට.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2021.11.03

සහකාර විගණකාධිපති,
ජාතික විගණන කාර්යාලය,
අංක 306/72,
පොල්දුව පාර,
බත්තරමුල්ල.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ 2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව 2021.07.16 දිනැති වාර්ෂික විස්තරාත්මක කලමනාකරන විගණන වාර්තාව

02 ජාතික විගණන පනතේ 39(1) වගන්තිය සඳහන් විධිවිධාන අනුව යෝජනා කරනු ලබන ප්‍රතිකර්ම,ක්‍රියාමාර්ග හෝ සැලකිල්ලට ගත් ක්‍රියා මාර්ග ක්‍රියාත්මක කිරීම.

03. ජාතික විගණන පනතේ 39(2) වගන්තිය සඳහන් විධි විධාන අනුව යෝජනා කරනු ලබන ප්‍රතිකර්ම,ක්‍රියාමාර්ග හෝ සැලකිල්ලට ගත් ක්‍රියා මාර්ග ක්‍රියාත්ම ක නොකිරීමට හේතු වූ කරුනු පහත සඳහන් කරමි.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

1.2.1 ගිණුම් කරණ අඩුපාඩු

(අ) පුනරාවර්තන වියදම්

(i) 2020 වර්ෂය සඳහා වැටුප් හා වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ වැය ලෙජරය අනුව රු.128,852,579/ ක් වුවත් එය මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ රු 128,184,523/- ලෙස දක්වා තිබීම.
වෙනස - රු. 668,056/ (128,852,579/ - 128,184,523/)
ගමන් වියදම් වැය ශීර්ෂය යටතේ රු 668,056/ වෙනත් පුනරාවර්තන වියදම් යටතේ පෙන්වා තිබීම.

ක්‍රියාත්මක කිරීමට නොහැකිවීමට හේතු -

2020 වර්ෂයේ විසර්ජන ගිණුම් අවසන් කර ඇති බැවින් 2020 වර්ෂයේ නිවැරදි කිරීමට නොහැකි විම.

ක්‍රියාත්මක කිරීම -

2021 වර්ෂයේ සිට එවැනි අඩුපාඩු මහ හරවා ගිනුම් ඉදිරිපත් කිරීම සඳහා අදාල නිලධාරීන් දැනුවත් කර ඇත.

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர். ஏ. த மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11- 2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

(ආ) <u>දේපල පිරියත හා උපකරණ</u>

(i) සියළුම වත්කම් මුල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ ඇතුළත් කළ යුතු වුවද 2004 වර්ෂයට පෙර අත්පත් කර ගත් වත්කම් වලින් ව්‍යාපෘති යටතේ ලබාදී ඇති වත්කම් ඇතුලත් වී නොමැත. 2021 වර්ෂයේ සියලුම වත්කම් ප්‍රත්‍යාගනනය කරන බැවින් 2021 වර්ෂයට කොමිෂන් සභාවේ සියලුම වත්කම් ඇතුලක් කිරීමට අදාල නිලධාරීන් දැනුවත් කර ඇත.

(ii) වාහන වල වටිනාකම මුල්‍ය ප්‍රකාශවල හා කොමිෂන් සභාවේ වාහන ලේඛනය අතර රු 7,552,881/ ක වෙනසක් පවතින්නේ වාහන වටිනාකම රක්ෂණ කිරීමේ වටිනාකම වාහන ලේඛනයේ සඳහන් වීම මතය.
දැනට වාහන මිල කිරීමේ කමිටුවක් පත් කර සමීක්ෂණයන් සමග මිල කිරීම සිදුවන බැවින් වාහන ලේඛනය නිවැරදි කිරීමටත් යාවත් කාලීනව පවත්වාගෙන යාමට අවශ්‍ය පියවර ගෙන ඇති අතර අදාල නිලධාරීන් දැනුවත් කර ඇත.

(iii) 2019 හා 2015 වර්ෂයන්හි ජනාධිපති ලේකම් කාර්යාලය වෙත පවරා තිබූ රු 27,697,804/ -වූ වාහන 2 ක පිරිවැය මුල්‍ය නොවන වත්කම් ප්‍රකාශයෙන් ඉවත් කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

(iv) මිලදී ගත් රු 294,900/ක් වූ යතුරු පැදිය ප්‍රාග්ධනිත කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

(ඇ) <u>ලේඛන හා පොත් පත් පවත්වා නොතිබීම</u>

මු.රෙ 110 ප්‍රකාරව රජයේ සැම ආයතනයන් මුදල් රෙගුලාසි 102 යටතේ පැවැත්විය යුතු භාණ්ඩ ලේඛනය පවත්වා ඇති නමුත් මුදල් රෙගුලාසි අනුව අත්තිකාරම් ගිණුම්වල භාණ්ඩ හා වෙනත් කටයුතු වලදි සිදුවන භාණ්ඩ සටහන් කිරීම සඳහා භාණ්ඩ ලේඛන 2ක් වෙනම පවත්වා නොමැත..

2021 වර්ෂයේ සිට නියමිත ආකාරයෙන් ලේඛන 2ක් සකස් කර යාවත් කාලීන කිරීමට පියවර ගෙන ඇත.

(ඉ) <u>නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම</u>

(i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි

- 104 - වාහන අනතුරු සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියා මාර්ග පිළිබඳ අදාල නිලධාරීන් දැනුවත් කර ඇත.

- 751 - ප්‍රාදේශීය කාර්යාලවල වට්ටෝරු භාණ්ඩ පොත් නිසි පරිදි නඩත්තු කිරීමට අවශ්‍ය උපදෙස් ලබාදී 2021 වර්ෂයේ නිවැරදි කිරීමට පියවර ගෙන ඇත.

- 770 - වාහන සමීක්ෂණය හා මිල කිරීම දැනට ආරම්භ කර ඇති අතර 2021 වර්ෂයේ සිට යාවත්කාලීන කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

(ii) 2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍ර ලේඛණ 12 ඡේදය ප්‍රකාරව 2021 වර්ෂයේ දී කටයුතු කිරීමට අදාල නිලධාරීන් දැනුවත් කර ඇත.

(iii) 2016.12.29 දිනැති 30/2016 රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ

- 3.1 ඡේදය - 2020.09.15 දින ප්‍රධාන කාර්යාලයේ සංචිත වාහන 05 ක ඉන්ධන දහනය පරීක්ෂා කර ඇත. 2021 වර්ෂයේ සිට යාවත්කාලීනව සිදු කිරීමට අදාල නිලධාරීන් දැනුවත් කර ඇත.

- 5.1 ඡේදය - වාහන ලොග් සටහන් පොත් යාවත්කාලීනව පවත්වාගෙන යාම සඳහා අදාල නිලධාරීන් දැනුවත් කර ලොග් සටහන් පොත් නිවැරදි කර ඇත.

(iv) 2017 ජුනි මස 28 දිනැති අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍ර ලේඛනයට අනුගත වෙමින් වාහන ලැයිස්තුව දැනට සකස් කරමින් පවතී.

2. මෙහෙයුම් සමාලෝචනය

2.1 සැලසුම් කිරීම

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරණ රාජ්‍ය මුදල් චක්‍ර ලේඛය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම සකස් කර නොතිබුන අතර 2021 වර්ෂය සඳහා සකස් කර ඇත. 2022 වර්ෂයට අදාල ක්‍රියාකාරී සැලසුම අදාල චක්‍ර ලේඛ ප්‍රකාරව සකස් කිරීම සියලු ප්‍රාදේශීය කාර්යාල දැනුවත් කරමින් පවතී.

2.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

(i) 2020.12.31 දිනට නොවිසඳී ඇති පැමිණිලි සංඛ්‍යාව 6738 ක් පැවතුන අතර මේ සඳහා විසඳීමේ ක්‍රියා මාර්ග ගෙන යාවත්කාලීන කිරීමට අදාල නිලධාරීන් දැනුවත් කිරීමටද විකල්ප ක්‍රම භාවිතා කිරීමද සිදුකරමින් පවතී. කාර්ය මණ්ඩල පුරප්පාඩු පැවැතීම ද මෙයට හේතු වී ඇත.

(ii) 2020 වර්ෂය තුල බන්ධනාගාර ,පොලීසි, අපරාධ පරීක්ෂණ, ළමා නිවාස, ත්‍රස්ත විමර්ශන කාර්යාල පරීක්ෂා කිරීම පිළිබඳ ප්‍රධාන කාර්යාල හා ප්‍රාදේශීය කාර්යාල වල වාර්තාවේ වවුනියාව ප්‍රාදේශීය කාර්යාලය කිසිදු පරීක්ෂාවන් සිදුකර නොමැති බව දී තිබූ පිළිතුරු නැවත සංශෝධනය කර විගණකාධිපති වෙත දැනුම් දී ඇත.
(2021.05.11 දින නිවැරදි කර ඇත)

2.3 වාර්ෂික කාර්ය සාධන වාර්තාව

2020 අගෝස්තු 28 දිනැති 02/2020 දරණ රාජ්‍ය මූල්‍ය මුදල් චක්‍ර ලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16.2 වගන්තිය ප්‍රකාරව කාර්ය සාධන වාර්තාව 2021 වර්ෂය සඳහා සකස් කිරීමට අදාල නිලධාරීන් දැනුවත් කරමින් පවතින අතර ඉතා ඉක්මනින් යාවත් කාලීන කිරීමට සටහන් කර ගෙන අදාල නිලධාරීන් දැනුවත් කර ඇත.

2.4 වත්කම් කළමනාකරණය

(I) රාජ්‍ය නොවන සංවිධනයක් විසින් ලබා දුන් වාහන 3ක පිරිවැය ප්‍රාග්ධනිත කිරීමට අවශ්‍ය පියවර ගෙන අදාල නිලධාරීන් දැනුවත් කර ඇත.

(II) දිගු කාලයක සිට ප්‍රධාන කාර්යාලයේ ධාවනයෙන් තොරව ගාල්කර ඇති යතුරු පැදි 04 2021 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂනයෙන් පසු සුදුසු ක්‍රියා මාර්ග ගැනීමට අවශ්‍ය උපදෙස් ලබාදී අදාල නිලධාරීන් දැනුවත් කර ඇත.

(III) භාවිතයෙන් තොරව නිශ්ක්‍රීයව ඇති ජායා පිටපත් යන්ත්‍ර දෙක 2020 භාණ්ඩ සමීක්ෂනයෙන් පසු ඉවත් කිරීම සදහා පියවර ගැනීමට අවශ්‍ය උපදෙස් ලබා දී ඇත.

(IV) 2014 කල් බදු පදනම යටතේ ලබාගත් මෝටර් රථ 03 හි බදු කාලය අවසන් වී ඇති බැවින් අයිතිය පවරා ගැනීමට කටයුතු ආරම්භ කර ඇත.

(V) කොමිෂන් සභාව සතු වාහන සියල්ල ලේඛන ගත කරන බැවින්ද මිල තීරණය කරමින් පවතින බැවින්ද අවසන් වූ වහාම සිගාස් වැඩ සටහන නිවැරදි කිරීමට අදාල නිලධාරීන්ට උපදෙස් දී ඇත.

(VI) භාණ්ඩ භෞතිකව පවත්නා අංශය තහවුරු කර ගැනීමට හැකිවන පරිදි 2020 භාණ්ඩ සමීක්ෂනය අවසන් කිරීමට උපදෙස් ලබා දී ඇති අතර අදාල නිලධාරීන් දැනුවත් කර ඇත.

(VII) 2018 සහ 2019 වාර්තාවල භාණ්ඩ සමීක්ෂනයේ පසු වට්ටෝරු භාණ්ඩ ලේඛන යාවත් කාලීන නොවීමෙන් 2020 වර්ෂයට ගෙන ඒමේ ක්‍රියාවලිය නිසා 2020 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂන අවසන්වූ වහාම ඊලඟ පියවර අවසන් කර පොත් පත් යාවත් කාලීන කිරීමට අදාල නිලධාරීන් දැනුවත් කර ඇත.

(VIII) අබලි භාණ්ඩ වෙන්දේසි කිරීම හෝ විනාශ කිරීම ආදී පියවර ගෙන නොමැතිව ගොඩ ගසා තිබීම නිසා 2020 වර්ෂයේ සමීක්ෂණයෙන් පසු සුදුසු පියවර ගැනීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

(IX) 2020 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂනයෙන් පසු 2021 වර්ෂයේ පොත් පත් නිවැරදි කිරීමට අවශ්‍ය උපදෙස් ලබාදී යාවත්කාලීන කිරීමට අදාල නිලධාරීන් දැනුවත් කර ඇත.

2.5 <u>කළමනාකරන දුර්වලතා</u>

(i) ප්‍රාදේශීය කාර්යාලය විසින් මාසිකව වැඩ සැලසුම් හා ප්‍රගතිය ලබා ගැනීමට ඉදිරි වැඩ පිලිවෙලක් සකස් කිරීමටද යාවත් කාලීනව පවත්වාගෙන යාමටද අදාල අංශ හා නිලධාරීන් දැනුවත් කර ඇත.

(ii) වාහන ලිපිගොනු සියල්ල නැවත සකස් කර යාවත් කාලීනව පවත්වාගෙන යාමට පියවර ගෙන අදාල නිලධාරීන් දැනුවත් කර ඇත.

(3) <u>මානව සම්පත් කළමනාකරණය</u>

(i) 2018 ජනවාරි 04 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛනයේ 6.1 ඡේදය ප්‍රකාරව 2020 වර්ෂය සදහා මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කර ඇත.

(ii) 2020.12.31 දිනට කොමිෂන් සභාවේ පුරප්පාඩු ගණන 95කි .

(iii) සහකාර අධ්‍යක්ෂ (පරීක්ෂන හා විමර්ශන) තනතුරු ඇතුළුව සහකාර අධ්‍යක්ෂ තනතුරු 3ක් සඳහා බඳවා ගැනීමට 2021.06.04 දින අයදුම් පත් කැඳවා ඇත. සම්මුඛ පරීක්ෂන පැවැත්වීම සඳහා ලේඛන සකසා ඇත. එහෙත් නව බඳවා ගැනීම් සිදු කිරීම තාවකාලිකව අත්හිටුවීමට රජය ගෙන ඇති තීරණය මත ඉදිරි කටයුතු කරගෙන යාමට නොහැකි වී ඇත.

ප්‍රාදේශීය සම්බන්ධීකරණ නිලධාරි තනතුරු 02ක් සඳහා වැඩ බැලීමේ තනතුරුවල සිටි නිලධාරීන්ගෙන් සුදුසුකම් පරීක්ෂා කර ස්ථිර පත්වීම් ලබාදී ඇත.

1. ඩබ්ලිව්.කේ.එස්.ප්‍රියංගා මිය - අනුරාධපුර 2021.04.21
2. ඒ.එල්.ඉසදීන් මයා - මඩකලපුව 2021.04.21

(iv) මූලික අයිතිවාසිකම් කඩවීම පිළිබඳව ඉදිරිපත් කරන පැමිණිලි සම්බන්ධව සෘජුවම කටයුතු කරන නීති නිලධාරීන් 12ක් බඳවා ගැනීමට බාහිර හා අභ්‍යන්තර අයදුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණ පවත්වා බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු අවසන් කලද, නව බඳවා ගැනීම් සිදුකිරීම තාවකාලිකව අත්හිටුවීමට 21/1596/304/134 දරණ 2021.08.28 මුදල් අමාත්‍යාංශ රාජ්‍ය වියදම් සමාලෝචනය පිළිබඳ අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුව සේවක බඳවා ගැනීම් සඳහා මූලික කටයුතු සිදුකර තිබුනද මෙතෙක් පත්වීම් කර නොමැති තනතුරු සඳහා බඳවා ගැනීම් කල් තැබීම සඳහා රජය ගෙන ඇති තීරණ හේතුවෙන් අයවැය අධ්‍යක්ෂ ජනරාල් වෙත අවශ්‍යතාවය පැහැදිලි කරමින් ප්‍රතිපාදන ලබාදීමේ හැකියාව පිළිබඳ විමසන ලදී.

ඊට පිළිතුරු ලෙස අමාත්‍ය මණ්ඩල තීරණ අංක 21/1596/304/134 දරන 2021.08.30 දිනැති තීරණයට අනුව මූල්‍ය සීමාවන් සලකා නව බඳවා ගැනීම් වෙනුවට උපාධිධාරී අභ්‍යාස ලාභීන් අතරින් සුදුසුකම් සහිත වුවන් මෙම තනතුර සඳහා බඳවා ගැනීමට හැකියාව අයවැය දෙපාර්තමේන්තුවෙන් විමසන ලෙස දන්වා ඇත.සේවා අවශ්‍යතාවය මත මෙම තනතුරු මෙම වසරේ ප්‍රතිපාදන කලමනාකරණය කර ගැනීම තුලින් හෝ ඉටුකර ගැනීමේ හැකියාව නැවත විමසා ඇත.

මානව හිමිකම් නිලධාරි පුරප්පාඩු තනතුරු සඳහාද අයදුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂන දිනයන් හා උපලේඛන සකස්කර අවසන් කර ඇති අතර ඒ සඳහාද අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය හා අමාත්‍ය මණ්ඩල තීරණ අනුව රාජ්‍ය සේවයට බඳවා ගැනීමේ පරිපාටිය ප්‍රකාරව සුදුසුකම් සපුරා ඇති උපාධිධාරීන් සිටී නම් ඔවුන් මානව හිමිකම් කොමිෂන් සභාවට අනුයුක්ත කරන ලෙස රාජ්‍ය සේවා පලාත් පාලන අමාත්‍යාංශය වෙත දැනුම් දී ඇත.

(v) 2017 සැප්තැම්බර් 18 දින කළමනාකරන සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත තනතුරු වලින් අධ්‍යක්ෂ පාලන තනතුර සඳහා සුදුසුකම් සහිත ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරියකු ද්විතියික පදනමින් මේ වන විට බඳවා ගෙන රාජකාරී පවරා ඇත. අධ්‍යක්ෂ (පරීක්ෂන හා විමර්ශන)ඇතුළු අධ්‍යක්ෂ තනතුරු තුනක් සඳහා අයදුම් පත් අවස්ථා තුනකදී කැඳවූ අතර බඳවා ගැනීමේ පරිපාටිය අනුව සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් ඉදිරිපත් වී නොමැත. මේ සම්බන්ධව උපදෙස් ලබාගැනීම සඳහා කළමනාකාර සේවා දෙපාර්තමේන්තුවට හා ජාතික වැටුප් කොමිෂමට ලිපි යොමු කර ඇති අතර ඒ පිළිබඳ සාකච්ඡා කර තීරණ ගැනීමට නියමිතය.

(vi) ගෙවීම් කිරීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු DMS/1020 Volume iv හා 2019.02.06 දරණ ලිපිය අනුමැතිය අනුව ගෙවීම් කර ඇත.

(vii) ගෙවීම් කිරීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු DMS/1020 Volume iv හා 2019.02.06 දරණ ලිපිය අනුමැතිය අනුව ගෙවීම් කර ඇත.

ලේකම්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

o/c